# බුදුසරණ


ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නිකිණි පුර අටවක පෝ ද රාජ්‍ය වර්ෂ 2020 ජූලි 27 සඳුද BUDUSARANA, MONDAY JULY 27, 2020

55 වැනි කාණ්ඩය, 07 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13, ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 24 මිල රු. 40.00




යස කුල පුත්‍රයා බුදු රජාණන් වහන්සේ හමු වීම

සිතුවම - හර්ෂ ගුණවර්ධන

# ධර්මය දැකීම හා බුදු හිමි දැකීම

## ආර්ය ශ්‍රාවක ප්‍රතිපදා 06



බලපිටිය, ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ මහෝපාධ්‍යායරාජකීය පණ්ඩිත, දර්ශනපති
**බලපිටියේ සිරිසීවලි හිමි**

මෙහි මුල් කොටස ජූලි 12 පත්‍රයේ පළ විය.

### ආගම හා අධිගම සද්ධා

**බුදු පසේ බුදු මහ රහත් යන ත්‍රිවිධ බෝධියපතා පෙරුම් පුරන බෝධිසත්වයන් වහන්සේලා තුළ ඇති වන ශ්‍රද්ධාව ආගම ශ්‍රද්ධාවයි.**

බුද්ධ කාරක ධර්මයන් භවයෙන් භවයට සසර පුරා පුරුද්දක් ලෙස බෝධි සත්වයන් වහන්සේලා තුළ ඇති වෙන්නේ ආගම ශ්‍රද්ධාව නිසයි.

රහතන් වහන්සේ තුළ ඇති ශ්‍රද්ධාව අධිගම ශ්‍රද්ධාවයි. ඒ බව අටුවාව "අරිය සාවකානං පටිවෙධෙන ආගතා අධිගම සද්ධා නාම" යනුවෙන් හඳුන්වා තියෙනවා. ආර්ය ශ්‍රාවකයන්ගේ මාර්ගඵල ප්‍රතිවේධයෙන් ඇති වූ ශ්‍රද්ධාව අධිගම ශ්‍රද්ධාවයි. "ඛීණාසවානං සද්ධායෙතං අධිවචනං" රහතන් වහන්සේලා තුළ ඇති වන්නේ අධිගම ශ්‍රද්ධාවයි.

### අමූලික හා ආකාරවතී සද්ධා

**ඊළඟට අමූලික ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව දක්වා තියෙනවා. ඒ මෙහෙමයි. "සා පනෙසා අමූලිකා ලක්ඛණා ච ආකාරවතී ලක්ඛණා ච සද්ධා" යනුවෙන්. අමූලික ශ්‍රද්ධාව මුල් නැතිව එනම් හේතු කාරණා නොමැතිව ඇති වන්නක්. ඒ නිසාම අමූලික ශ්‍රද්ධාව ප්‍රඥාවෙන් තොරයි. ප්‍රඥාවෙන් හීනයි.** බුදුරජාණන් වහන්සේ මේ අමූලික ශ්‍රද්ධාව උපමා කරල තියෙන්නේ අන්ධවේණුපමාවටයි. පරම්පරා වශයෙන් බැඳුණු අන්ධයින් වැලක, පළමුවන අන්ධයාත් කිසිවක් දකින්නේ නැහැ. මැද හරියේ සිටින අන්ධයාත් කිසිවක් දකින්නේ නැහැ. අන්තිමට සිටින අන්ධයාත් කිසිවක් දකින්නේ නැහැ. ඒ අය යමක් පිළිගන්නව නම් පිළිගන්නේ, විශ්වාස කරනව නම් විශ්වාස කරන්නේ දැක දැන නෙවෙයි. පරම්පරාවෙන් පරම්පරාවට ආ හා එන ශ්‍රැති මාත්‍රයම අනුව විතරයි. එය හරි හෝ වේවා, වැරදි හෝ වේවා තරයේ පිළිගන්නවා. විශ්වාස කරනවා. සොයා බැලීමක් නැහැ. අමූලික ශ්‍රද්ධාව ඇත්තාත් මේ වගේමයි. කිසිවක් නොදැක, නොදැන පිළිගන්නවා. පරීක්ෂා නොකර පිළිගන්නවා. බුදුදහම මේ අමූලික ශ්‍රද්ධාව පිළිගන්නේ නැහැ. අනුමත කරන්නේ නැහැ. මොකද? අමූලික ශ්‍රද්ධාව යනු හේතු කාරණා නොමැතිව, කිසිදු පදනමකින් තොරව ඇති වන්නක් නිසා.

ආකාරවතී ශ්‍රද්ධාව යනු හේතු යුක්ති සහගත ව, පදනම් සහගත ව පිළිගැනීමයි. යෝනිසෝ මනසිකාරයෙන් යුතුව සොයා බැලීමෙන්, පරීක්ෂා කිරීමෙන් පසුව විශ්වාස කිරීමයි. "ආකාර" යන්නෙන් අදහස් කරන්නේ ම හේතු යුක්ති සහගත බවයි. ආකාරවතී ශ්‍රද්ධාව අටුවාව හඳුන්වන්නේ මෙහෙමයි. "යස්ස කස්සචි භික්ඛවෙ ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි තථාගතෙ සද්ධා නිවිට්ඨා හොති මූල ජාතා පතිට්ඨිතා අයං වුච්චති භික්ඛවෙ ආකාරවතී සද්ධා දස්සන මූලිකා දළ්හා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙනවා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං" මහණෙනි. ශාස්තෘන් වහන්සේ විමසන මේ කරුණුවලින්, මේ පදවලින් මේ අකුරුවලින් තථාගතයන් වහන්සේ කෙරෙහි යමෙකු ගේ ශ්‍රද්ධාව නොසැලීමෙන් පිහිටියේ වේ ද, සෝවාන් මාර්ග වශයෙන් හට ගත් මුල් ඇත්තේ ද, ආර්ය මාර්ගයෙහි නිරන්තරව පිහිටියේ ද, මහණෙනි, මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ වසවත් මරු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලොව අන් කිසිවෙකු විසින් හෝ හැර ගන්නට නොහැකි වූ ස්ථිර වූ දර්ශනය මුල් කොට ඇත්තා වූ මේ ශ්‍රද්ධාව කරුණු පිරික්සා ගත්බැවින් ආකාරවතී ශ්‍රද්ධාව යැයි කියනවා.

මේ හැඳින්වීමෙන් පැහැදිලි වෙනවා කරුණු හරිහැටි දැනගෙන ඇති වන ආකාරවතී ශ්‍රද්ධාව ලෝකයේ කිසිවෙකුට වෙනස් කරන්න නොහැකි බව. හරියට සූරම්බට්ඨ සිටුතුමාගේ ශ්‍රද්ධාව වගෙයි.

සැවැත් නුවර සූරම්බට්ඨ නම් සිටුතුමෙක් වාසය කළා. ඔහු අන්‍ය තීර්ථකයන්ගේ දායකයෙක්. උපස්ථායක වරයෙක්. මේ සූරම්බට්ඨට සෝවාන් වෙන්න හේතු සම්පත් ඇති බව දැකපු බුදුරජාණන් වහන්සේ දිනක් ඔහුගේ නිවසට පිඬු සිඟා වැඩියා. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශාස්තෘ වරයෙකු ලෙස ශ්‍රද්ධාව නැතත් ක්ෂත්‍රිය මහා කුලයෙහි උපන් රාජ වංශයේ උත්තමයෙකු නිසා ඇති කර ගත් ගෞරවයෙන් සූරම්බට්ඨ බුදුරජාණන් වහන්සේට දන් පූජා කළා. දන් වළඳ අවසානයේ සූරම්බට්ඨ ඉලක්ක කරගෙනම ධර්ම දේශනා කළ නිසා දේශනාව අවසානයේ සූරම්බට්ඨ සෝවාන් වුණා. මෙයින් අසතුටට පත් වසවර්ති මාරයා බුදුරජාණන් වහන්සේ හා සමාන ම රූපයක් මවාගෙන සූරම්බට්ඨගේ නිවසට ගියා. මේ බුදුරජාණන් වහන්සේ යැයි සිතූ සූරම්බට්ඨ ඉදිරියට ගොස් වැද කුමන කරුණක් නිසා නැවත වැඩම කළේ දැයි විමසුවා.

එවිට මාරයා බුදුවෙස් ගෙන කියනවා "සූරම්බට්ඨය, නුඹට ධර්ම දේශනා කරද්දි එක් කරුණක් අපරීක්ෂාවෙන් වැරදියට කියවුණා. සියලු පංචස්කන්ධයෝ අනිත්‍යයි, දුකයි අනාත්මයි කියලා දේශනා කළාට ඇත්තටම එය එහෙම නෙවෙයි. නිත්‍ය වූ ත් සැප වූ ත් සදාකාලික වූ ත් සමහර ස්කන්ධයන් තියෙනවා" යි කිව්වා.

මේ කතාව නම් ඉතාමත් බැරෑරුම් එකක්. බුදුවරු කවදාවත් නොවිමසා අපරීක්ෂාවෙන් කිසිවක් කියන්නේ නැහැ. මේ නම් ඒකාන්තයෙන්ම වෙස් මවා ගත් පවිටු මාරයා ම තමයි සිතූ සූරම්බට්ඨ

"නුඹ මාරයා නේද" යි විමසුවා. තමන් මාරයා යැයි පිළිගත් පසු නුඹ වැනි එක මාරයෙක් නොව මාරයන් දහසක් ආවත් මාගේ ශ්‍රද්ධාව සෙලවිය නොහැකියි පැවසුවා.

ආකාරවතී ශ්‍රද්ධාවේ ස්ථිරබවට තවත් කුමන කතා ද?

### පසාද සද්ධා

**ශ්‍රද්ධාවේ ප්‍රභේද දක්වන ආචාර්යවරු පසාද ශ්‍රද්ධා කියලා තවත් ශ්‍රද්ධාවක් දක්වල තියෙනවා. එය හඳුන්වා තියෙන්නේ "පසාදුප්පත්ති පසාද සද්ධා නාම" සිතේ යම් පැහැදීමක් ඇති වෙනව ද ඒ පසාද ශ්‍රද්ධාවයි. පසාද ශ්‍රද්ධාව කරුණු හතරක් මුල් වෙලයි ඇති වෙන්නේ.**

> බුදුරජාණන් වහන්සේගේ කාලයේ හිටපු වක්කලී කියන හාමුදුරුවෝ බුද්ධ ශරීරයට පැහැදිලි පසාද ශ්‍රද්ධාව ඇති කර ගත්ත හාමුදුරු නමක්. දැඩි සේ රෝගාතුර වූ වක්කලී හාමුදුරුවෝ බුද්ධ ශරීරය බලන්න යාමට නොහැකිව හරිම දුකෙන් කනගාටුවෙන් සිටියේ.

රූපය කෙරෙහි පැහැදීමෙන් ඇති වෙනවා ,

ශබ්දය කෙරෙහි පැහැදීමෙන් ඇති වෙනවා,

රූක්ෂ ප්‍රතිපත්ති කෙරෙහි පැහැදීමෙන් ඇතිවෙනවා. ඒ වගේම,

ධර්මය කෙරෙහි පැහැදීමෙන් ඇති වෙනවා

දැන් ඉන්න ගොඩක් බෞද්ධ පින්වතුන් තුළ තියෙන්නේ මේ කරුණු හතරෙන් එකක් මුල්වෙලා ඇති වෙච්ච පසාද ශ්‍රද්ධාවක් විතරයි. හොඳට මතක තියා ගන්න පසාද ශ්‍රද්ධාවෙන් විතරක් ආර්ය මාර්ගයට ප්‍රවේශ වෙන්න බැහැ.

මිනිස්සු බුදුහාමුදුරුවන් ගේ රූපයට ඇලිලා. කොච්චර ඇලිල ද කිව්වොත් අද ලංකාවේ බුද්ධ රූප, බුද්ධ ප්‍රතිමා මදි වෙලා තායිලන්තයෙන්, බුරුමයෙන් පවා ගේනවා. ගෙන්වනවා. රූපය කෙරෙහි ඇලුණු පසාද ශ්‍රද්ධාව ආර්ය මාර්ගයේ දී කිසිදු අර්ථයක් නැති බව කවුරුවත් කියා දෙන්නේ නැහැ. පැහැදිලි කරලා දෙන්නේ නැහැ. අපි කරන්නෙත් (මහා සංඝරත්නය) තව තවත් ඒ වගේ පින්කම්වලට මිනිස්සු යොමු කිරීමයි. ඒ නිසා අද පන්සල්වල, මහ පාරේ හන්දියක්, හන්දියක් ගානේ හැමතැනම පිළිම පිරිලා. පන්සලකට වුණත් බුදුගෙයි පිළිම වහන්සේයි. බෝධිය ළඟ පිළිම වහන්සේයි. චෛත්‍ය ළඟ පිළිම වහන්සේයි තිබුණම හොඳටම ඇති කියලයි මට නම් හිතෙන්නේ. මේ රූපෙට ඇලීම කොයිතරම් තේරුම් නොගත්ත ද කිව්වොත් සමහර අය ස්වාමීන් වහන්සේලා ගේ රූප කෙරෙහිත් පහදින්න පටන් අරන්.

ඒකනේ ධර්ම දේශනයක් ප්‍රසිද්ධ කරන්න දමන බැනර් එකෙත් දේශකයන් වහන්සේගේ රූපේ දමන්නේ. ඊළඟ දේශකයන් වහන්සේගේ රූපේ හරි මදිනම් ධර්මාසනය හදනවා .ලස්සනට දවස් ගණන් මහන්සි වෙලා, දහස් ගණන් මුදල් වියදම් කරලා. මුළු පළාතම ලස්සනට සරසනවා. විදුලි ආලෝකයෙන් වෛවර්ණ කරනවා. ඉතින් මිනිස්සු තොරණක් බැලුව වගේ මේවා දැකලා බලලා සතුටු වෙනව. පහදිනවා. සිතේ පසාද ශ්‍රද්ධාවක් ඇති කර ගන්නවා. එච්චරයි.

බුදුරජාණන් වහන්සේ ගේ කාලයේ හිටපු වක්කලී කියන හාමුදුරුවෝ බුද්ධ ශරීරයට පැහැදිලි පසාද ශ්‍රද්ධාව ඇති කර ගත්ත හාමුදුරු නමක්. දැඩි සේ රෝගාතුර වූ වක්කලී හාමුදුරුවෝ බුද්ධ ශරීරය බලන්න යාමට නොහැකිව හරිම දුකෙන් කනගාටුවෙන් සිටියේ. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ වක්කලී හාමුදුරුවන් ගේ කුටියට වැඩම කරලා 'අලං වක්කලී කිං තෙ ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, යො ඛො වක්කලී ධම්මං පස්සති සො මං පස්සති. යො මං පස්සති සො ධම්මං පස්සති"

වක්කලී ,මේ කුණු කය දැකීමෙන් නුඹට ඇති ප්‍රයෝජනය කුමක්ද? වක්කලී, යමෙක් ධර්මය දකිනව නම් ඔහු මා දකිනවා. යමෙක් මා දකිනව නම් ඔහු ධර්මය දකිනවා. ධර්මයෙහි පැහැදුණු තැනැත්තා මා දකිනවා යි දේශනා කළා. මොහොතක් හිතන්න, ජීවමාන බුද්ධ ශරීරයට පැහැදීමෙනුත් ප්‍රයෝජනයක් නැත්නම් අනෙක් රූප ගැන කවර කතාද?

බුදුරජාණන් වහන්සේට තිබුණේ බ්‍රහ්මස්වර හා සමාන කටහඬක් . උන්වහන්සේ ලලිත සුලලිත මධුර මනෝහර කුරවීකනාද නිර්විශේෂාදී බ්‍රහ්මස්වර පවත්වමින් ධර්ම දේශනා කළා කියලයි පොත්පත්වල සඳහන් වෙන්නේ.

# සංසාර සාගරයේ අතරමං වන්නෝ



නිකිණි පුර අටවක පෝද

## දම් දෙසුම

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස**
**අන්ධභූතො අයං ලොකො**
**තනුකෙත්ථ විපස්සති**
**සකුන්තො ජාලමුත්තෝව**
**අප්පො සග්ගාය ගච්ඡති**

"සුපින්වත්නි"

සුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව විහාරයෙහි දී පේසකාර දුවක් අරබයා මෙම ගාථා ධර්මය දේශනා කළ සේක.

අලව් නුවර වැස්සන්ගේ ආරාධනය පරිදි අප බුදුරජාණන් වහන්සේ එ නුවර අග්ගාලව විහාරයට වැඩ එහි ජනතාවට මරණය පිළිබඳ ව මෙනෙහි කරමින්, භාවනා කිරීමට ධර්ම දේශනා කළ සේක. එම දහම ඇසූ බොහෝ දෙනා තම තමන්ගේ ගෙවලට ගොස් සුපුරුදු කටයුතුවල යෙදුණාහ . එම ධර්ම දේශනා ශ්‍රවණය කරන පිරිස අතර සිටි පේසකාර දුවක් මෙසේ මෙනෙහි කළා ය.

අහෝ! බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සත්‍යතාව අපට ප්‍රත්‍යක්ෂ වන ආකාරය ඒ දහම පිළිපදින්නා මෙලොව, පරලොව, යහපත් ලබන්නේ ය. මමද මරණානුස්මෘති භාවනාවේ යෙදෙන්නෙමි'යි අදිටන් කරගත්තා ය.

අප බුදුරජාණන් වහන්සේ ද එම ධර්මය දේශනා කොට දෙව්රම් වෙහෙරට වැඩි සේක. පේසකාර දුවගේ භාවනාව තුන් වසරක් පුරාවට පැවතුණ අතර, කරුණාවෙන් හා ප්‍රඥාවෙන් වර්ධනය වූ ඇය ආධ්‍යාත්මික ගුණයන්ගෙන් සම්පූර්ණ වූවා ය. මෙසේ කල් යවන අතර, අප බුදුරදුන් එක් දවසක අලුයම් වේලේ ලොව බැලූ කල, මෙම පේසකාර දුවගේ මරණය ද, සෝවාන් වීමට ඇති වාසනා ගුණය ද දැක ඇය කෙරෙහි මහත් අනුකම්පාවෙන් අලව් නුවර අග්ගාලව විහාරයට වැඩි සේක.

අලව් නුවර වැස්සන් බණ ඇසීමට අග්ගාලව විහාරයට යන අතරට පේසකාර දුවණිය ද නො කඩවා මරණ භාවනාවේ යෙදී එහි ප්‍රතිඵල ලබන්නට මෙන් ගොස් බණ අසා සෝවාන් ඵලයට පැමිණියා ය.

එම අවස්ථාවේ පේසකාර දුවණිය වෙනුවෙන් දේශනා කළ මෙම ගාථා ධර්මයේ කෙටි අර්ථය මෙසේ දැක්වෙන්නේ ය.

"මේ ලෝවැසියන් අන්ධභූත ය. මෙහි ටික දෙනෙක් යථාර්ථය දකින්නෝ ය. දැලෙන් මිදුණු වටුවෙකු මෙන් ස්වල්ප දෙනෙක් සුගතියට යන්නෝ ය.

මෙම ගාථා ධර්මයෙන් ප්‍රධාන වශයෙන් කාරණා කීපයක් විවරණය වන්නේ ය.

ලෝකය අන්ධභාවය, ටික දෙනෙක් විශේෂයෙන් දකින බව හා එම ස්වල්ප දෙනා සුගතිගාමීවීම ය.

සත්ත්ව ලෝකය පවතින්නේ අවිජ්ජා, තණ්හා යන හේතු දෙක නිසාම ය. අවිද්‍යාවෙන් නාම රූප ධර්මයන්ගේ යථා ස්වභාවය නො දැනීමත්, තණ්හාවෙන් නාමරූපයන් අල්ලා ගැනීමත් සිදුවන්නේ ය.

සත්ත්වයා මෙලොව උපදින්නේ ද අතීත භවයන් හි දී පැවැති අවිද්‍යාදී හේතූන් නිසා ය. එම හේතුව නිසා තණ්හාවත්, දුකත් ඇති වන්නේ ය. කෙතරම් දුක්වේදනා ඇති වුව ද, යළිත් සත්ත්වයා රැස් කරන්නේ ද, දුක්වේදනාවන්ට මූලාධාරවන අවිද්‍යාවම ය.

ප්‍රාණය නිසා "ප්‍රාණීන්" යයි ව්‍යවහාර වන අතර ඉපිද පැවැත්ම නිසා "සත්ව" යන නාමය අන්වර්ථ වන්නේ ය. සත්ත්වයන් අතර මනුසත්වයාට එය පැහැදිලිව අවබෝධ කරගන්නට හැකියාව තියෙන නමුත් බොහෝ දෙනෙක් එයට උනන්දු වන්නේ නැත.

සත්ව සන්තානයේ උපරිමයෙන් ක්‍රියාත්මක වන්නේ තණ්හා චෛතසිකයයි. එයට ප්‍රධාන හේතුව වශයෙන් දක්වා ඇත්තේ අවිද්‍යාව යි. "අවිජ්ජා පච්චයා සංඛාරා" යනුවෙන් පටිච්ච සමුප්පාද ධර්මයේ දැක්වෙන අතර, සංසාර පැවැත්මට හේතුවන කාම, භව, විභව, තණ්හා ජාලයේ පැටලෙන්නේ ද අවිද්‍යාව හේතුවෙනි.

මේ ලෝකයේ අශ්‍රැතවත් පෘථග්ජනයා රූප, වේදනා, සංඥා සංඛාර , විඤ්ඤාණ යන පංචස්කන්ධයේ ඉපදීම, විනාශය, ආශ්වාදය ආදීනවය. නිශ්සරණය නො දන්නේ නම්, එය අවිද්‍යාව වන අතර එයින් අන්ධවන සත්ත්වයා ලෝක සත්ත්වයන් පිළිබඳ ව යථාර්ථය නො දන්නා බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. අවිද්‍යාව නීවරණයක් වශයෙන් ද , ආශ්‍රවයන් වශයෙන් ද සත්ත්වයාගේ පැවැත්මට හේතුභූත වන්නේ ය.

සතරමහා සාගර සිඳී වියළී යන කාලයක් පැමිණෙන්නේ ය. එහෙත් සත්ත්වයෙකුගේ උපතේ පැවැත්ම අසවල් කාලේ යැයි කියන්නට නොහැකි බව අප බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.



අස්ගිරි මහා සංඝ සභාවේ
මහෝපාධ්‍යාය
මාලගම්මන ශ්‍රී ධර්මාලෝක
පිරිවෙණේ කෘත්‍යාධිකාරී
ශ්‍රී සම්බුද්ධ ශාසන කීර්ති
සමාජසේවා ශිරෝමණී
ශාස්ත්‍රවේදී, රාජකීය පණ්ඩිත
**අමුණුපුර**
**පියරතන හිමි**

අවිද්‍යාන්ධකාරයෙන් මුළා වන සත්ත්වයා තණ්හා ජාලය තුළ වෙලී පැටලී සිටිනවා පමණක් නොව ජාති, ජරා, ව්‍යාධි, මරණාදී අනේක විධ දුක්වේදනා විඳින්නේ ය. සත්වයා සේම සංසාරේ සැරිසරනවිට සැප වේදනා අවශ්‍ය නම්, අවිද්‍යාව දුරින් ම දුරු කළ යුතු ම වන්නේ ය.

නවීන විද්‍යා මෙවලම් උපයෝගී කරගෙන පංචස්ඛන්ධය පිළිබඳ ව යථාර්ථය අමතක කොට, නිර්මාණවාදය, ආත්මවාදය, යන හැඟීම්වලින් තමනුත් මුළා වී , සමාජයත් මුළා කරන වර්තමාන මානව සමාජයට කිසිම සහනයක් නො මැත.

මිනිසා දියුණුව කරා ගමන් කරනවා යයි කියමින් දැන හෝ නොදැන යන්නේ පරිහානියට බව දැන් ප්‍රත්‍යක්ෂ වන්නේ ය. හැඟීම්, සංකල්පය, පරිකල්පනය, විශ්වාසය. අන්ධානුකරණය යන හැඟීම්වලින් තෙරපෙන මානව සමාජයට අත්‍යවශ්‍ය වන්නේ යථාර්ථවාදී දර්ශනය යි.

මෑත කාලය තුළ මිනිසා ලබාගත් අවිද්‍යාව මූලික කරගත් අත්දැකීම් අනුව මෙයට වඩා සියදහස් ගුණයෙන් යථාර්ථවාදීව ආගමික දර්ශනයෙන් පෙරටම යායුතු වන්නේ ය. අත්දැකීමෙන් ම අවිද්‍යාව ක්‍රමයෙන් තුරන් කරන්නට හැකි වන්නේ මිනිසාට අවංක චේතනාවත්, ආත්ම ශක්තියත් ඇත්නම් පමණි.

ලෝකයේ ඉතා භයානක න්‍යෂ්ටික පරමාණු විෂවායු මුදාහැරීමෙන් දසලක්ෂ සංඛ්‍යාත ජීවිත විනාශවනවිට, අති භයානක අවි ආයුධ භාවිත කරමින් මහා සංග්‍රාම කරනවිට මානුෂික හැඟීම් අල්ප මාත්‍රයෙන් හෝ නො සලකා පහත් වින්දනයක් ලබාගත් මිනිසුන් අවිද්‍යා අන්ධකාරයෙන් ජීවන ගමන් මෙන්ම සංසාර ගමනේ අතරමං වී ජාති, ජරා, ව්‍යාධි, මරණාදී මහා දුක්වේදනාවෙන් තෙරපෙන වග දැන් ප්‍රත්‍යක්ෂ වන්නේ ය.

ආගම දහම මිනිසාගේ එකම ශාන්ති කර්මයක් කරගෙන මිනිසා මිනිසාගෙන් දුරස්ථ කරනවාට වඩා තව තවත් සමීපකොට මානුෂික ගුණාංගවලින් පෝෂණය වන්නේ නම්, ලෝක ජනතාවට නීරෝගී භාවයෙන් හා කාර්ය ශූරත්වයෙන් පෙරට ම පියවර තබන්නට වාසනාව උදාවන්නේ ය.

අවිද්‍යාව සෑම අකුසල කර්මයකට ම මූලික වන බව අප බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක. එබැවින් අවිද්‍යාව නැති කිරීමට උපාය මාර්ග වශයෙන් දන, සීල, භාවනා වශයෙන් දැක්වෙන කුසල කර්මයන්හි යෙදෙමින් මෙලොව, පරලොව යහපත සලසා ගතයුතු වන්නේ ය. එවිට සංසාර සැප සම්පත් කෙළවර පරමශාන්ත නිවන් සම්පත් ලබාගන්නට භාග්‍ය ලබන්නේ ය.

**ඔබ සැමට නිදුක් නිරෝගී සම්පත් ලැබේවා!**

මීළඟ බුදුසරණ කලාපය ඇසළ පුර පසළොස්වක පෝ ද අගෝස්තු 03 සඳුද

**අප මහා බුදුපියාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකයින් වහන්සේලා දෙනම වහන්සේ ඇතුළු දහසක් වූ මහා සඟ රුවන බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන සැවැත් නුවර සිට රජගහ නුවර බලා චාරිකාවෙන් වැඩම කළ සේක.**

වැඩම කොට උපාසක උපාසිකාවන් රැස් වූ අවස්ථාවේ දී සාරිපුත්ත මහ රහතන් වහන්සේ දන්දීම සම්බන්ධයෙන් ඉතා වටිනා දේශනාවක් මෙසේ සිදුකළේ ය. පින්වත් උපාසක,උපාසිකාවනි, මේ ලෝකයේ සමහරු බොහෝ සෙයින් දන් පැන් පූජා කරනු ලබති.නමුත් එම දානයන් පූජා කරන්නේ තනිව ම ය. පිරිවර සම්බන්ධ කර නොගනී. එම නිසාම ඔවුහු උසස් ආත්මවලදී ඕනෑ තරම් භෝග සම්පත් ලබති. නමුත් පිරිවර සේනාව නොලබති. (පිරිවර සම්පත්තිය). සමහරු දන් පැන් සඳහා තමන් කිසිම දෙයක් නොකරති. වියදම් නොකරති. නමුත් දානයට අන් අය සමාදන් කරයි.පොළඹවයි. එම නිසාම ඔවුහු උපන් ආත්මවල දී බොහෝ සෙයින් පරිවාර සම්පත්තිය ලබති. නමුත් දන් නොදීම හේතුවෙන් භෝග සම්පත් නොලබති. තවත් සමහරෙක් දානයන් සඳහා තමන් ද විය පැහැදම් කොට දන් පූජා කරති.එමෙන් ම ඒ සඳහා බොහෝ පිරිස සම්බන්ධ කර ගනී. දානයෙහි සමාදන් කරවති. ඔවුහු උපනූපන් ආත්ම වල භෝග සම්පත් මෙන්ම පරිවාර සම්පත්තිය ද ලබා බොහොම සතුටින් කාලය ගත කරති. සමහර මෝඩ පුද්ගලයන් දන් නොදී පිරිවර ද ඒ සඳහා සමාදන් නොකොට මරණින් මතු උපදින ජීවිතවල, කාත් කවුරුවත් නැතිව ඉතා දුගී දුප්පත්ව උපදී. එම නිසා නුවණැත්තන් ලෙස පිරිවර සමගින් එකතු වී, සමගියෙන් යුතුව දන් පැන් පූජා කරන මෙන් සාරිපුත්ත මහ රහතන් වහන්සේ අනුශාසනා කළහ.


ඒ දහම් අසා බොහෝ පැහැදීමට පත්ව සිටි අය අතර සිටි තරුණයෙක්, සාරිපුත්ත මහ රහතන් වහන්සේ සහ මොග්ගල්ලාන මහ රහතන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේට දනට ඇරයුම් කළේ ය.

'පින්වත, සංඝයා වහන්සේලා අති මහත් ය. එම නිසා ඔබට පුළුවන් ද සියලුම ස්වාමින් වහන්සේලාට දානය පූජා කරන්න."අනේ ආර්යන් වහන්ස, මට පුළුවනි.ඔබ වහන්සේලා දානයට වැඩම කරන සේක්වා". කියා මෙම තරුණයා ආරධනා කළේ ය. පසුව ගම් පියසට ගොස් ගමේ සියලුම දෙනා රැස් කරවා, ඒ ඒ පවුල් වලට හැකි අයුරින් දානය බෙදා දුන්නේ ය. සමහර කෙනෙක් එක් භික්ෂූන් වහන්සේ නමක්. තවත් සමහරුන් දෙනමක් තුන්නමක් හතර නමක් ආදී වශයෙන් තම තමනට හැකි පමණින් බාර ගත්තේය. මෙම තරුණයා ද ඉතාම සතුටින් දානයේ සියලු වැඩ කටයුතු සූදානම් කළේය. මේ අතර ඒ නුවර සිටි කෙළඹියෙක් රන්වන් වස්ත්‍රයක් රැගෙන, එයින් කුමන හෝ ප්‍රයෝජනයක් ගන්නා ලෙස ලබා දුන්නේ ය. ඔවුන්ගෙන් සමහර පිරිසක් මේ වස්ත්‍රය ඉතා වටිනා නිසා ගුණ නුවණින් පිරිපුන් සාරිපුත්ත මහ රහතන් වහන්සේට මෙය වඩාත් ගැළපෙන බව කියා සිටියහ. තවත් සමහරෙක් ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ සාරිපුත්තයන් වහන්සේ තව මාසයකින් පමණ මේ ගමින් යනු ඇත. නමුත් දේවදත්තයන් වහන්සේ අප සමඟ හැමදාම වැඩ සිටිති. අපගේ දුකට සැපට හැමදාම වැඩ සිටින්නේ දේවදත්ත හාමුදුරුවෝ පමණි. එම නිසා මේ වටිනා වස්ත්‍රය දේවදත්තයන් වහන්සේට පූජා කළහ. ඔහුද එම රන්වන් සිවුරක් කරවා පැළඳ ඉතා උජාරුවෙන් ඒ මේ අත ඇවිදින්නට විය. කෙසේ නමුත් එක් භික්ෂුවක් බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් මේ පුවත සැළ කළේ ය. බුදුරජාණන් වහන්සේ ද මේ දේවදත්තයන් තමන්ට නොගැලපෙන දේවල් කළේ මෙකල පමණක් නොව අතීතයේදී ද මෙවැනි ක්‍රියාවන් කළේ ය. කරදරයට ද පත් විය. බොහෝ අකුසල් ද රැස් කරගත් ගත්තේ ය. යනුවෙන් දේශනා කරමින් ජාතක කතාවකින් ඒ පිළිබඳ ව විස්තර කළහ.



සාම ශ්‍රී ශාසනජෝති සද්ධර්මවාගීස්වර, සද්ධර්ම කීර්තී ශ්‍රී

**මහව කල්‍යාණ ඤාණ හිමි**



සද්ධර්ම රත්නාවලියෙන්

# අනුන් රැවටීමේ පාපය
# බරපතළ ය

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රජකම් කරන කාලයේ එරට එක්තරා පච්කාර වැසියෙක් ඇතුන් මරා ඒ ඇතුන්ගෙන් දළ, නිය හම, මස් ආදී විකුණා ජීවත් වෙමින් කාලය ගතකළේ ය.එකල මේ ලෝකය බුද්ධෝත්පාද කාලයක් නොවන බැවින් පසේබුදු රජාණන්වහන්සේලා වැඩසිටි යුගයක් විය. කැළේ ජීවත් වූ ඇත්තු ද පසේ බුදුරජාණන් වහන්සේට බොහෝ පැහැදීමෙන් උන්වහන්සේලාට වන්දනාමාන කරමින් පින් රැස් කරගත්හ.මෙය දුටු පච්කාර වැද්දාගේ සිතට ඉතා පාපි අදහසක් ඇතිවිය. ඔහු පසේ බුදුරජාණන් වහන්සේ පැන් පහසුවීමට පොකුණට බසින තුරු සිට හොරෙන් හොරෙන්ම ගොස් සිවුරු හොරකම් කළේ ය. පසුව එම සිවුර හිස සිට පොරවාගෙන ඇතුන් ගමන් කරන මාර්ගයේ රුක් සෙවණට ගොස් සිටියේ ය. ඇතුන් ද වනයට යන අතර තුර පසේ බුදුරජාණන් වහන්සේගේ සිවුරට රැවටී ඇතුළත සිටින්නේ කවුරුන්දැයි නොදැන වන්දනා කරමින් යයි. වැද්දා ද සියලුම ඇතුන් යන තුරු සිට අවසානයට යන ඇතා ඝාතනය කරයි. මේ ක්‍රියාව කාලයක් කළ විට තම කණ්ඩායමේ ඇතුන් අඩුවන බව එකල ඇත් රජුව සිටි අප මහා බෝසතාණන් වහන්සේට දැනුණි. මෙය පරීක්ෂා කිරීමට සිතූ බෝසත් ඇත් රජු එදින අවසානයට ගියේය. වැද්දා වෙනදා මෙන් සියලුම ඇතුන් යනතෙක් සිට අවසානයේ ඇත් රජුට ආයුධයෙන් පහර දුනි. අප මහබෝසත් ඇත් රජුගේ පින් බලය නිසාම එයින් ජීවිතයට හානියක් නොවුණි. වැඩේ වැරදුණු බව දැනගත් වැද්දා දිව ගිය ද කෙටි දුරක් ගිය තැන බෝසත් ඇත් රජාණන් වැද්දා කොටු කළේය. ඔහුට පහර දීමට සිතුණ ද ඇඟ දරා සිටින අරිහත් ධජයට ගරු කිරීම නිසා මෙසේ අවවාද කළේ ය. අසූචි කළයක් කොතරම් පිටින් සිත්තම් කළද ඇතුළත අපවිත්‍ර වන්නා සේ කෙලෙස් කසට පිරුණවුන්ට මෙවැනි කසාය වස්ත්‍ර නොගැළ පෙන බව පවසමින් අනුශාසනා කළේ ය.

මේ ජාතක කතාව අවසානයේ බුදුරජාණන් වහන්සේ ද ධර්මය දේශනා කළ සේක. ධර්ම දේශනාව අවසානයේ බොහෝ දෙනා මාර්ග ඵලයන්ට පත්විය. බොහෝ දෙනකුගේ ජීවිතවලට මෙය ඉතා හරවත් දේශනාවක් විය. එපමණක් නොව අපගේ ජීවිත වලට ද මෙයින් ගත හැකි කාරණා රාශියකි. එයින් වැදගත්ම දේ නම් අප කළයුත්තේ අපට ගැළපෙන සුදුසු දේ පමණි.නොගැළපෙන නොසුදුසු දේ කළහොත් එයින් අප මෙන්ම අන් අය විශාල අනතුරකට පත්වනු ඇත. එම නිසා සුදුසු දේ කිරීමට පමණක් වග බලාගත යුතු වේ. එවිට අනාගත ලෝකය මීට වඩා සුන්දර ස්ථානයක් වනු නොඅනුමාන ය.

---

## සිරි සදහම් පැන විසඳුම්

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 26

ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා නම් කරන්න

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනෙකුට ත්‍යාග තිළිණ කෙරේ.**

පිළිතුර : ..................................................

නම : ..................................................

නිවසේ ලිපිනය : ..................................................

..................................................

දුරකතන අංකය : ..................................................

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# මිහිඳු මහ රහතන් වහන්සේගේ ඉල්ලීමෙන් ඉදිකළ ථූපාරාමය



**ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන වැඩම කළ අනුබුදු මිහිඳු මා හිමියන් ගේ ඉල්ලීමක් පරිදි ,එකල ලක් ධරණීතලයේ පළමු බෞද්ධ පාලකයා වූ දේවානම්පියතිස්ස රජතුමා විසින් උස් වේදිකාවක් මත තනවන ලද ප්‍රථම ඓතිහාසික ස්තූපය "ථූපාරාමය යි."**

මේ මහා භද්‍ර කල්පයෙහි පහළ වූ සිව් බුදුරජාණන් වහන්සේලා ගේ පාද ස්පර්ශයෙන් පවිත්‍ර වූ පුණ්‍ය භූමියක් බව මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට පැවසූහ. මුල් අවධියේ දී පණ්ඩුකාභය රජු, මහේජ යක්ෂයා වෙනුවෙන් තැන වූ දෙවොලක් මෙහි පැවැති බව ජනප්‍රවාදයෙහි සඳහන් වේ. එහෙත් ථූපාරාම ස්තූපය ඉදිකරන ක්‍රි. පූ. 3 වෙනි සියවසේ එවැනි දේවාලයක් එහි නොවූ බව ද සඳහන් වේ. මෙම පෙදෙස පුරාණ නන්දන උයනට අයත් භූමියක් ලෙස ද සඳහන් වේ. දේවානම්පියතිස්ස රජතුමා පළමුව මහා විහාරය ද, දෙවනුව මිහින්තලයේ චේතියගිරි විහාරය ද, තුන්වෙනුව ථූපාරාමය ද ඉදි කළ බව මහාවංශය සඳහන් කරයි.

බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීමට මෙන් ම බුදුරජාණන් වහන්සේ සිහි කරමින් පූජා පැවැත්වීමට පූජාර්හ වස්තුවක් නොමැතිවීමේ අඩුව සපුරාලනු පිණිස ථූපාරාම ස්තූපය ඉදිකරවා තිබේ. මෙම කාලය වන විට බුද්ධ ප්‍රතිමා තැනීමේ ශිල්පය ආරම්භ වී නොතිබූ බව ද සඳහන් වේ. එබැවින් බුදුරජාණන් වහන්සේ ගේ අකුධාතූන් වහන්සේ මෙම ස්තූපයේ තැන්පත් කොට ඇති බව මහා වංශයේ සඳහන් වේ. අනුබුදු මිහිඳු මාහිමියන්ගේ ඉල්ලීමක් අනුව ස්තූපය ගොඩනැඟීමේ කටයුතු ආරම්භ වූ පසු උන්වහන්සේගේ ම අනුශාසනාව පරිදි ශක්‍රදේවේන්ද්‍රයා සතු වූ අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතූන් වහන්සේ ස්තූපයේ තැන්පත් කිරීම සඳහා සුමන සාමණේරයන් වහන්සේ විසින් වැඩම කරවන ලදී. මඟුල් ඇතු පිට තබා, පෙරහරින්, මහත් හරසරින් වැඩම වූ අකුධාතූන් වහන්සේ, අභය වැවෙන් ගෙනා ඇතාගේ උසට ගොඩ ගසන ලද පස් ගොඩ මතට වැඩම කරවන ලදී. ඇතු එහි ම නැවතී ධාතූන් වහන්සේට ආරක්ෂාව සලසන ලද බවට සඳහන් වේ.

දේවානම්පියතිස්ස මහ රජතුමා, වහා ගඩොල් තනවා ස්තූපය ඉදිකරවී ය. මහාවංශයේ සඳහන් වන පරිද්දෙන් ස්තූපයේ ධාතු ගර්භය ඉතා ඉක්මනින් නිම කරවා තිබේ. අනතුරුව දකුණු අකුධාතූන් වහන්සේ සහ රාජකීයයෝ නොයෙක් වස්තූන් ද ධාතු ගර්භයේ තැන්පත් කරන ලදින් ස්තූපයේ ඉදිකිරීම් අවසන් කරන ලදී. ථූපාරාම ස්තූපය අලංකාර ස්තූපයකි. ඒ අලංකාරයට හේතු වී ඇත්තේ ඒ වටා තනා ඇති වටදාගේ විසිතුරු ගල් කණු ය. ස්තූපය වටා අලංකාර කුලුනු ශීර්ෂ සහිත ගල් කණු පේළි හතරකි. මෙම කුලුනු මඟින් වටදාගෙය හෙවත් චේතියඝරයකින් ස්තූපය වසා පැවති ගොඩනැගිල්ලේ පියස්ස දරා සිටින්නට ඇති බව ද සඳහන් වේ. ඒ වගේ ම ස්තූපය අව් වැසි, සුළංගින් ආරක්ෂා වීමටත්, ස්තූපයේ නිදන් කර ඇති ධාතූන් වහන්සේට ගෞරවය දැක්වීමක් උදෙසාත් වටදාගේ ඉදිකර තිබෙන්නට ඇති බව සඳහන් වේ.

මෙම අලංකාර වූ ද, ප්‍රමාණයෙන් කුඩා වූ ද ස්තූපය මුලින් ම ඉදි කරන ලද්දේ ධාන්‍ය ගොඩක එනම්, ධාන්‍යාකාර ස්වරූපයට ය. එහෙත් වරින් වර විනාශ වීමත් සමඟ නැවත නැවත ප්‍රතිසංස්කරණය කිරීමත් හේතුවෙන් වර්තමානයේ දක්නට ලැබෙන්නේ ඝණ්ටාකාර හැඩයයි. ස්තූපයේ ධාතූන් වහන්සේ තැන්පත් කිරීමෙන් පසු ධාතූන් වහන්සේ දක් වූ ප්‍රාතිහාර්ය කෙරෙහි පැහැදුණු රජුගේ බාල සහෝදරයා වූ මත්තාභය රජ කුමරු සමඟ දහසක් දෙනා ද නොයෙක් ගම් ප්‍රදේශවල වැසියෝ පන්සියයක් දෙනා ද ,පැවිදි වූ බව මහා වංශයේ සඳහන් වේ.

මෙම ස්තූපය මුල් කොට දේවානම්පියතිස්ස රජතුමා විසින් සංඝාරාමයක් ද ගොඩනංවන ලදී. ස්තූප ආරාමය 'ථූපාරාම' නමින් ප්‍රකට විය. දේවානම්පියතිස්ස මහ රජුට පසු කාලීන රජවරු ථූපාරාම ස්තූපය ප්‍රතිසංස්කරණය සිදුකරමින් නවාංග රාශියක් ඊට එක් කළ බව ද සඳහන් වේ. වසභ රජු විසින් ස්තූපයේ කොතට රන් තහඩු සවිකරවන ලදී. ධාතුසේන රජු මෙන් ම දෙවැනි අග්ගබෝධි රජු විසින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී. මේ ආකාරයට දෙවැනි කාශ්‍යප රජු, මානවම්ම රජු, සය වැනි අග්ගබෝධි රජු, දෙවැනි මහින්ද රජු, දෙවැනි දප්පුල රජු, දෙවැනි සේන රජු, දෙවැනි උදය රජු, මහා පරාක්‍රමබාහු රජු යන රජවරුන් විසින් ඒ ඒ කාලවල දී යම් යම් ප්‍රතිසංස්කරණ හා නවාංග ද ස්තූපයට එකතු කරන ලද බව සඳහන් වේ.

ක්‍රි. ව. 840 පාණ්ඩ්‍යයෝ ථූපඝරයේ වස්තුව කොල්ලකා විනාශ කළහ. සොළීන් විසින් ද මුළු ථූපාරාමය ම කොල්ලකා විනාශ කරන ලදී. ක්‍රි. ව. 1862 දී සිදුකරන ලද ප්‍රතිසංස්කරණයෙන් ථූපාරාම ස්තූපයේ ප්‍රමාණය මෙන් ම හැඩය ද වෙනස් වී ඇත. වර්තමානයේ ස්තූපයේ උස අඩි 63 ක් ද විෂ්කම්භය අඩි 59 ක් ද වේ. පිහිටි පොළවේ සිට අඩි 11 හා අඟල් 6ක් උස් වූ සලපතළ මළුවේ ස්තූපය ඉදිකර තිබේ. 2 වන සියවසේ ඉදිකළ මලසුන් ගෙවල් හතරක් සිව් කොනේ පිහිටා තිබේ.


## ලංකාවේ බෞද්ධ ස්තූප - 4

ථූපාරාම ස්තූපය හාත්පස අවට භූමියේ විවිධ ආගමික ගොඩනැගිලි ඉදිකරන ලද බව ද වංශ කතාවේ සඳහන් වේ. නමුත් මෙම ගොඩනැගිලිවලින් වැඩි ප්‍රමාණයක් විනාශ වී ගොස් තිබේ.

උත්තිය රජු විසින් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ පිරිනිවීමෙන් පසු ආදාහනය කර, සංඝමිත්තා ස්තූපය කරවී ය. එය ථූපාරාමයේ ප්‍රධාන පියගැට පෙළ ඉදිරියේ ඇති චතුරශ්‍රාකාර වේදිකාව සහිත කුඩා ස්තූපය වේ. ඒ අසලම එනම් ථූපාරාම ස්තූපයේ නැගෙනහිර දෙරටුව අසල ගඩොලින් තැනූ වේදිකාවක් මත කුඩා ස්තූපයකි. එම ස්ථූපය වටා ගෙතී ඇති විශ්වාස කළ නොහැකි කතාවක් ද මහාවංශයේ සඳහන් වේ.

**'පත්තපමාණං මුනිරාජ ධාතුයො නිධාය ධාතුංපිච දක්ඛිණ කඛං දෙවාදි තිසෙසෙන කාතංහි ථූපා රාමාභිදනං පනමාමි හත්‍යා**

**දකුණු අකුධාතූන් වහන්සේ හා පාත්‍රයක් ප්‍රමාණ වූ ස්වර්ණද ධාතූන් වහන්සේ ද තැන්පත් කොට, දෙවන පෑතිස් මහ රජතුමා විසින් කරවන ලද උතුම් ථූපාරාම ස්තූපයට, මම නමස්කාර කරමි.'**



ඝණ්ටාකාර හැඩය

මේ මහා භද්‍ර කල්පයේ පහළ වූ, සතර බුදුරජාණන් වහන්සේලා එනම් කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ගෞතම බුදුරජාණන් වහන්සේලා ලංකා ද්වීපයට වැඩම කරවා නැවත දඹදිවට වඩින්නට අහසට පැන නැගුන ස්ථානයේ ශ්‍රී පාද සලකුණු පිහිටි අතර, ඒ සලකුණු මත ඉදිකරන ලද ස්තූපය 'පාදලඤ්ජන" ස්තූපය නම් වේ. මෙම ස්තූපය ලජ්ජිතිස්ස රජු විසින් ඉදිකරන්නට ඇතැයි ද සඳහන් වේ. ථූපාරාම ස්තූපය ඉදිරිපස ප්‍රවේශය අසල පිහිටි ඉතා පැරණි ළිඳකි. එම ළිඳෙන් නාග ලෝකයේ සිට නාගයන් මතු වූ බවට ඇති ජනප්‍රවාදය නිසා එය "නාගලු ළිඳ "නම් ලැබී ඇත.

ථූපාරාම ස්තූපය වටා මෙවැනි බොහෝ ජනප්‍රවාදයන් මෙන් ම මහාවංශය හා සමන්ත පාසාදිකාව හා නොයෙක් සෙල්ලිපිවල ද විවිධ වර්ණනාවන් මෙන් ම ඓතිහාසික කරුණු ද සඳහන් වේ.

**දීපා පෙරේරා**

## ආසියාවේ ආලෝකය

THE LIGHT OF THE ASIA 04

ඉංග්‍රීසි බසින් ලියැවුණු
පළමු බෞද්ධ සාහිත්‍ය නිර්මාණය

# සුළු මවකගේ දාරක ප්‍රේමය

**සිදුහත් උපත සිදුවී දින 7 කින් මායා දේවිය කළුරිය කළා ය. එම පුවත දහම නොදත් පිරිස් ඒ ස්වභාවය, යථාර්ථය බව අවබෝධ කොට ගනී. කවියා එය තවත් සුබවාදී ව දකින අයුරු මෙහිදී පැහැදිලි කරගත හැකි ය.**

**මෙලෙසින් එසිදු විණි සත්වැනි සැදෑවෙහි
නිදිපත් බිසෝ මායා තොස් පිරි මුවෙහි
යළි පිබිදුණේ නැත දෙව්ලෝ රුසිතයෙහි
ලද්දී සැනසිල්ල සුර නැමදුම් මැදෙහි**

යමක් අහිමි වන්නේ ඊට වඩා හොඳ යමක් ලැබීමට ය. එය ධනාත්මක සිතිවිල්ලකි. මායා දේවිය තුසිතයෙහි උපත ලබන්නේ සතුටෙන් නිදි යහනෙහිම පරලොව යාමෙන් අනතුරුව ය. එම භාග්‍යය ඇයට හිමිවන්නේ දෙවියන්ගේ ද නමස්කාරයන් සහිතව ය. සැම බුදුවරයෙකු ම ලබන මෑණි කෙනෙක්, තම කුසෙන් ඒ සමයෙහි තවත් දරුවෙකු බිහි නොකරයි. ඒ පරම සත්‍යය මෙතනදී ද පොදු ය.

සිදුහත් උපතින් දින 07 ක් ගතවීමෙන් අනතුරුව මහාමායාදේවිය කළුරිය කළාය. ඉන් අනතුරු ඇගේ නැගණිය සුළු මව වශයෙන් කුමරුට නො අඩුව මව් සෙනෙහස ලබා දුනි. අම්මා නැති අඩුව කුමරුට නොදැනෙන ලෙස ලබාදීමට ප්‍රජාපතිය දක්ෂ වූවා ය. ඒ බව කවියා සිත්ගන්නා ලෙස වර්ණනයට ලක්කර ඇත.

**කුමාරණට දේවිය මහ ප්‍රජාපති
කිරිමව් ලෙසින් සේවාවෙහි යෙදිණි නිති
තුන් ලෝ සනසනු ව පහළ වූ එතොල් පෙති
පිනවී එ තුමිය ගෙ පියොවුරු කිරෙන් රුති**

දරක ප්‍රේමය නිසා ම ප්‍රජාපතියට මව් කිරි එරෙන ආකාරය කවියා තේරෙන භාෂාවෙන් ම සරලව පැහැදිලි කෙරේ. ‘පියොයුරු කිරෙන් රුති’ සිදුහත් කුමරු ඇයගේ කුසෙන් නොවැදුවත්, ඇයගේ ප්‍රේමයේ ඇති මහත්බව කිරි එරීමෙන් කවියා සංකේතවත් කරයි.

සාක්‍ය වංශයට අනුව රජකමට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර ලබාදිය යුතු ය. සුද්ධෝදන රජුට වුවමනා වූයේ තම පුතු සක්විති රජ වනු දැකීම යි. එහෙයින් නියමිත වයසට එළඹුණු කුමරුට සුදුසු ගුරු වරයෙකු බමුණන් ලවා සෙවීමට රජු උත්සුක වූවේය. එහි ප්‍රතිඵලයක් ලෙස කුමරුට සුදුසු ගුරුවරයා වශයෙන් සර්වමිත්‍ර බමුණු ඇදුරන් කුමරුගේ ගුරුවරයා බවට පත්විණ. බ්‍රාහ්මණ සම්ප්‍රදායට අනුව එය සිදුවනුයේ කුමරුගේ අටවැනි වසරේදී ය.


**ඔහු ගෙ නම නම් විශ්වමිත්‍ර ය
නුවණ තම සැබැවින් ඔහු ම ය**

කවියා මෙහිදී සර්වමිත්‍ර යන නම විශ්ව මිත්‍ර ලෙස යොද ඇත.

ඒ තුළ ගුරුවරයා සතු දැනුම කෙතරම්ද යන්න නමේ අරුතින්ම පාඨකයාට දැනගැනීමට සැලැස්වීමක් හා සමාන ය. සිදුහත් කුමරුට වඩාම ගැළපෙන්නේ එම ගුරුවරයා බව කවියා තවදුරටත් තම නිර්මාණය තුළ තහවුරු කරයි. ‘නුවණ– තම’ යන්නෙන් එය වඩාත් ඉස්මතු වේ. දහමෙහි ගැඹුරුබව මෙන්ම ඥානයෙන් ශ්‍රේෂ්ඨ බව ඔහු තුළ දක්නට ලැබුණි. තමන්ට ලැබුණ මේ අවස්ථා සර්ව මිත්‍ර ඉතා සතුටින් බාරගත්හ.



කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**



# බුද්ධ පූජාවේ ලුණු ඇඹුල් බැලීම හොඳ ද? නරක ද?

**බුදුන් වහන්සේට සමාන උතුමාණන් වහන්සේ නමක් මේ ලෝක ධාතුවේ ම නැත. ඒ නිසාම උන්වහන්සේ අසම සම නම් වන සේක. ඒ උතුමාණන් වහන්සේට භික්ෂු, භික්ෂුණී , උපාසක, උපාසිකා ආදී සිව් වණක් පිරිස විසින් මල්, පහන්, සුවඳ දුම්, කොඩි වැල්, ආහාර පාන, පලතුරු , ගිලන්පස, පැන් ආදිය පිරිනමා වැඳුම් පිදුම් කරනු ලබති. බෝසතාණන් වහන්සේ දුෂ්කර ක්‍රියා කරන කාලයේ දෙව් බඹුන් ආදී පිරිස දිව්‍ය ඕජාවන්ගෙන් පවා බෝසත් සිරුර පෝෂණය කිරීමට සූදානම් වූහ.**

බෝසතාණන් වහන්සේ වනගතව වාසය කරන කාලයේ වන සිවුපාවුන් පවා ආහාර පාන පූජා කළ අවස්ථා ද සම්බුදු සිරිතේ සඳහන්ව ඇත. දුප්පත් , පොහොසත්, ජාති , ආගම්, කුල මල භේද ආදී සීමාවන් නැති බුද්ධ පූජාව ජීවමාන බුදුන් වහන්සේගේ කාලයේ සිටම සිදු කරන ලදී. තථාගතයන් වහන්සේ බුද්ධත්වයට පත්වන දිනයේදී වැළඳූ ප්‍රථම දානය වන සුජාතාවගේ කිරිපිඬු දානයත්, පිරිනිවන් පාන දිනයේදී වැළඳූ අවසන් දානය වන චුන්දසූකරගේ සූකරමද්දවයත් පිරිනැමූ පින්වතුන්ට සමාන ඵල සමානානිසංස ලැබෙන අතර එය සෙසු පිණ්ඩපාතයන්ට වඩා මහත්ඵල මහානිසංස වැඩි බවත් පරිනිර්වාණ සූත්‍රයෙහි වදාරා ඇත.

බුදුන් වහන්සේ අද ජීවමානව නොසිටියත් ජීවමාන බුදුන් වහන්සේ සේ සලකා සම්බුදු පිළිරුවට,සැදැහැති බෞද්ධයෝ ආහාර පාන ආදියෙන් බුද්ධ පූජාව තබන්නේ ගෞරව බහුමානයෙනි. විහාරස්ථානයකදී, නිවසක හෝ දානමය අවස්ථාවකදී උයා පිහා ගත් කොටසේ අග්‍ර වූ ආහාර කොටස බුද්ධ පූජාව වශයෙන් තැන්පත් කරනු ලැබේ.

කෙනෙකු ගේ ශ්‍රද්ධාව වැඩිවෙන තරමට , පුණ්‍ය සිතිවිලි , කුසල සිතිවිලි පෝෂණය වන තරමට,සිතේ පිවිතුරු බව ඇතිවන තරමට බුද්ධ පූජාව අර්ථාන්විත ය. අඳුරට යොමු වූ පාපී සිත මෙවැනි ආමිස පූජාවන්ට මූලික තැන දෙමින් බෞද්ධකම අර්ථවත් කරගැනීමට ඉවහල් වේ. බුද්ධ පූජාවෙන් අපේක්ෂා කරනු ලබන්නේ බුදු පියාණන් වහන්සේ සිහියට නගාගෙන හෙවත් අරමුණු කරගෙන සිත සාදා ගැනීමේ වැඩ පිළිවෙළකි. ‘මාර්ටිං වික්‍රමසිංහ ශූරීන් බෞද්ධයාගේ බුද්ධ පූජාව , බුද්ධ වන්දනා, දානමාන පින්කම් බෝධි පූජා කලාත්මක භාවනා වශයෙන් හඳුන්වා ඇත්තේ එහෙයිනි.

ආමිස පූජාවක් වන බුද්ධ පූජාව ප්‍රතිපත්ති පූජාවක් සඳහා පූර්ව කෘත්‍යයක් ද වෙයි. ගසක් සවි බල වීමට නම් එහි ඵලය හා අරටුව වැදගත් ය. බෞද්ධ ජීවිතයේ ඵලය ආමිස පූජාව වන අතර එහි අරටුව ප්‍රතිපත්ති පූජාව යි. බුදුන් වහන්සේ ඇතැම් අවස්ථාවල දී ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව උතුම් බවත් ,ආමිස දායාදයට වඩා ධර්ම දායාදය වැදගත් බවත් දේශනා කර ඇත. මේ බුද්ධ වචනය ඇතැම් අය වරදවා අර්ථ කථනය කළ ද එය ධම්ම පදට්ඨ කථා ධම්මාරාම වත්ථුවෙහි මෙසේ සඳහන් කර ඇත. ‘මල් සුවඳ ආදියෙන් මට පුද පූජා පවත්වන්නෝ (නියම ලෙසින්) මා පුදන්නෝ නොවෙත්. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝ (නියම ලෙසින්) මා පුදන්නෝ වෙත් යනුවෙනි.

බුදුන් වහන්සේට ලැබෙන ප්‍රත්‍ය පහසුකමක හෝ බුද්ධ පූජාවේ අඩු ලුහුඬු කමකට හෝ එහි රසයට හෝ නොඇලෙති. එය සම සිතින් විඳ දරා ගැනීම අසම සම වූ බුදුපියාණන් වහන්සේගේ සිරිත ය. එහෙත් පෘතග්ජන අපට ලුණු ඇඹුල් රසය නැතිනම් ආහාර අනුභව කිරීමට අපහසු ය. බුද්ධ පූජාවට තබන ආහාරයෙහි ඇතැම් බෞද්ධයන් ලුණු ඇඹුල් රසය බලන අතර තවත් සමහරෙක් එසේ කිරීම සුදුසු නැති බව දක්වති . එය බොහෝ විට සිදු වන්නේ කරුණු වරදවා වටහා ගැනීම හෝ තම චිත්ත සන්තානයේ පැන නඟින ශ්‍රද්ධාවේ අඩු ලුහුඬුකම නිසා විය හැකි ය.

සැම දෙයකටම මුල් වන්නේ තම සිත ය. එය ‘චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි’ බුද්ධ වචනයෙන් පසක් වෙයි. සිතේ ශ්‍රද්ධාව ඇති නම්, තබන බුද්ධ පූජාව පිළිවෙළට, පිළිවෙතින්, ප්‍රණීතව තැබිය යුතු ය. එවන් ප්‍රණීත වූ බුද්ධ පූජාවක් සඳහා පිසින ආහාරයෙහි ලුණු ඇඹුල් රසය බැලීම වරදක් නැත. වරද ඇත්තේ දිවට දැනෙන රසය අල්ලා ගනිමින් ලුණු ඇඹුල් රසය නිතර නිතර බලමින් ආහාරය ගිජු ලෙස අනුභව කිරීම ය. රසය උපාදානය නොකිරීමට උත්සාහවත් කිරීම සැබෑ බෞද්ධයාගේ පිළිවෙත ය. සැම පින්කමක්ම කළ යුත්තේ ප්‍රඥාව මූලික කරගෙන ය. ඒ අනුව ආමිස පූජාවක් වන බුද්ධ පූජාව ශ්‍රද්ධාව හා ප්‍රඥාව පදනම් කරගෙන තැබිය යුතු අතර එහි ලුණු ඇඹුල් රස බැලීම ද කළ යුත්තේ ප්‍රඥාගෝචරව ය.

ජම්මික ප්‍රබෝධනී වැලිකල

# බෝධීන් වහන්සේගේ පුරාණය

**බුද්ධවංශයෙහි බුදුරජාණන් වහන්සේලා විසිපස් නමක් පිළිබඳව සඳහන් වේ. එනම්,**

දීපංකර බුදුරජාණන් වහන්සේ
කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ
මංගල බුදුරජාණන් වහන්සේ
සුමන බුදුරජාණන් වහන්සේ
රේවත බුදුරජාණන් වහන්සේ
සෝභිත බුදුරජාණන් වහන්සේ
අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ
පදුම බුදුරජාණන් වහන්සේ
නාරද බුදුරජාණන් වහන්සේ
පදුමුත්තර බුදුරජාණන් වහන්සේ
සුමේධ බුදුරජාණන් වහන්සේ
සුජාත බුදුරජාණන් වහන්සේ
පියදස්සී බුදුරජාණන්වහන්සේ
සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ
අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ
ධම්මදස්සී බුදුරජාණන් වහන්සේ
තිස්ස බුදුරජාණන් වහන්සේ
ඵුස්ස බුදුරජාණන් වහන්සේ
විපස්සී බුදුරජාණන් වහන්සේ
සිඛී බුදුරජාණන් වහන්සේ
වෙස්සභූ බුදුරජාණන් වහන්සේ
කකුසඳ බුදුරජාණන් වහන්සේ
කෝණාගමන බුදුරජාණන් වහන්සේ
කස්සප බුදුරජාණන් වහන්සේ
ගෝතම බුදුරාජණන් වහන්සේ



යනුවෙන් බුදුරජාණන් වහන්සේලා පිළිබඳව සඳහන් වන අතර, අටවිසි බුදුරජාණන් වහන්සේලා සම්පූර්ණ වීමට තවත් බුදුරජාණන් වහන්සේලා තුන්නමක් පිළිබඳව තොරතුරු ඌනතාවයක් දක්නට ලැබේ. එම බුදුරජාණන් වහන්සේලා පිළිබඳ තොරතුරු මූලාශ්‍රයන් සහිතව මෙම ලිපි මාලාවේ දී සඳහන් කෙරේ.

මෙම ලිපි මාලාවේ තවත් මූලාශ්‍ර සාධකයක් වශයෙන් අටුවාව පරිහරණය කෙරේ.. දීඝ නිකාය අට්ඨ කථාව පිළිබඳ දීර්ඝ විස්තර විවිධ ග්‍රන්ථාවලීන්හි සඳහන් වේ. බුද්ධවංශයට ලියන ලද අටුවාව බුද්ධවංශ මධුරස්ස විලාසිනීනාම බුද්ධවංශට්ඨ කථා නැතහොත් බුද්ධවංශ අටුවාව බුද්ධදත්ත තෙරුන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද අට්ඨ කථාවක් වේ. බුද්ධදත්ත තෙරුන් වහන්සේ සුප්‍රකට අටුවාචාරී බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ගේ සමකාලීනයකු වශයෙන් සඳහන්ව ඇත. 1922 වර්ෂයේ දී යගිරල පඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ විසින් බුද්ධවංශ අටුවාවෙහි සංශෝධනයක් සිදු කර ඇත. එම අටුවා සිංහලට ද පරිවර්තනය කර ඇත. අටුවා යනුවෙන් සඳහන් වන්නේ ත්‍රිපිටකයෙහි විවිධ තැන් විස්තර කරන ලද ග්‍රන්ථාවලියයි. අටුවාවන් සිහළට්ඨ කථා වශයෙන් ද පැවතිණ. එම සීහළට්ඨ කථා බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ලංකාවට වැඩම කොට මහා විහාරීය භික්ෂූන් වහන්සේලා ගේ අධීක්ෂණය යටතේ ජාත්‍යන්තර භාෂාවක් වූ පාලි භාෂාවට පරිවර්තනය කර ඇත. බුදුදහම පැවැති සියලු රටවල පාලි භාෂාව භාවිත වූ බැවින් එම අවධිය වන විට පාලි භාෂාව ජාත්‍යන්තර භාෂාවක් ලෙස සලකා ඇත. ශ්‍රී ලංකාව, ඉන්දියාව, සියම් දේශය, කාම්බෝජය, වියට්නාමය, බුරුමය මේ ආදී වශයෙන් සියලු ම බෞද්ධ රටවල ජාත්‍යාන්තර භාෂාවක් වශයෙන් පාලි භාෂාව භාවිත වේ. සීහළට්ඨ කථා ජාත්‍යන්තර භාෂාවකට පරිවර්ථනය කරන බව මෙහි සඳහන් වේ. පස්වන සියවසේ බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ ලංකාවට වැඩම කිරීමත් සමඟ එය පරිවර්ථනය කර ඇත.



04

බෝධි පුරාණය විවරණයට අයත් වන තවත් මූලාශ්‍රයක් වශයෙන් දීප වංශය හා මහා වංශය භාවිත කළ හැකි ය. ලංකා ඉතිහාසය අධ්‍යයනයේ දී ඉතාමත්ම වැදගත් දීර්ඝ අඛණ්ඩ ඉතිහාසයක තොරතුරු එහි සඳහන් ව පවතී. එය වංශ ග්‍රන්ථ වශයෙන් පාලි සාහිත්‍යයෙහි සඳහන් වේ. සිංහල බෝධි වංශය, ජාතක අටුවාව බෝධි පුරාණය පිළිබඳව තොරතුරු ලබාගත හැකි ය. ජාතක පාලිය සුත්‍ර පිටකයේ බුද්දක නිකායෙහි ග්‍රන්ථයකි.

ජාතක අටුවාව ග්‍රන්ථය ආශ්‍රයෙන් පශ්චාත්කාලීන ව ජාතක පොත් වහන්සේ නමින් සිංහලට පරිවර්තනය විය. ජාතක අටුවාව, අටුවා ග්‍රන්ථයන්හි විශාලම ග්‍රන්ථය වශයෙන් හැඳින් වේ. එම ජාතක අටුවාව ද බෝධිපුරාණය සඳහා මූලාශ්‍රයක් වශයෙන් භාවිත කෙරේ. ත්‍රිපිටක අටුවා ග්‍රන්ථ, ධර්ම ප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය ආදී ග්‍රන්ථ පරිශීලනය කෙරේ. ප්‍රාථමික හා ද්විතික ග්‍රන්ථ ද පාලි සහ ඉපැරැණි සම්භාව්‍ය සිංහල ග්‍රන්ථයන් අධ්‍යයනය කිරීමේදී මතුවන ගැටලු නිරාකරණය සඳහා ඉහත සඳහන් ග්‍රන්ථ පහසුවක් සලසලනු ඇත.

මීට ඉහත ලිපියෙහි සඳහන් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිබඳව ඉතාම ප්‍රාමාණික කෘතියක් වශයෙන් වැලිමිටියාවේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ විසින් රචිත ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය නමැති විශිෂ්ට ග්‍රන්ථය ද මෙම ලිපි මාලාවේදී අත් පොතක් වශයෙන් භාවිත කෙරේ. අලුත්වැව සොරත හිමියන්ගේ ලංකාවේ බෝධි සංස්කෘතිය ග්‍රන්ථය මෙහිදී මූලාශ ග්‍රන්ථයක් වශයෙන් භාවිත කෙරේ. සංස්කෘත සාහිත්‍යයෙහි ඉතා ප්‍රකට සාහිත්‍යධරයා වශයෙන් හඳුන්වන කාලිදාස පඬිවරයා රඝුවංශ මහාකාව්‍යය රචනා කිරීමේ දී ඉදිරිපත් කළ අපූර්ව ශ්ලෝක පාඨයක කෙටි අදහසක් මෙසේ සඳහන් වේ. සූර්යය වංශය වර්ණනා කිරීම සඳහා රඝු වංශය රචනා කර ඇත. එය ඉතා අපහසු කාර්යයකි. “සූර්යය වංශය වර්ණනා කිරීමට උත්සාහ කරන මම පහුරකින් සාගරය තරණය කිරීමට උත්සාහ දරන්නෙකු වැන්නෙක්මි.” යනුවෙන් තමාගේ ඇති අපහසුතාවය සම්බන්ධ ව ප්‍රකාශ කොට ඇත. ඒ නයින් කල්පනා කිරීමේදී අපද අටවිසි බෝධීන්වහන්සේලා ගේ පුරාණය සඳහා ඉහත සඳහන් වූ ප්‍රාමාණික කෘති උපයෝගී කරගනිමින් මෙම ලිපි මාලාව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු.

**මෙම ලිපියෙහි ඉතිරි කොටස තිකිණි පුර පසළොස්වක පෝද පළවේ.**

**හේමමාලා රන්දුනු**



**රේරුකානේ**
**චන්දවිමල මහා නා හිමි**

## කල්‍යාණ මිත්‍රයෝ සතර දෙනා

**උපකාර වුවමනා තැන දී අවංකව මෛත්‍රී සහගත සිතින් මිතුරන්ට උපකාර කරන තැනැත්තා උපකාරක මිත්‍රයා ය. ආරක්ෂා කළ යුතු අවස්ථාවල දී මිතුරා ආරක්ෂා කිරීම ය, මිතුරා ගේ වස්තුව ආරක්ෂා කිරීම ය, විපතේ දී පිහිට වීම ය, කරුණක් පැමිණි කල්හි ධනය දීමෙන් උපකාර කිරීමය යන මේවා උපකාරක මිත්‍රයා ගේ ලක්ෂණයෝ ය.**

මිතුරාට වන සුව දුක් තමාට වන සුව දුක් සේ සලකන මිත්‍රයා සමාන සුඛදුක්ඛ මිත්‍රයා ය. තමා ගේ රහස් මිතුරාට කීම ය, මිතුරා ගේ රහස් අනෙකුකට නො දැන ගන්නට ආරක්ෂා කිරීම ය, විපතේ දී හැර නො යෑමය ය, මිතුරා වෙනුවෙන් ජීවිතය වුව ද පරිත්‍යාග කිරීමට කැමති බව ය යන මේවා සමාන සුඛ දුක්ඛ මිත්‍රයා ගේ ලක්ෂණයෝ ය.

දෙලොව යහපත සිදු කර ගැනීමේ මග පෙන්වන්නා වූ සත්පුරුෂයා අර්ථඛ්‍යායි මිත්‍රයා ය. පාපයෙන් වැළැක්වීම ය, යහපතෙහි පිහිටවීම ය, නො දත් දෑ කියා දීමය, ස්වර්ගයට මඟ කියා දීම ය යන මේවා අර්ථඛ්‍යායි මිත්‍රයාගේ ලක්ෂණයෝ ය.

සිය මිතුරාට මවක මෙන් අනුකම්පා කරන්නා වූ තැනැත්තා අනුකම්පක මිත්‍රයා ය. මිතුරාගේ පිරිහීම ගැන කනගාටුවීම ය, දියුණුව ගැන සතුටුවීම ය, දෙස් කීම් වැළැක්වීම ය, ගුණ කියන්නවුන්ට පැසසීම ය යන මේවා අනුකම්පක මිත්‍රයාගේ ලක්ෂණයෝ ය.

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය තථාගතයන් වහන්සේ විසින් ඉතා උසස් කොට වර්ණනා කරන ලද්දකි. සියලු දුකින් මිදීමට හා ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද සකල සම්පත්තීන් ම ලැබීමට ද කල්‍යාණ මිත්‍ර සේවනය බලවත් හේතුවකි.

**බෞද්ධයාගේ අත්පොත ඇසුරෙනි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
නිකිණි පුර අටවක 2020.07.27

## කළගුණ සැලකීම

ගොඩනැගිල්ලක ශක්තිමත් බවට මෙන් ම, කල් පැවැත්මට ද බලපාන ප්‍රධාන සාධකයක් වේ. ඒ එහි පාදම ය. බරක් දරා සිටින්නට තරම් පාදමට හැකියාවක් නොවේ නම් ගොඩනැගිල්ල කවර මොහොතක වුව ද පුපුරා ඉරිතැලී යන්නට පුළුවන. කඩා වැටෙන්නට පුළුවන.

මව්පිය දූ දරුවන්ගෙන් සැදුම් ලද පවුලක ස්වභාවය ද එවැනි ය. ගොඩනැගිල්ලක පාදම මෙන් ම පවුලක ගෘහ මූලිකත්වය දරන පියා ශක්තිමත් විය යුතු ය. අඹුදරුවන්ගේ ජීවිත පෝෂණය කරන්නට, ආරක්ෂා කරන්නට මෙන් ම මනාව හසුරුවා ගැනීමට ද ශක්තියක් ඔහු වෙත තිබිය යුතු ය.

පාදමක් ශක්තිමත් වන්නේ ප්‍රමාණවත් ව යෙදූ ගල්, වැලි, සිමෙන්ති ආදී අමුද්‍රව්‍ය අනුව ය. එලෙසින් ම නිවෙසක පියා හැසිරීමෙන් ද, ආත්ම ශක්තියෙන් ද, ධෛර්යයෙන් හා නිර්භීත බවින් ද යුතු විය යුතු ය. අවශ්‍ය තැන අවශ්‍ය තීරණ ගැනීමට ඍජු බවක් ඔහු තුළ තිබිය යුතු ය. පාදමක් සවිමත් කරන අමුද්‍රව්‍ය සේ මේ ගුණාංග ද පියෙකු ශක්තිමත් කරයි.

එවන් පියෙකු ලද දරුවන් භාග්‍යවන්ත ය. එවැනි සැමියෙකු ලද බිරිය සුරක්ෂිත ය. පොදුවේ පවුලක සතුට, සැනසුම සේ ම දියුණුව ද, ආගමානුකූල හැසිරීම ද ඒ තුළ නිතැතින් ම නිර්මාණය වනු ඇත.

සමාජයේ කුඩාම ඒකකය වන්නේ පවුල ය. පවුල් සංස්ථා එක් වීමෙන් සමාජය ද, රට ද නිර්මාණය වේ. ඒ සමාජයට ද, රටට ද, නායකත්වය දෙන, හසුරුවන පියෙක් සිටී. ඒ රාජ්‍ය නායකයා ය. රාජ්‍ය නායකයාට ද රට වැසියන් සියලු දෙනා තම දරුවන් හා සරි ය. පීතෘ ස්නේහයෙන් දරුවන් රකින්නා සේ රටේ නායකයා ද දනයෙන්, ප්‍රියවචනයෙන්, සමානාත්මතාවයෙන් හා අර්ථ චර්යාවෙන් සිය රට වැසියන්ට ආදර්ශවත් වේ. එමෙන් ම ස්නේහයෙන් යුතුව රට වැසියන් සේ ම ඔවුන්ට නිදහසේ හුස්ම ගෙන ජීවත් වීමට තිබෙන රට ද සුරක්ෂිත කර ගනී.

බෞද්ධයන් ලෙස අද අපි භාග්‍යවන්ත වී සිටිමු. ඒ අපේ ආගම, සම්බුදු දහම සුරක්ෂිත කරදෙන, බොදු උරුමයන් රැකදෙන නායකත්වයක් ලැබී තිබීම පිළිබඳව ය.

දස රාජ ධර්මයන් අනුව රාජ්‍ය පාලනය ගෙන යන නායකයා ඍජු ය. එඩිතර ය. අවශ්‍ය තැන නිවැරැදි තීරණ ගන්නේ ය. පසුගිය කෙටි කාලයක දීවුව අපි ඒ අත්දැකීම් අපමණ ලැබුවෙමු. කොරෝනා උවදුර මුළු ලෝකයක් බිලි ගනිද්දී අපට නිදහසේ හුස්ම ගන්නට, රෝගය පාලනය කරන්නට හැකි වූයේ, කොටින්ම කිවහොත් රෝග උවදුරු නිසා වන මරණ බියෙන් ගැලවී සිටින්නට හැකි වූයේ නිවැරැදි තැන නිවැරැදි තීරණ ගෙන ප්‍රායෝගික ව ඒවා ක්‍රියාත්මක කරවීමට හැකි ශක්තිමත් නායකත්වයක් තිබූ නිසා ය.

රටම වෙළාගත් මත්කුඩු, මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් හඹා යමින් , ඔවුන්ට එරෙහි ව දැඩිව නීතිය ක්‍රියාත්මක වන තැන රටේ අහිංසක මව්පියන්ට තම තරුණ දරුවන්ගේ ජීවිත සුරක්ෂිත බවක් හැඟී යමින් තිබේ.

ගිනි අවිවල බලය පෙන්වමින්, මිනිස් ඝාතන කරමින් නිදැල්ලේ හැසුරුණ, බන්ධනාගාරයේත් සැප විඳින පාතාලය මර්දනය වෙමින් තිබේ. රටේ නීතිය ද, සාමය ද ආරක්ෂා වෙමින් තිබේ. නිදහසේ ජීවත් වීමේ අයිතිය සුරැකෙමින් තිබේ.

තමන් හදාවඩාගත්, රැකගත් පියාණන්ට කෘත ගුණ දැක්වීම මිනිසත් ගුණ හඳුනණ දරුවන්ගේ ස්වභාවය ය. රට වැසියන් ලෙස අපට ද යුතුකමක් වේ. ඒ අපට නිවැරැදි නායකත්වයක් දෙන පියෙකු හා සරි නායකත්වයට කෘත ගුණ දැක්වීමට ය.

# ස්වාභාවික විපත්වල සැඟවුණු යථාර්ථය



**ස්වභාව ධර්මයේ ක්‍රියාකාරීත්වය තීරණය වන්නේ එය තුළ ජීවීත්වන ජීවින්ගේ විශේෂයෙන් ම මනුෂ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය අනුව බව බුදුදහම පෙන්වා දෙයි. මනුෂ්‍යයා කෙලෙස්වලින් ආතුර නො වී ධර්මානුකූලව කටයුතු කිරීමේ දී ඔහුගේ එම නිවුණු සිත හෙවත් කුසල සිත වෙතින් ස්වභාව ධර්මයට හෙවත් පරිසරයට මුදා හැරෙන කිරණ යහපත් කිරණ වන අතර , ඒ මඟින් ස්වභාව ධර්මය යහපත් වී සමතුලිත භාවයෙන් ක්‍රියා කරයි.**



බමුණුගම
නාගොල්ලාගම
ශ්‍රී සම්බෝධි විහාරයේ
**කුණ්ඩගල ධම්මරක්ඛිත හිමි**

මනුෂ්‍යයා කෙලෙස්වලින් ආතුර වී අධාර්මික ව කටයුතු කිරීමේ දී ඔහුගේ රත් වූ සිත හෙවත් අකුසල සිත වෙතින් ස්වභාව ධර්මයට හෙවත් පරිසරයට මුදා හැරෙන කිරණ අයහපත් විෂ කිරණ ය. ඒ මඟින් ස්වභාව ධර්මය අයහපත් වී අසමතුලිත භාවයෙන් ක්‍රියා කර යි. ඒ හේතුවෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදි මහා භූත රූප විකෘති වී ජල ගැලීම් , නියඟ භූමිකම්පා මෙන්ම වසංගත රෝග ආදිය ද ඇතිවන බව බුදුදහමේ පෙන්වා දී ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු පෙරදිග ඇතැම් බෞද්ධ රටවල කොරෝනා වයිරස රෝගයේ ව්‍යාප්තිය මදක් හෝ අවම වූ බව දක්නට ඇති අතර, ආර්ථික අතින් ද, විද්‍යා හා තාක්ෂණ ඥානය අතින් ද ඉතා ඉහළ තලයක පසු වන බොහෝ බටහිර රටවල රෝගය පාලනය කර ගැනීම දුෂ්කර වී ඇති බව දක්නට ලැබේ. ඊට හේතුව ඒ ඒ රටවල සිදු කෙරෙන අකුසල කර්මයන්ගේ අඩු වැඩි වීම බව පෙන්වා දිය හැකි ය.

බටහිර අන්‍යාගමික රටවල පමණක් නොව පෙරදිග ඇතැම් බෞද්ධ රටවල ද පංච ශීලය සුරකින ධාර්මික දිවි පෙවෙතකට හුරු වූ මිනිසුන් සොයා ගැනීම තරමක අසීරු ය. බුදු දහමේ කේන්ද්‍රස්ථානය යනුවෙන් හඳුන්වන අපගේ ශ්‍රී ලංකාව තුළද මනුෂ්‍යයාගේ රස තෘෂ්ණාව සංතර්පය කිරීම සඳහා දිනකට මරණයට පත් කරනු ලබන ගවයන්, එළුවන්, කුකුළන් , ඌරන් හා තවත් ගොඩබිම වසන අහිංසක සතුන් ද, කරදිය හා මිරිදිය මත්ස්‍යයන් ද ප්‍රමාණය කෙ තරම් ද? තමන් ඝාතනය කිරීමේ දී වදවේදනාවට පත්වන මෙම සතුන් වෙතින් එම මරණීය අවස්ථාවේ දී පිටවන විෂ කිරණ මොනතරම් අධික තාපයකින් යුක්තවනවා ඇති ද? මෙම සතුන් අවසන් හුස්ම හෙළන්නේ මනුෂ්‍යයාට ආශිර්වාද කරමින් ද? නැතහොත් සාප කරමින් ද? එවිට පිටවන විෂ කිරණවලින් ස්වභාව ධර්මය විකෘති නො වන්නේ ද?

සොරකම් , වංචා දූෂණ, කාම අපරාධ, මත්පැන් හා මත්ද්‍රව්‍ය ආදි නොයෙකුත් විෂමාචාර සිදුකිරීමේ දී ස්වභාව ධර්මයට මුසුවන විෂ කිරණ ප්‍රමාණය ගණනය කළ හැකි ද?

මනුෂ්‍යයා විසින් දිනපතා ස්වාභාවික පරිසරය වෙත මුදා හරිනු ලබන විෂ කිරණ කලක් තිස්සේ එකතු වීමෙන් එහි ප්‍රමාණය වැඩි වී ධාරිතාවය ඉක්ම ගිය විට පුපුරා යාමක් සිදු වේ. ස්වභාවික විපත් ලෙස අප විසින් හඳුන්වනු ලබන්නේ එම පුපුරා යාමයි. එය සුළි සුළඟක්, ජල ගැලීමක් භූමි කම්පාවක් හෝ වසංගත රෝගයක් වශයෙන් මතුවිය හැකි ය. මෙවැනි ව්‍යසන ඇතිවීමේ දී ඒවා දේවකෝප යනුවෙන් අපගේ පැරැන්නන් විසින් හැඳින්වීම ඉතා සාධාරණ ය. ඊට හේතුව ලෝක පාලක දෙවියන් වන ස්වභාව ධර්මය කෝපවීම, සමතුලිත බව නැතිවීම මෙවැනි විපත් සිදුවන බැවිනි.

මේ සඳහා හොඳ උදාහරණයක් බුද්ධ කාලයෙන් පෙන්වා දිය හැකි ය. බුදුරජාණන් වහන්සේ වැඩසිටි කාලයේ විශාලා මහනුවර ඇති වූ ව්‍යසනකාරී තත්ත්වය යි. කලින් එම නගරයේ වැසියන් අතර පැවැති ධාර්මික තත්ත්වය කාලයාගේ ඇවෑමෙන් වෙනස් වී මනුෂ්‍යයන් අධාර්මික තත්ත්වයට පත් විය. මනුෂ්‍යයාගේ මනුස්සකම නැති වී ගොස් අමනුස්ස තත්ත්වයට පත් විය. අමනුස්සයන් බිහි වූයේ මනුෂ්‍යයාගේ ම චිත්ත සන්තානය තුළිනි. ඒ ආකාරයට අමනුස්ස බිය ඇති විය. මෙසේ මනුෂ්‍යයා අමනුස්ස සිතින් ක්‍රියාකිරීමේ දී පස් පව්, දස අකුසල් සිදු වී පරිසරයට හෙවත් ස්වභාව ධර්මයට විෂ කිරණ මුදාහැරීම සිදු විය. ස්වභාව ධර්මය විකෘති වී හෙවත් කෝප වී වැසි නැති විය. වගාවන් පාළු විය. ශික්ෂාව හෙවත් ආහාර නැතිවිය. ඒ ආකාරයට දුර්භික්ෂ බිය ඇති විය. ආහාර නැතිවීම නිසා ශරීරයට අවශ්‍ය පෝෂණය නැති වී මිනිසුන් රෝගී වූහ. ඒ ආකාරයට රෝග බිය ඇති විය.

පසුව බුදුරජාණන් වහන්සේ වැඩම කර උන්වහන්සේගේ මහා කරුණාවෙන් ස්වභාව ධර්මය තුළ විකෘති වී තිබූ, කර්කශ වී තිබූ පඨවි, ආපෝ, තේජෝ වායෝ ආදී මහා භූතයන් යළි සමතුලිත තත්ත්වයට පත් කරන ලදී. මේ සඳහා උන්වහන්සේ උපයෝගී කර ගත්තේ රතන සූත්‍රය යි. තව ද උන්වහන්සේ විසින් නුවරවාසීනට දහම් දෙසා පව්, දස, අකුසල කිරීමෙන් වළකාලන ලදී. එයින් විශාලා මහනුවර යළි යථා තත්ත්වයට පත් විය.

එසේ “නම් වසංගත රෝග ආදී ස්වභාවික විපත්වලින් මිදීමට නම් කළයුතුවන්නේ පස් පව්, දස අකුසල්වලින් වැළකී නිවුණු සිතක් භාවිත කරමින් ජීවත් වීම යි. එවිට පරිසරයට හෙවත් ස්වභාව ධර්මයට මුදා හැරෙන කිරණ තාපාංකයෙන් අඩු යහපත් සුදු කිරණ නිසා ස්වභාව ධර්මය සමතුලිත භාවයෙන් පවතී. ස්වභාවික විපත් සිදු නොවේ. සියලු අකටයුතුකම්.පව්කම් සිදුකරමින් උදේ හවා රතන සූත්‍රය දේශනා කළාට හෝ ශබ්දවාහිනී යන්ත්‍ර මඟින් විසුරුවා හැරියාට හරියන්නේ නැත. විකෘති වී ගිය ස්වභාව ධර්මය යළි ප්‍රකෘතිමත් කිරීමේ ශක්තිය ශබ්දවාහිනී යන්ත්‍ර තුළ හෝ අකුසලයෙන් රත් වූ සිත් ඇති මනුෂ්‍යයන් තුළ හෝ නැති බැවිනි.




## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළින් ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක් වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරේ.

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි**
budusarana@lakehouse.lk **වෙත යොමු කරන්න.**
**බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ**

# ප්‍රතිපත්ති ගරුක භික්ෂූන් වහන්සේ ගිහියාට ආදර්ශයකි

ධර්මානුචාරී වීම භික්ෂූන් වහන්සේගේ පරම යුතුකම ය. සිව්පසයෙන් සලකන දායකයන්ට කළ හැකි උපරිම සේවය නම් තමන් වහන්සේ සිල්වත් ව සිටීම ය.

යාදිසං වපතෙ බීජං
තාදිසං හරතෙ ඵලං
කල්‍යාණ කාරි කල්‍යාණං
පාපකාරීච පාපකං

යහපත් ගති පැවැතුම්වලින් සමන්විත භික්ෂූන් වහන්සේ සරුකෙත් ලෙස හැඳින්වේ. සරු කෙතක හොඳ බීජ වර්ගයක් වැපිරූ කල්හි උසස් අස්වැන්නක් ලැබිය හැකි ය. සිල්වත්, ගුණවත් භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම ගිහියන්ට ආදර්ශයක් වේ. ගිහියන් තුළ ශ්‍රද්ධාවක් පහළ වීමට ප්‍රතිපත්ති ගරුක භික්ෂූන් වහන්සේලාගේ මාර්ගෝපදේශකත්වය මහෝපාකාරී වේ. භික්ෂූන් වහන්සේලා අනුගමනය කිරීම කරණ කොටගෙන ගිහියෝ ධාර්මික වන්නාහ.



ජාතික පිරිවෙන් උපදේශක ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

# අම්පාරේ පිරිවෙන් සමූහයට අන්තර්ජාල බිහිදොරක්




අම්පාරදිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන පිරිවෙන් සඳහා විශේෂිතවෙබ් අඩවියක් පසුගිය දා එළිදැක්වීය.

අම්පාරදිස්ත්‍රික් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) මාපාකඩ පේමරතන හිමියන්ගේමග පෙන්වීම යටතේ, දිස්ත්‍රික් පිරිවෙන් සම්බන්ධීකරණ සහකාර අධ්‍යක්ෂ කිරිඳිවැල සෝමරතන නාහිමියන්ගේ උපෙදස් මත මෙම වෙබ් අඩවිය ක්‍රියාත්මක කෙරේ.

පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ සියලු තොරතුරු හා දිස්ත්‍රික්කයේ පිරිවෙන්ගුරු තොරතුරු එක් අවකාශයකට ගොනුකිරීම හා පිරිවෙන් අධ්‍යාපනයගුණාත්මකව සංවර්ධනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර සැපයීමේ අරමුණින් මෙම වෙබ්අවකාශය ක්‍රියාත්මක වේ.

විශේෂයෙන් කොවිඩ් 19 උවදුර පවතින කාලය තුළ සිසුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා දිරිදීම සඳහා විශේෂිත පාඩම් හා මාර්ග ගත (online) අභ්‍යාසයන් කිරීමේ පහසුව ද මෙම වෙබ් අඩවිය තුළින් සළසා තිබීමවිශේෂ ත්වයකි.පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතිය වෙනුවෙන් හා අම්පාර දිස්ත්‍රික්කයේ පිරිවෙන්වල ඉගෙනුම් සම්පත් හුවමාරු කරගැනීමට, පිරිවෙන් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට හා පිරිවෙන් අතර සබඳතා ගොඩනැගීමට, තොරතුරු තාක්ෂණික එළැඹුමක සිට පිරිවෙන් අධ්‍යාපනය නව දිශානතියකට යොමුකිරීමට යන අරමුණු පෙරදැරිව අම්පාරදිස්ත්‍රික් පිරිවෙන් සමූහය නම් වන මෙම වෙබ් අඩවිය පවත්වාගෙන යන බව දිස්ත්‍රික් පිරිවෙන් සම්බන්ධීකරණ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ කහගල චන්ද්‍රාලෝක හිමියෝ සඳහන් කරති. දිස්ත්‍රික්කයේ පිරිවෙන් පිළිබඳව පමණක් නොව සමස්ත පිරිවෙන් පද්ධතියට ම අවශ්‍ය කෙරෙන ඉගෙනුම් මූලාශ්‍ර හා තොරතුරු සඳහා අවශ්‍යයොමු කිරීම් මෙම වෙබ් අඩවිය තුළින් ලබා දී තිබීම ද විශේෂත්වයකි.

https://amparapiriven.com ලිපිනය තුළින් වෙබ් අඩවියට පිවිස අවශ්‍ය සේවාවන් ලබා ගත හැකිය.

# ධර්මය ප්‍රගුණ කරන අධ්‍යාපන මධ්‍යස්ථානය

**පිරිවෙන් අධ්‍යාපනයේ අරම්භය හා විකාශනය 03**

එදා අනුරාධපුර යුගයෙහි තිබූ මධ්‍යස්ථාන ලෙස මහාවංශයෙහි සඳහන් වන අධ්‍යාපනික මධ්‍යස්ථාන මෙසේ නම් කළ හැකි ය.

01. මහාවිහාර පිරිවෙන
02. අභයගිරියේ උත්තරෝළ්හ පිරිවෙන
03. ජේතවන පිරිවෙන
04. මයුර පිරිවෙන
05. කාලාපාසාද පිරිවෙන

මෙම පිරිවෙන් ආයතනවල සිදු වූයේ ත්‍රිපිටකය, අට්ටකථා ආදිය ඉගෙනීම, කටපාඩම් කිරීම, ප්‍ර ගුණ කිරීම, පාලි භාෂාව හෙවත් මාඝදී භාෂාව ප්‍රගුණ කිරීම හා ධර්මය සජ්ඣායනා කිරීම වැනි අධ්‍යාපනික කටයුතු ය. ථෙරවාදය මුල්කරගත් අධ්‍යාපනික කටයුතු මහාවිහාර පිරිවෙන කේන්ද්‍ර කරගනිමින් සිදු වූ අතර අභයගිරි පිරිවෙන් විහාරය ඊට වෙනස් මගක ගමන් කළ බව පෙනේ. සංස්කෘත භාෂාව මුල්කරගනිමින් දෙස් විදෙස් වශයෙන් හෙවත් ජාත්‍යන්තර සබඳතා පවත්වමින් අභයගිරි පිරිවෙන වෙනස් මගක කමන් කළ බවට මහාවංසය සාක්ෂි දරයි.

ඔවුන් ධර්මය පමණක් නොව මහජන සුභසිද්ධිය සඳහා අවශ්‍ය වන ලෞකික විෂයයන් ද මෙහි ඉගැන්වීම සිදුකළ බව පෙනේ. බුදු රජාණන් වහන්සේගේ උපදේශය අනුව "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය..." යන කියමනට අනුගත වෙමින් ගම් දනව් සැරිසරමින් බොහෝ ජනයාට අධ්‍යාත්මික විමුක්ති සුවය ලබාදීම සිදුකිරීම එක් පිරිවෙනක් ඇසුරු කරමින් සිදුවන අතර පොදුජනයාගේ එදිනෙදා ජීවිතයේ සුභ සිද්ධිය පිණිස හේතුවන දේ මෙන් ම විහාරස්ථාන අභිවෘද්ධිය පිණිස වන කටයුතු තවත් පිරිවෙනකින් සිදුවීම විශේෂත්වයකි. මේවා අසුරු කරමින් මහජනයාට ඉගැන්වීම සඳහා විශේෂ භික්ෂු පිරිසක් ද පුරුදු පුහුණු වූහ.

1. ධර්ම කථික – ධර්මය දේශනා කළ පිරිස
2. පද භාණක – ධර්ම පාඨ වචනයක් පාසා විස්තර කරන පිරිස
3. දිවා කථික – දිවා කාලයේ ධර්මය උගන්වන පිරිස
4. භාණක පරම්පරා – ත්‍රිපිටකය පාඩම් කළ පිරිස

(මෙම භාණක පරම්පරා අතර සූත්‍ර භාණක, විනය භාණක, අභිධර්ම භාණක වශයෙන් ත්‍රිපිටකය කොටස් වශයෙන් පාඩම් කළ පිරිස් මෙන් ම ත්‍රිපිටකය ම පාඩම් කළ ත්‍රිපිටක භාණක යනුවෙන් ද පිරිසක් සිටිබව පෙනේ)

මාතලේ අළුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනතුරු මෙම භාණක පරම්පරා අවිච්ඡින්න ව පවත්වා ගෙන ඒමට භික්ෂූන් වහන්සේ ක්‍රියා කොට ඇත. බැමිණිතියා සායෙන් පසු මෙම පිරිවෙන් ඉතිහාසය නවමු මගකට යොමුවිය. එහි සුවිශේෂීදියුණුවක් අපට දක්නට ලැබෙන්නේ කෝට්ටේ යුගයේදී ය.

**කොටනෙළුවේ පුඤ්ඤදනන්ද හිමි**
**ඌරුගමුවේ අස්සජී හිමි**

## ප්‍රාචීන විභාග කල් යයි

ප්‍රාචීන භාෂෝපකාර සමාගම හා විභාග දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වන ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාගදින නියමයක් නොමැතිව කල් දමා තිබේ. එය ජූලි 20 වෙනිදින ආරම්භ කිරීමට නියමිතව තිබුණ ද රටේ පවත්නා කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය පිළිබඳ වූ වෛද්‍ය උපදෙස් සැලකිල්ලට ගැනීමත්, ඉදිරියේ එළඹෙන මහ මැතිවරණයත් නිසා මෙම තීරණයට එළඹ ඇත. මහ මැතිවරණය අවසන් වී කොවිඩ් තත්ත්වය පහවගිය පසු විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට විභාග පැවැත්වෙනදිනයන් ප්‍රසිද්ධියට පත් කරන බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ලේකම්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාචීන) බණ්ඩාරවෙල රතනසාර හිමි පවසයි.

## දුටුගැමුණු රජතුමා -01



# තෙල් කටාරමේ පැසෙමින් ධර්මය දේශනා කළ

# කැලණිතිස්ස මහ රහතන් වහන්සේ

**දේවානම් පියතිස්ස රජතුමා ගේ සොහොයුරෙකු වූ මහානාග කුමරුගෙන් දකුණු ලක රජ පරපුර ආරම්භ වෙයි. දේවානම් පියතිස්ස රජුගෙන් පසුව අනුරාධපුර රාජධානි යේ රාජ්‍ය බලය හිමිවිය යුතුව තිබුණේ ඔහුගේ සෙහොයුරු මහානාග කුමරුට ය.**

එහෙත් තිස්ස රජුගේ පුතුට රජකම ලබාදීම සඳහා බිසව මහානාග කුමරු මැරවීමට කටයුතු කළා ය. ඇය එක් දිනක් අඹ ගෙඩියකට විෂ ඇතුළත් කොට එය අඹ කුඩයක් උඩින් ම තබා කුඹුරෙහි වැඩ කරමින් සිටි මහානාග කුමරු වෙත යැව්වා ය. එහෙත් විෂ අඹ ගෙඩිය රස බැලුවේ කුඹුරෙහි දුව පැන සෙල්ලම් කරමින් සිටි බිසව ගේ පුත්‍රයා ය. විෂ අඹ ශරීර ගතවීම නිසා ඔහු මරණයට පත් විය. මෙයින් බියට පත් මහානාග කුමරු පලා ගියේ ය. එසේ යන අතරමග දී කුමරු ගේ දේවිය 'යටාල' නම් ප්‍රදේශයේ දී පුතෙක් බිහි කළාය. ඔහු යටාලතිස්ස නම් විය. යටාල තිස්ස ගේ පුත් ගෝඨාභය ද, ගෝඨාභය ගේ පුත් කාවන්තිස්ස ද පිළිවෙළින් මාගම රජ වූහ.

කාවන්තිස්ස රජු මාගම අගනුවර කර ගනිමින් රුහුණේ රජු බවට පත් විය. මෙතුමා අතිශයින් ම කාලවර්ණ දේහයකින් යුක්ත වූ නිසා කාක වර්ණ තිස්ස හෙවත් කාවන් තිස්ස ලෙස හැඳින්වූ බවට ඉතිහාස යේ සඳහන් වේ.

කාවන්තිස්ස රජතුමා විවාහ වූයේ "දේවි" නම් කුමරිය සමඟයි. කැලණිතිස්ස රජතුමා ගේ දියණිය වූ ඇය රුවින් පිරි, ගුණයෙන් හෙබි කුමාරිකාව ක් වූවා ය. දේවි කුමරියට මහාසිව, අභය යනුවෙන් සොහොයුරන් දෙදෙනෙකු විය. දේවි කුමරිය කුඩා කල සිය පියා ගේ සෙවණේ ආදරය නොඅඩුව ලබමින් ඇති දැඩි වූවාය.

ඇය රට වැසියන් ගේ ද ඉමහත් ආදරයට පාත්‍ර වූවා ය. ඇය කුඩා කල තමන් ගේ වැඩිමහලු සොහොයුරන් දෙදෙනා සමඟ කැලණි විහාරයට ගොස් කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේගෙන් බණ දහම් උගත්තා ය. ඊට අමතරව දුනු ශිල්ප, හස්ති ශිල්ප, අශ්ව ශිල්ප ආදිය ද ප්‍රගුණ කළා ය.

ස්වකීය පරපුර පිළිබඳ සිය මැණියන් දක්වන අහංකාර බව දේවි කුමරිය එතරම් ප්‍රිය නොකළාය. තමන්ගේ රූපශ්‍රීය පිළිබඳ අහංකාරව වෙසෙන තම මව ඇතැම් අවස්ථාවල දී පියාණන් අභිබවා යාමට දරන උත්සාහය ගැන කනගාටුවට පත් වූවා ය.

නාග ගෝත්‍රිකයන් තමන් ගේ නායිකාව ලෙස ඇයට දක්වන ගෞරවය මෙම අහංකාර බවට හේතු වී ඇති බව ඇය තේරුම් ගත්තා ය.

කැලණිතිස්ස රජතුමා ගේ සිතට නිතර වදදෙන ගැටලුවක් විය. ඒ තම සොහොයුරු උත්තිය කුමාරයා සමඟ තම බිසව පවත්වන අනියත සම්බන්ධය යි. එම ඇසුර නවත්වන ලෙසට කොතරම් අවවාද කළ ද එයින් ඵලක් නොවී ය. මේ නිසා ඒ සම්බන්ධ ව දැඩි පියවරක් ගැනීමට එතුමා තීරණය කළේ ය.

රජ ගෙදර සිදුවන මෙම සිදුවීම් දියණියට රහසක් – ලෙසට තබාගත යුතු බව දියණිය ගේ සේවිකාවන්ට ද අණ කළේ ය. මෙම ප්‍රශ්න ඇයගේ මනසට ඇතුළු වුවහොත් ඇය වෙනුවෙන් තබා ඇති අනාගත බලාපොරොත්තු බිඳ වැටෙනු ඇති බවට රජතුමා කල්පනා කළේ ය.

මේ අතර රාජකීය උද්‍යාන යේ හොල්මන් පවතී යැයි රාවයක් රජගෙදර පුරා පැතිරී ගියේ ය. මේ නිසා සවස් භාගයේ දී එහි යෑම කිසිවකුත් සිදු නොකළහ. මෙහි කිසියම් සැකයක් ඇති බවට නිගමනය කළ රජතුමා උද්‍යාන පාලකයා ගෙන්වා වහාම මේ පිළිබඳ ව පරීක්ෂා කර හොල්මන අල්ලා සිරගත කර තමාට දැනුම් දෙන ලෙසට අණ කළේ ය. දින කිහිපයක් සුපරීක්ෂාකාරී ව සිටි ආරක්ෂක භටයන් නෙළුම් පොකුණු තෙර ලතා මණ්ඩපය තුළදී හොල්මන හඳුනා ගත්තේ ය. ඔවුන් වහාම ඒ බව රජතුමාට දැනුම් දුන්නේ ය. උද්‍යාන යේ සවස් කාලයේ හොල්මන් කරන්නන් හඳුනාගත් බවත්, ඔවුන්, පිටස්තර පුද්ගලයන් නොව රජ මාළිගයේ ම පුද්ගලයන් බවත් ඒ නිසා ම ඔවුන් සිරභාරයට ගැනීමට බිය වූ බවත් පැවසී ය. ඒ වෙන කිසිවකුත් නොව මහා බිසවුන් සහ උත්තිය යුව රජතුමා බව පැවසී ය.

රජතුමාට ඉමහත් කෝපයක් මෙන්ම ලජ්ජාවක් ද ඇති විය. එහෙත් ඒ බවක් නොපෙන්වීමට වග බලා ගත්තේ ය. මෙය රහසක් වශයෙන් තබා ගන්නා ලෙසට ආරක්ෂක භටයන්ට ද දැන්වීය. මේ ගැටලුවට කුමක් කළ යුතු දැයි කල්පනා කළේ ය. රජතුමා ගේ කෝපය ඉහවහා ගියේ ය. හිස ගිනිගන්නා සේ දැනිණි. සිතට කිසිදු සහනයක් නැත.

රජ මැදුරේ උද්‍යානයේ හොල්මන් සිටිනවා යැයි ප්‍රචාරය කරවීම උත්තිය යුවරජු විසින් කරන ලද්දකි. ඒ සඳහා සහාය දැක්වූ මුර සෙබළුන් ගෙන්වා දඬුවම් නියම කළේ ය. බියට පත් ආරක්ෂක සෙබළු සමාව අයැද සිටියහ. හොල්මන් කළ පුද්ගලයන් අල්ලා දෙන ලෙස අණ කළේ ය. රජතුමා ද උද්‍යානයේ රැකවල්ලා සිටියේ ය. මුර භටයන් ලතා මණ්ඩපයට ඇතුළු වනු දුටු උත්තිය කුමරු පලා ගියේය. රජ බිසව බියෙන් එළියට ආවා ය. කෝපයට පත් රජතුමා මහ හඬින් බැනවදිමින් ඇයව පළවා හැරියේ ය.

රජ බිසව කෙරෙහි හටගත් කෝපයත් පිළිකුලත් දේවි කුමරියට හෝ රජගෙදරට නොපෙන් වූ රජතුමා සාමාන්‍ය පරිදි රාජ්‍ය පාලන කටයුතු කළේ ය. සුපුරුදු පරිදි දිනපතා මහා සංඝයා වහන්සේ ට දානය පිළිගැන්වී ය.

කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේ සුපුරුදු පරිදි මහා සංඝයා වහන්සේ සමඟ දහවල් දානයට රජමාළිගයට වැඩම කළහ. දානය වළඳ ආපසු වඩින මහා සංඝයා වහන්සේ සමඟ ටික දුරක් ගමන් කිරීම රජතුමා ගේ පුරුද්දකි. එසේ වැඩම කරන භික්ෂූන් වහන්සේ අතර හොරට සිවුරු පොරවාගත් අයකු සිටි බව කිසිවෙකුත් දැන සිටියේ නැත. ඔහු දන් වළඳ ආපසු වඩින ගමනේ දී ඉතා සූක්ෂම ලෙස කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේ පසුපසින් ම ගමන් කළේ ය. උන්වහන්සේ රජු හා බිසව අසලින් ගමන් කරන අවස්ථාවේදී ම භික්ෂු වෙස්ගත් පුද්ගලයා රජ බිසවට පෙනෙන සේ හසුනක් බිමට දැම්මේ ය. එය දුටු රජතුමා තල්පත ගෙන කියවීය. එය තම බිසවට ලියන ලද පෙම් හසුනකි.

රජතුමා නිරුත්තර විය. හසුනේ ඇත්තේ කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේගේ අත් අකුරු ය.

මේ සැතිරී හාමුදුරුවන් සමඟ ද සම්බන්ධයක් පටන් අරගෙන යැයි කෝපයෙන් කෑගැවේය. පෙම් හසුන ගෙන ආ ශ්‍රමණ වෙස්ගත් පුද්ගලයා අල්ලා හිස ගසා මරා දමන්නට නියම කළේ ය. අනාචාරයේ හැසිරෙන මුරණ්ඩු රජ බිසව දියේ ගිල්වා මරා දැමීමට අණ කළේ ය.

මහා සිල්වත්කමක් පෙන්වමින් මෙතරම් පහත් ක්‍රියාවක නියැළුණු මේ කැලණිතිස්ස රහත් තෙරණුවෝ අල්ලා උණුතෙල් කටාරමක බහා මරා මුහුදට විසි කරන ලෙස ද අණ කළේ ය. රාජ පුරුෂයන් විසින් අල්ලා ගන්නා ලද ශ්‍රමණ වෙස්ගත් භික්ෂුව වධකයා ඉදිරියේ කරන ලද ප්‍රකාශනයෙන් ඔහු උත්තිය කුමාරයා ගේ බස් අසා රජ බිසවට රහස් හසුනක් දෙන්නට පැමිණි බව පැවසී ය. බොරුවට සිවුරු පොරවා භික්ෂු වෙස්ගෙන පුද්ගලයකු රජ මැදුරට එවා ඇත්තේ උත්තිය කුමරු විසින් බව අනාවරණය වන විට කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේ උණුතෙල් කටාරමක ලා වද දෙමින් සිටියේ ය. එහෙත් උන්වහන්සේ ගාථා සියයක් දේශනා කරමින් සමාධි සුවයෙන් තෙල් කටාර මේ නොදැවී සිටියේ ය.

රජතුමාගේ නියමයෙන් කැලණිතිස්ස රහත් තෙරුන් වහන්සේ උණුතෙල් කටාරමක බහා වධ දෙන බවත්, උන්වහන්සේ සමාධි සුවයෙන් නොදැවී ධර්මය දේශනා කරන බවත් ගම් නියම්ගම් පුරා පැතිර ගියේ ය. රහත් භාවයට පත්ව සිටි උන්වහන්සේ ධර්ම දේශනාව අවසානයේ පිරිනිවන් පෑහ. ඉන්පසු රජතුමාගේ අණ පරිදි රාජ පුරුෂයන් විසින් එම දේහය මහමුහුදට ගෙන ගොස් දමන ලදී. රජුගේ මෙම ක්‍රියාපිළිවෙතට එරෙහිව සියලු භික්ෂූන් වහන්සේලා විරෝධය පෑහ.

අයන්ති විතාන

# මිසදිටු දහමෙන් සැමියා මුදාගත්

# ධනඤ්ජානි බැමිණිය

**අප භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වැඩසිටි කාලයේ ඒ ගමෙහි භාරද්වාජ ගෝත්‍රයට අයත් බමුණෙක් සහ ඔහුගේ බිරිය වන ධනඤ්ජානි නම් බැමිණිය ජීවත් වුණා. උසස් බ්‍රාහ්මණ ගෝත්‍රයකට අයත් ඔවුන් මහාබ්‍රහ්මයා සරණ ගොස් සිටි අය යි.**

"බ්‍රාහ්මණයෝ මහ බ්‍රහ්මයාගේ මුඛයෙන් උපන්නාය" කියා ඒ බමුණා පිළිගත්තා. ඒ වගේම ඔහුගේ විශ්වාසයත් එය වුණා.

එහෙත් ධනඤ්ජානි බැමිණිය තථාගතයන් වහන්සේ ගේ ධර්මය අසා සෝවන් ඵලයට පැමිණ සිටි කාන්තාවක්. බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ නොසෙල්වෙන පරිදි පැහැදුණු ඇය නිතරම බුදුගුණ සිහි කරන්නට පුරුදුව සිටියා.

විපතේ දී තමන්ගේ පිහිට කොට සලකන දේවතාවන් සිහි කිරීමත්, ඔවුන්ට නමස්කාර කිරීමත් මේ බ්‍රාහ්මණයන්ගේ සිරිතක්. නමුත් බුද්ධ ශ්‍රාවිකාවක් වූ භාරද්වාජ බමුණාගේ බිරිය ධනඤ්ජානි විපතේ දී සිහි කරන්නේ භාග්‍යවතුන් වහන්සේ යි. ඇගේ පය යමක හැපුණත්, වේදනාවක් ඇති වුණත් ඇය බුදුරදුන් සිහි කළා. ඒ වගේම ඇය බුදුරජාණන් වහන්සේ වැඩසිටි වේළුවන විහාරය දෙසට හැරී ඇඳිලි බැඳ "නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" යැයි තෙවරක් කියා සිටිනවා. එය ඇසෙන වාරයක් පාසා භාරද්වාජ බමුණා කිපෙනවා.

"මැය කොහිවත් සිටින මුඩු මහණුන් සිහි කරමින් නිතරම වන්දනා කරනවා" යැයි කෝපයෙන් කෑ ගසනවා. භාරද්වාජ බමුණා "බුද්ධ" යන වචනය පවා අසන්නට කැමැති නැහැ. ඔහු එතරම් ම මිසදිටු දහමේ සමාදන් ව සිටියා.

ඔහු විටින් විට තම නිවසට බමුණන් ගෙන්වා දන් පිරිනැමුවා. බැමිණිය ද විටින් විට බුදුපාමොක් මහ සඟ රුවන සිය නිවසට වැඩම කරවා දන් පිදුවා. බැමිණිය තථාගතයන් වහන්සේගේ ධර්මය අසා මසුරුමල දුරුකළ කාන්තාවක්. කාට වුවත් දීම යහපත් බව ඇය දන්නවා. එනිසා සැමියා බමුණන්ට දන්දෙන දිනවලදී ඇය සියතින් ම ඔවුනට සංග්‍රහ කරනවා. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට දන් දෙනු බලා සිටීමටවත් තරම් හික්මීමක් නැති බමුණා, බැමිණිය දන් දීමට සැරසෙන දිනවල බමුණා උදයෙන් ම නිවසින් පිටතට යනවා.

දිනක් බමුණා දන්දීම සඳහා බමුණන් පන්සියයකට ආරාධනා කොට බැමිණියට කියනවා

"සොඳුර, හෙට මේ නිවසට පන්සියයක් බමුණන් එනවා. නුඹ වෙනදා මෙන් හෙටත් අර මුඩු මහණාට නමස්කාර කළහොත් ඔබගේ ඒ හැසිරීම දන්නා බමුණෝ මිසදුටු නිවසකට අප කැඳවාගෙන ආවේ ඇයි කියා මට දෙස් කියයි. දන් පිළි නො ගෙනම ආපසු යාවි. එනිසා බ්‍රාහ්මණයන් හා මා අතර විරසකයක් ඇති කරන්නට එපා. ඔබ කරන ඔය නමස්කාරය එදාටවත් නවතා ගන්නයි" බැමිණියට කිව්වා.

"ස්වාමිනි, ඔබ බ්‍රහ්මණයන් හා බිඳුණත්, දෙවියන් හා බිඳුණත් මටනම් ඒ භාග්‍යවතුන් වහන්සේ සිහි වුවහොත් උන්වහන්සේ ට නමස්කාර නො කොට සිටිය නො හැකියි" බැමිණිය කීවා.

"මිනිසුන් තමන්ට අයත් විශාල ඉඩම් පවා සොර සතුරන්ගෙන් බේරා ගැනීමට වැට බැඳ ආරක්ෂා කරනවා. ඇඟිලි දෙකකින් වසා ගන්න පුළුවන් නුඹගේ කට, හෙට බමුණන් දනය වළඳන වෙලාටවත් වසා ගත නො හැක්කේ ඇයි? කියා බමුණා යළිත් ගෝරණාඩු කළා.

එහෙත් එයට බැමිණිය අවනත කර ගත නොහැකි වුණා. එකල්හි බමුණා කිපී කඩුවක් අතට ගෙන "හෙට බමුණන් පැමිණ සිටින අවස්ථාවේ මහණුන්ට නමස්කාර කළොත් මේ කඩුවෙන් කෙසෙල් බඩක් කපන්නා සේ පාදයේ පටන් හිස දක්වා කපා දමනවා" යැයි තර්ජනය කළා. එහෙත් බැමිණිය බිය වුණේ නැහැ. "ආර්ය ශ්‍රාවිකාවෝ මහපොළොව සේ, මහමෙර සේ ස්ථිර අදහස් ඇති අයයි. කිසිම බලවේගයකට ඔවුන් වෙනස් කරන්න බැහැ" කියමින් ධනඤ්ජානි බැමිණිය බුදු ගුණ, සඟ ගුණ කැටි වුණ ගාථා පන්සියයක් කිව්වා. බැමිණියට කිසිවක් කිරීමට අපොහොසත් වූ බමුණා "ඔබ ගේ කැමැත්තක් කර ගනු" යනුවෙන් කඩුව වීසි කර යන්නට ගියා.

> මිනිසුන් තමන්ට අයත් විශාල ඉඩම් පවා සොර සතුරන්ගෙන් බේරා ගැනීමට වැට බැඳ ආරක්ෂා කරනවා. ඇඟිලි දෙකකින් වසා ගන්න පුළුවන් නුඹගේ කට හෙට බමුණන් දානය වළඳන වෙලාටවත් වසා ගත නොහැකි ඇයි?

පසුදින නිවස සරසා පිළිවෙළ කොට බමුණන් පන්සියයකට සෑහෙන අලුත් ගිතෙල්, පැණි, සකුරු ආදිය මිශ්‍රකොට ප්‍රණීත ආහාරයක් පිළියෙල කළා. ඊට පසුව බමුණන් නිවසට කැඳවා ගත්තා.

ධනඤ්ජානි බැමිණිය ද උදයෙන් ම අවදි ව පිරිසුදු වී සුවඳ පැනින් නා දහසක් අගනා අලුත් වතක් හැඳ පන්සියයක් අගනා වතක් පොරවා ස්වර්ණාභරණයෙන් සැරසී බමුණන්ට සංග්‍රහා කළා. එහිදි එක තැන තිබූ භාණ්ඩයක ඇගේ පය හැපී ඇයට බලවත් වේදනාවක් හට ගත්තා. ඒ වෙලාවේ ඇයට බුදුරජාණන් වහන්සේ සිහි වුණා. ඇය අත තිබුණ කෑම බඳුන බිම තබා, වේළුවන විහාරය දෙසට හැරී දෙහොත් මුදුන් තබා වැඳගෙන "නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" යි තෙ වරක් කිව්වා. ඇගේ ක්‍රියාවට පැමිණි සිටි බමුණන් ගේ හිසට පොල්ලකින් ගැසුවා වගේ වුණා.


"අන්‍ය ආගම් ඇති නිවෙස්වෙත යාමට නුසුදුසු අපවිත්‍ර ස්ථාන යි. භාරද්වාජ, නුඹ අප මිසදිටු නිවසකට ගෙන්වා ඇත්තේ ඇයි?" කියා ඔහුට දෙස් නගා බත් බෙදූ තැටි එතැන ම දමා කටට ගත් බත් කට පවා ඉවත ලා භාරද්වාජ බමුණාට බැණ වදිමින් බමුණන් නැගිට ගියා. භාරද්වාජ කිපී

"ඔබට මේ විපත නො කරන ලෙස මම කිව්වා නේද? ඒත් නුඹේ කට නවතා ගත්තේ නැහැ මේ විපත මට වුණේ ශ්‍රමණ ගෞතමයන් නිසයි. මම නුඹේ ශ්‍රමණ ගෞතමයන් වෙත ගොස් වාද කොට ඔහුටත් පාඩමක් උගන්වන්නම්" කියා භාරද්වාජ පිටත් වීමට සැරසුණා. එවිට බැමිණිය

"බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ හා වාද කිරීමට සමත් දෙවියන් සහිත, මරුන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්ණයන් සහිත සත්ත්ව ලෝකයෙහි කිසිවකු මම දකින්නේ නැහැ. බ්‍රාහ්මණය ඔබ කැමැති නම් උන්වහන්සේ මුණගැසී බලන්න" ඇය කිව්වා.

බමුණා තථාගතයන් වහන්සේට නිග්‍රහ කිරීම පිණිස යන අතරමඟ දීම උභතෝකෝටික ප්‍රශ්නයකත් ගොතා ගත්තා. පසුව ඔහු බුදුරදුන් වෙත ගොස් කෝපය සඟවා ගෙන පිළිසඳර කතා කොට ගොතාගෙන ආ ප්‍රශ්නය ඇසුවා. තථාගතයන් වහන්සේ කිසිදු පැකිළීමක් නැතිව එක පාරම ඔහුගේ උභතෝකෝටික ප්‍රශ්නය විසඳා දුන්නා. ඔහුගේ කෝපය සංසිඳුණා. පසුව භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්මය දේශනා කළා.

බ්‍රාහ්මණයාට ධර්මය අවබෝධ වුණා. ඔහු බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළා. තෙරුවන් සරණ ගොස් තථාගත ශාසනයේ පැවිද්ද ලබා උපසම්පදාව ද ලබා නොබෝ කලකින් සියලු සව් කෙලෙස් නසා අරහත්වයට පත්වුණා.



නයනා නිල්මිණී



බොදු ගීයක මිහිර

# නිවන සදාලන බුදුගුණ මහිමේ

**අඩවන් වූ දෙනෙතින් ගලනා**
**මෙත් මුදිතා කරුණා දහරා**
**තෙමා තෙමා හද ගලා ගලා යන**
**ලොවුතුරු ගුණ මහිමේ**
**මහ මෙවුනා උයනේ**
**සමාධි බුදු පිළිමේ**
**පිරී තිරී යන මහ වතුරක් සේ**
**ගලා හැලෙන සිහිලැල් ගඟුලක් සේ**
**ගිමන් නිවාලන මේ භව කතරේ**
**නිවන් සදාලන බුදු ගුණ මහිමේ**

හිත් පිත් නැති කළු ගලින් කුළුණුබර බුදු පිළිම නෙලූ කලාකරුවා ගේ විස්කම් විශිෂ්ඨ ය. ඒ සම්බුදු පිළිරුවේ සජීවී සම්භාවයට බොදු ගීතයෙන් සාධාරණයක් ඉටු කරන කලාකරුවා ගේ මෙහෙවර ද අගනේ ය. බොදු බැතිය දනවන ගීත රැසක් රචනා කළ ඔහු 'අඩවන් වූ දෙනෙතින් ගලනා' ගීතයට පද වැල් ගෙතූ අධිනීතිඥ ඩබ්. ඒ. අබේසිංහයන් ය. එයටම සරිලන ගායනයත්, සංගීතයත් සපයා ඇත්තේ ප්‍රතිභා පූර්ණ ගායන ශිල්පීආචාර්ය පණ්ඩිත් අමරදේවයන් ය. බොදු ගීතයට ඔහුගෙන් වූ නොනිමි මෙහෙවර සම්භාවනාවට ලක් කළ යුතුම ය. බුදු පිළිම නෙළන්නටත්, බොදු ගී ගයන්නටත්, ගී පද වැල් ලියන්නටත් කලාකරුවා පෝෂණය වූයේ බුදු දහමේ ආභාෂයෙනි.

**අඩවන් වූ දෙනෙතින් ගලනා**
**මෙත් මුදිතා කරුණා දහරා**
**තෙමා තෙමා හද ගලා ගලා යන**
**ලොවුතුරු ගුණ මහිමේ**
**මහ මෙවුනා උයනේ සමාධි බුදු පිළිමේ**

මහමෙවුනා උයනේ වැඩ සිටිනා සමාධි පිළිරුවේ අපූර්වත්වය ලොවම මවිත කරව යි. සම්බුදු පිළිරුවෙන් ගලා හැලෙනා මෙත් කරුණා, මුදිතා ගුණ දහරාව ඒ වෙතම නෙත් යොමන කාටත් පතුරුවන්නා සේ ය. ඒ අසම සම වූ කරුණාබර දසුන ජාති, ආගම්, කුල මල භේද වලින් තොර ය.එය සැදැහැති බෞද්ධයාගේ හදවතෙහි ඇඳි යාමට ගීතයේ ඇති ලයාන්විත ස්වභාවය සමත් වෙයි. ගීතයෙන් හදවතට දැනෙන රිද්ම රටාව 'තෙමා තෙමා හද ගලා ගලා' යන පැදි පෙළින් වඩාත් අර්ථාන්විත ය. මෙම බොදු ගීතය ගායනා කරන ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් ගේ ප්‍ර තිභා පූර්ණ කටහඬ, එයටම සරිලන සංගීතය , පද වැල් ඉටු කරන්නේ තුලාබර මෙහෙයකි. ගීතයෙන් මතුව ගලනා කරුණා රසයෙන් රසික සිතැදැහැන් ගත කිරීමට සමත් වෙයි. සසරේ අතරමං වූ අසරණ සත්ත්වයා ගේ වෙහෙස නිවාලන සම්බුදු පියාණන්ගේ අපරිමිත කරුණා ගුණ සාගරයමහා ගංගාවකින්පිරී ඉතිරී යන ජල කඳක් සේ දැනී යයි.'පිරී තිරී යන මහ වතුරක් සේ ගලා හැලෙන සිහිලැල් ගඟුලැක් සේ'යොදා ඇති උපමා භාවිතය කදිම ය. ශ්‍රාකවකයාගේ මනස බවුන් වඩන සමාධි පිළිරුවේ ඇති චිත්ත ඒකාග්‍රතාවය වෙත ඇදී යයි. රසිකයා ආනන්දයෙන් ප්‍රඥව කරා රැගෙන යන්නේ සුවිශේෂී ලෙස ය.එහි ඇති අසම සම සම්බුදු ගුණ මහිමයෙන් සසර කතරේ අසරණ වූ අපට ගිමන් නිවාලන මාවත පෙන්වා දෙයි . ඒ පරම පිවිතුරු වූ උත්තරීතර නිර්වාණ මාර්ගය යි.

**'ගිමන් නිවාලනමේ භව කතරේ**
**නිවන් සදාලන බුදු ගුණ මහිමේ'**

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

උදර පැවිදි දිවියක පියසටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරන්නේ පොලොන්නරුව සෝමවතී රාජමහා විහාරාධිපති මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ නියෝජ්‍ය වැඩබලන ලේඛකාධිකාරි ආචාර්ය පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ ය. උන්වහන්සේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අංශයේ ජ්‍යෙෂ්ඨ කථාකාචාර්ය හා වැඩබැලූ අංශාධිපති වශයෙන් ද කටයුතු කළහ.

# සම්බුද්ධ ශාසනය රැක ගැනීමේ වගකීම හා වගවීම



- **අපේ හාමුදුරුවනේ, ඔබ වහන්සේ ඉතාමත් කෙළිදෙළෙන් ගත කල ළමා කාලයේදී ම මහණදම් පිරීමට කටයුතු කළා. ඒ පිළිබඳ මතකය ආවර්ජනය කරනවා නම්,**

ඔව්. මම ඉබ්බාගමුව පාසලෙන් මූලික අධ්‍යාපනය ලබාගෙන නවවන ශ්‍රේණිය සමත් වෙලා මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් වුණා. ඒ වකවානුව වනවිට පහමුණේ ගුණානන්ද අනුනායක හාමුදුරුවන් වහන්සේ ධර්මරාජ විද්‍යාලයේ ආචාර්යවරයකු වශයෙන් සේවය කළා. 1967 දෙසැම්බර් 12 වනදා මල්වතු මහා විහාරයට පැමිණීමත් සමඟ අධ්‍යයන කටයුතු සඳහා සංඝරාජ පිරිවෙනට සම්බන්ධ වුණා. පොඩි හාමුදුරුවන් වහන්සේලා ආශ්‍රය කිරීමට ලැබීම බොහොම සතුට දනවන කාරණාවක් වගේම ඒ සියලු දෙනා අතර මම පන්තියේ පළමුවැනියා වීම තවත් සතුටට හේතුවක් වුණා. කුඩා සාමණේර හාමුදුරුවන් වහන්සේලා සමඟ නිතර සතුටින් කාලය ගත කිරීමට ලැබීම නිසාම පැවිදි වීමේ ආසාව නිරායාසයෙන්ම ඇති වුණා. ඒ අනුව සිරිමල්වත්තේ ආනන්ද අනු නායක හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් 1968 මැයි 08 වනදා මල්වතු මහා විහාරයේදී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වුණා. කුඩා සාමණේර නමක් විදිහට අනෙකුත් පොඩි හාමුදුරුවන් වහන්සේලා සමඟ සංඝ රාජ පිරිවෙනේම අධ්‍යාපන කටයුතුවල නිරත වුණ ඒ සාමණේර අවධිය සිහිපත් වන විට අදටත් විශාල සතුටක් ඇතිවනවා.

- **පිරිවෙන් අධ්‍යාපනයේදී වගේම උසස් අධ්‍යාපනය ලබන කාලයේදීත් ඔබ වහන්සේට අමතක නොවන රසමුසු අද්දැකීම් අත්විඳීමට ලැබුණේ කුමන ආකාරයෙන්ද?**

පාලි, සංස්කෘත බෞද්ධ සංස්කෘතිය සිංහල විෂයන් ඉතාම හොඳින් හැදෑරුවා. ඒ වගේම ප්‍රාචීන ප්‍රාරම්භ , ප්‍රාචීන මධ්‍යම, ප්‍රාචීන අවසාන විභාග වගේම උසස් පෙළ අධ්‍යයන කටයුතු සාර්ථකව කරගෙන 1975දී පේරාදෙණිය විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අවතීර්ණ වුණා. ප්‍රාචීන ප්‍රාරම්භ අධ්‍යයන කටයුතුවල නිරත වූ වකවානුවේ සගරජවත නම් කාව්‍ය සංග්‍රහය නැවත සංස්කරණයක් ලෙස මුද්‍රණය කිරීමට කටයුතු කළා වගේම ප්‍රාචීන මධ්‍යම අධ්‍යයන කාලසීමාව තුළ වෘත්තමාලා ග්‍රන්ථයට සන්නයක් රචනා කිරීමට කටයුතු කළා.

පිරිවෙන් අධ්‍යාපනය ලබන කාලයේදී ශිෂ්‍ය සමිතියේ ලේකම් වශයෙන් වසර තුනක් අඛණ්ඩව ඉතාමත් ක්‍රියාශීලීව කටයුතු කළා. පාලි, සංස්කෘත, වාග්විද්‍යාව වැනි විෂයන් තෝරාගෙන ඉතාමත් කැපවීමෙන් අධ්‍යයන කටයුතු වල නිරත වීම නිසා ඉහළ ලකුණු ලබා ගැනීමට අවස්ථාව උදාවීමෙන් ආර්යවංශ මහා නායක සිහිවටන ශිෂ්‍යත්වය ලබා ගැනීමට හැකි වුණා. වර්තමාන සමාජය තුළ ගිහි පැවිදි දෙපාර්ශ්වයම අන්තර්ජාලයට බොහෝ සේ හුරුවීම නිසා පොත පත කියවීමෙන් දුරස්වෙලා තිබෙන බව දක්නට ලැබෙනවා. ඒත් ඒ කාල වකවානුවේදී අප නිතරම පොත්පත් ආශ්‍රය කරගෙන අරමුණක් ඇතුව අධ්‍යාපන කටයුතු වල නිරත වීමෙන් ඉතාම පහසුවෙන් විභාග සමත්වීමේ හැකියාව ලැබුණා. ගෞරව උපාධිය සඳහා සංස්කෘත විෂයත් අනු විෂය සඳහා පාලි විෂයත් අධ්‍යයනය කළා. එය සමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයෙනුත් ඉන්දියාවේ පූනා විශ්ව විද්‍යාලයෙනුත් කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කිරීමට ආරාධනාව ලැබුණත් පේරාදෙණිය සංස්කෘත ආචාර්යවරයකු නොසිටි නිසා එම විශ්වවිද්‍යාලය තුළ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු ආරම්භ කළා. ඒ වකවානුව තුළ සංස්කෘත ඉගෙන ගැනීම සඳහා එකුදු ශිෂ්‍යයෙක්වත් නොසිටි තත්ත්වයක් පැවතුණා. ඒ කාලය වන විට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියටම සංස්කෘත විෂය සම්බන්ධ කථිකාචාර්යවරු දෙදෙනෙක් පමණයි සිටියේ. මම පළ කළ දැන්වීමකට අනුව පැමිණි ශිෂ්‍යයන් පස්දෙනෙකුගෙන් මූලිකව සංස්කෘත අධ්‍යයන අංශයේ අධ්‍යයන කටයුතු ආරම්භ කළා. පෙරවරු කාලයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත් පස්වරු කාලයේදී සංඝරාජ පිරිවෙනේත් ආචාර්යවරයකු වශයෙන් සේවය කිරීමට වගබලා ගත්තා.

- **ඔබ වහන්සේගේ පැවිදි ජීවිතය ගොඩනඟා ගැනීමට ගුරු හාමුදුරුවරුන්ගේ ආභාෂය කෙතරම් දුරට ඉවහල් වුණාද?**

සංඝරාජ පිරිවෙනේ පරිවේණාධිපති වශයෙන් කටයුතු කළ සිරිමල්වත්තේ ආනන්ද අනුනාහිමිපාණන් වහන්සේ සංස්කෘත , පාලි , සිංහල පිළිබඳ අග්‍රගණ්‍ය පඬිවරයෙක්. උන්වහන්සේ දේවනාගරී හෙවත් සංස්කෘත අක්ෂරයෙන් සමන්විත ග්‍රන්ථයම බලාගෙන සංස්කෘත ඉගැන්වූවා. අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළා පමණක් නෙවෙයි, ඊට පරිබාහිරව සියලුම කාරණාවන් ඉගැන්වීමට නිතරම කටයුතු කළා. මල්වතු විහාරය ආරම්භයේ සිට ඉතිහාස තොරතුරුත් චාරිත්‍ර වාරිත්‍ර අස්ගිරිය විහාරය ඇතුළු ශාසනික ඓතිහාසික තොරතුරුත් ඉගැන්වීමට කටයුතු කළ නිසා ඒ තොරතුරු දැන ගැනීමේ භික්ෂු ආකල්ප වඩාත් නිවැරදි ආකාරයට ගොඩනගා ගැනීමේ හැකියාව ලැබුණා. ඒ වගේම මල්වතු මහා විහාරයේ සියලු කාර්යයන් සඳහා සහභාගි කරවා ගැනීමට කටයුතු කළා. 1982දී නායක හාමුදුරුවන් විසින් කාරක සංඝ සභාවට පත්කර ගැනීමත් සමගම ඒ කාර්යභාරයත් විනය කර්ම ආදියත් සමිති සමාගම්වල කටයුතුත් ඉෂ්ට සිද්ධ කළා.

- **ඔබ වහන්සේ භික්ෂු ජීවිතය තුළ ලබාගත් අත්දැකීම් අනුව නූතන භික්ෂු පරපුරට ලබාදිය හැකි අවවාද මොනවාද?**

සරණංකර ස්වාමීන් වහන්සේ වැඩ සිටි කාලය වන විට උපසම්පද භික්ෂූන් වහන්සේලා එකනමක්වත් වැඩ නොසිටි කාලයක් .ඒ වගේම සිංහල අධ්‍යාපනයත් ඉතාමත් පහළ මට්ටමක පැවතුණා. ඒ අවස්ථාවේ සාරාර්ථ සංග්‍රහය රචනා කළ සංඝරාජ හිමියන් ඒ ග්‍රන්ථය 1705 දී රාජ්‍යත්වයට පත්වූ නරේන්ද්‍රසිංහ රජතුමාට පිළිගැන්වූවා. අපමණ සතුටට පත්ව සිටි රජතුමා සංඝරාජ හිමියන්ට අවශ්‍ය දෙයක් ලබාදීමට විමසීමේදී නම ගමවත් නිවැරදිව ලියාගන්නට බැරිව සිටින පිරිසට අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරන ලෙසට රජුගෙන් කළ ඉල්ලීම ඉතාමත් සතුටින් ඉෂ්ට කළා. ඒ වගේම එකම උපසම්පද භික්ෂූන්වහන්සේ නමක්වත් නොසිටීම හේතු කොටගෙන විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ රජවරුන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුව 1853 උපාලි හාමුදුරුවන් ඇතුළු තවත් ස්වාමීන් වහන්සේලා වැඩම කරවා ගැනීමට කටයුතු කළා. ඒ අනුව පොහොය සීමා, සංඝාවාස, වෙහෙර විහාර ඉදිකරමින් එදා උපසම්පද කරමින් ආරම්භ කළ, ශාසනය තමයි වර්තමානය දක්වා පවතින්නේ. සංඝරාජ හාමුදුරුවන් වහන්සේ සකස් කර තිබෙන කථිකාවක් අනුව බණ දහම්පොත් රචනා කළා. සියම්රටේ පරමධාර්මික රජතුමාගේ අනුදැනුම ඇතිව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් වැලිවිට සරණංකර හාමුදුරුවන් වහන්සේට ශ්‍රී ලංකාද්වීපය තුළ සංඝරාජ පදවියට පත්කිරීමටත් 1762 දී මල්වතු මහා විහාරයේ මහානායක පදවියට තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත හාමුදුරුවන් වහන්සේ පත්කිරීමටත්, අස්ගිරි මහා විහාරයේ මහානායක පදවියට උරුලෑවත්තේ ශ්‍රී ධම්මසිද්ධි හාමුදුරුවන් වහන්සේ පත්කිරීමටත් කටයුතු කළා. ඒ වගේම මල්වතු අස්ගිරි උභය මහා විහාරයේ උපසම්පදාව අඛණ්ඩ ව පවත්වා ඉගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළා. කාරක පදවි, නායක පදවි ආදිය රජතුමා මුල් වෙමින් ආරම්භ කර තිබූ දේවල් වශයෙන් එදා සිට වර්තමානය දක්වාම පවත්වාගෙන යාමට කටයුතු කරමින් සිටිනවා. ඒ චාරිත්‍ර වාරිත්‍ර සියල්ලම කුඩා කාලයේ සිටම මල්වතු මහා විහාර නායක හිමිපාණන් වහන්සේ පුරුදු පුහුණු කළා. නමුත් වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ වැරැද්ද නිසා එම කාරණා බොහෝදුරට අභාවයට පත්වෙමින් පවතිනවා. දුරකතනය, අන්තර්ජාලය වැනි තාක්ෂණය නිසා ගිහි පැවිදි සමාජය සම්පූර්ණයෙන් පිරිහීමට පවතින යුගයක් ඇතිවෙලා. මල්වතු අස්ගිරි උභය විහාරය ඇතුළු අමරපුර නිකාය , රාමඤ්ඤ නිකාය, මහානායක මාහිමිපාණන් වහන්සේලා රජයත් මූලික කරගෙන අනාගතය තුළ ශාසනය පවත්වාගෙන යාමට පවතින උවදුරු වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වෙනවා.

මල්වතු අස්ගිරි උභය මහා විහාරයේ එදා සිට වර්තමානය දක්වා පවතින කථිකාවත් සමඟ අනෙකුත් නිකායවල පවතින කථිකාවත් සම්බන්ධ කර ගනිමින් ශාසනය ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය කරුණු කාරණා සම්පාදනය කරමින් භික්ෂූන් වහන්සේලාට ශ්‍රද්ධාවත්, ප්‍රඥවත් ගොඩනැඟෙන ආකාරයට අධ්‍යාපනය ලබා දිය යුතුයි. ඒවගේම භික්ෂූන් වහන්සේ උපැවිදි වීමේ ප්‍රමාණයට අනුව එතරම් ප්‍රමාණයක පැවිදි වීමක් සිදුවන්නේ නැහැ. පැවිදි කිරීමට දරුවන් සොයා ගැනීම අපහසු කාරණාවක් නිසා එය පිළිබඳ අවධානය යොමුකළ යුතුයි. පැවිදි කරන දරුවන් වැඩි කාලයක පුහුණුවක් ලබාදෙමින් පැවිදි කළ යුතුයි. ශාසනය ඇති කිරීමට වඩා ශාසනය නැති කිරීමේ බලවේගයන් අප හමුවේ උදාවෙලා තියෙනවා. ඒනිසා මේවා පිළිබඳව මහානායක මා හිමිපාණන් වහන්සේලා මුල්කරගෙන රජයත් මැදිහත් කරගෙන නීති පද්ධතියක් ඇති කරමින් ශාසනයේ ඉදිරි පැවැත්ම සඳහා කටයුතු කරගෙන යා යුතුයි. ඉතිහාසය , ආගම, සිංහල වැනි විෂයන් ගිහි පැවිදි සමාජයෙහි හදවත් තුළට කාවදින ආකාරයේ අධ්‍යාපනයක් ගොඩනැඟිය යුතුයි.





- **අපේ හාමුදුරුවනේ අභියෝග හමුවේ ඔබ වහන්සේලා ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරනවා නම්,**

දේශීය අභියෝග මෙන්ම විදේශීය අභියෝග අප හමුවේ දක්නට ලැබෙනවා. එම අභියෝගයට මුහුණ දිය යුත්තේ අපේ ජනාධිපතිතුමා ඇතුළු රජයේ අවධානය පළමු කොට යොමුකරගෙන සාරධර්ම සහිත විනයානුකූල , ධර්මානුකූල ථේරවාදී භික්ෂු ආකල්පයන්ගෙන් පරිපූර්ණ පරපුරක් ගොඩ නගා ගැනීමටයි.

**හේමමාලා රන්දුනු**

**බොහෝ කලකට පෙර ජපානයේ විශාල නගරයක තරුණයෙක් වාසය කළේය. ඔහුට තමන්ගේ ජීවිතයේ හිස් බවක් හැඟුණි. ඔහු අභ්‍යන්තර සාමය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් හිස භූ ගා කඳුකර ප්‍රදේශයකට ගොස් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් වාසය කළේය.**

සෙන් කතා



මහාචාර්ය
**ඉත්තදෙමළියේ ඉන්දසර නා හිමි**

# නුවණැති මනස



අනලස්ව අවුරුදු දහයක් පමණ ඉගෙන ගැනීමෙන් පසුව වුවද භාවාත්මක හැඟීම් සමග කෙසේ ජීවත් විය යුතු ද යන්න අවබෝධ කර ගත නොහැකි වූ බව මේ භික්ෂූන් වහන්සේ තේරුම් ගත්හ. අනෙක් භික්ෂූන් සමග කථා කිරීමේ දී චීනයේ ජීවත් වන උසස් සෙන් ගුරුවරයෙකු පිළිබඳ ඔහුට අසන්නට ලැබුණි. ඔහු ළඟ ඉගෙන ගැනීමෙන් තමන්ගේ 'ආවසානක පරමාත්මය' අවබෝධ කර ගත හැකි යැයි භික්ෂුවට හැඟීමක් ඇති විය. තමන් සන්තක වූ ස්වල්පයක් වූ මාර්ගෝපකරණ මල්ලකට දමා ගෙන ජපන් මුහුද තරණය කොට දීර්ඝ වූ දුෂ්කර ගමන ශුෂ්ක වූ තැනිතලා මැදින් ආරම්භ කළහ.

දිනපතා පැය ගණනාවක් භික්ෂූන් වහන්සේ ඇවිද්දාහ. සන්ධ්‍යා කාලයේ බීමට පිරිසුදු ජලය තිබෙන බිම් පෙදෙසක නතර වූහ. මෙලෙස මාසයක් පමණ ගමන් කිරීමෙන් පසු ශක්ත්‍යායනය සහ ශුන්‍යය පිළිබඳ අමුතු හැඟීමක්, වේදනාවක් ඇති විය. විශේෂයෙන් උණුසුම් සහ වියළි එක් දවසක කෙළ වරක් නැතිව ඇවිද්ද නමුදු වතුර ටිකක් සොයා ගැනීමට නොහැකි විය. අවසානයේ සඳ නැති රාත්‍රිය ලංවත්ම ක්ෂේම භූමියක් සොයා ගැනීමට සමත් විය. අතිශයින්ම වෙහෙසට පත්ව සිටි භික්ෂූන් වහන්සේ පොළොව මත ඇද වැටුණාහ. අඳුරේම එහෙ මෙහෙ පෙරළෙමින් ජීවත්වීම සඳහා වතුර පොදක් සොයන්නට වෙහෙස විය. කෙනෙකු විසින් තබා යන ලද කුඩා කළයක් භික්ෂූන් වහන්සේ ට හමු විය. එලෙස තබා යන කළයේ ඊළඟට එන අය වෙනුවෙන් ජලය ඉතිරි කර යාම පොදු සිරිතකි. එහි තිබූ ස්වල්ප වූ ජලය භික්ෂූන් වහන්සේ රස කර කර ටික ටික පානය කළහ. ලෝකයේ ආශිර්වාදය සහ සාමය භික්ෂූන් වහන්සේ ට දැනුණි. භික්ෂූන් වහන්සේ බිම දිගා වී ඊළඟ දිනයේ හිරු නගින තෙක් සුවබර නින්දකට වැටුණාහ.

නින්දෙන් ඇහැරුණු භික්ෂූන් වහන්සේ කලින් දින රාත්‍රියේ ජලය පානය කළ පොඩි කළය දුටුවහ. ඇත්තටම එය මිනිසෙකු විසින් සාදන ලද කළයක් නොව වෘක පැටියෙකුගේ කුඩු වූ හිස් කබලකි. ලේ කැටිතිවලින් තෙත් වූ හිස් කබලෙහි ඇතුළත විශාල ප්‍රමාණයක් කුඹින් ගැවසී ලේ කැටිති අදිමින් සිටිති. භික්ෂුව මේ සියල්ල දැක පිළිකුල ඇති වී වමනය කරන්නට පටන් ගත්තාහ. කටට වත්කර ගත් දියරය නිසා ඇති වූ ඔක්කාරය භික්ෂූන් වහන්සේ මැඩපවත්වා ගත්හ. භික්ෂූන් වහන්සේ ගේ නුවණැති මනස ශරීරය සහ චිත්තවේග මැඩපැවැත්වීම පැහැදිලිවම අත්දකින ලදි. භික්ෂූන් වහන්සේ ගේ නුවණැති මනස සම්පූර්ණ ජීවිතයම මැඩපවත්වන ලද බවට එකඟ වීම හැර වෙන කිසිවක් ඉතිරිව නැත.

කලින්දින රාත්‍රියේ රස කර කර බිව් අවස්ථාවේ භික්ෂූන් වහන්සේ ට දැනුණේ අලුත් සහ පිරිසුදු වතුර ලෙසට යි. එය අවස්ථානුකූලව භික්ෂූන් වහන්සේ ට හගවනු ලැබූ වැරැදි අවබෝධය යි. ඉර උදාවත් සමඟ දුටු හිස් කබල සහ කුහුඹුවන් භික්ෂූන් වහන්සේ ට ඔක්කාරය ගෙනදුන් දුර්ගන්ධ වතුර නොව භික්ෂූන් වහන්සේ ගේ අතීත ක්‍රියාවන් වේ.


හරිහැටි තේරුම් ගැනීම හෝ වැරැදියට තේරුම් ගැනීම නොසලකා භික්ෂූන් වහන්සේ ට ඒ තත්වය ඇති කළේ කෙලෙසදැ'යි විමසා බැලුවහොත් තමන්ගේම කල්පනාකාරී මනස යයි පෙනෙයි. මෙය භික්ෂූන් වහන්සේට එක්වරම පැහැදිලි විය. චින්තනය දුක ඇති කිරීමට හේතු වෙනවා වාගේම චින්තනය සිතෙහි සාමය ඇති කිරීමට ද හේතු වෙයි. අතීතයේ කුමක් කළේ නමුදු වර්තමානයේ දක්වන ප්‍රතිචාරයට වඩා එය අඩු වටිනාකමක් ඇති බව භික්ෂූන් වහන්සේ අවබෝධ කර ගත්හ.

මෙය අවබෝධ කර ගැනීමත් සමගම භික්ෂූන් වහන්සේ ගේ ගමන නිමා කළේය. මෙය අවබෝධ කර ගැනීමත් සමග ආපසු පැමිණ භාවාත්මක හැඟීම් සමග ජීවත් වූහ.

**ආදර්ශය :**
**ඔබ කල්පනා කරන ආකාරයටයි ඔබ දුකට යොමු කරනුයේ.**

# යහළුවන්ගෙන් පිදුම් ලැබූ වටු පණ්ඩිතයා

**ලාමක ගති පැවතුම් ඇති මිනිසුන් අතින් යුතුකම් ඉටු නොවෙයි. බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ ෂඩ්වර්ගික භික්ෂූන් වහන්සේලා පිරිසක් සැරියුත් මහ තෙරුන්ට සෙනසුන් වැළැක්වීම නිසා රාත්‍රිය පුරාම ගසක් මුල වැඩ සිටීමට සිදු වුණ කතා ප්‍රවෘතියක් අසන්ට ලැබුණා.**



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**



ඒ වන විට අප තථාගතයන් වහන්සේ වැඩ සිටියේ රජගහ නුවර. ඔය කාලයේදී ම ශාසනය කෙරෙහි හිත් පහදවා ගත් අනේපිඩු සිටුතුමා සැවැත් නුවර ජේතවන නම් විහාරයක් කරවා සාසනයට පුජා කිරීමේ අදහසින් බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට දූතයන් යැව්වා. ඒ ආරාධනාව පිළිගත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ද සමඟින් රජගහ නුවරින් පිටත් ව විශාලා මහ නුවරට පැමිණ කැමති පරිද්දෙන් එහි වාසය කොට සැවත් නුවර බලා වැඩම කිරීමට ගමන් ඇරඹුවා. උන් වහන්සේලා අතර සිටි ෂඩ්වර්ගික භික්ෂූන් වහන්සේලාගේ අතවැසි භික්ෂූන් අන් අයට ප්‍රථමයෙන් විහාරයට ගොස් වැඩිමහලු වූ ස්ථවිරයන් වහන්සේලාට සේනාසන (නවාතැන්) වෙන් කිරීමටත් ප්‍රථමව

"මේ සේනාසන අපගේ උපාධ්‍යන් වහන්සේටය, මේ සේනාසනය අපගේ ආචාරීන් වහන්සේටය, මේ සෙනසුන් අපට ම" යැයි කියමින් තම තමන්ට අදාළව සේනාසන වෙන් කර ගත්තා. පසුව පැමිණි උතුමන් වහන්සේලාට සෙනසුන් තිබුණේ නැහැ. මේ අතර සැරියුත් මහ තෙරුන් වහන්සේගේ අතවැසි භික්ෂූන් වහන්සේලා ද පැමිණ සෙනසුන් සෙවුවා. එහෙත් එකදු සේනාසනයක්වත් තිබුණේ නැහැ. සැරියුත් මහතෙරුන් වහන්සේ රාත්‍රිය නවාතැන් ගැනීමට සේනාසනයක් නොලබා තථාගතයන් වහන්සේගේ ගන්ධ කුටිය සමීපයේ ගසක් මුල වැඩ හිඳිමින් ද විටෙක සක්මන් කරමින් ද කල් යැවුවා. බුදුරජාණන් වහන්සේ අලුයම් වේලේ පිටතට පැමිණ උගුර පැදුවා. ඒ හඬ ඇසූ සැරියුත් මහ තෙරුන් ද උගුර පැදුවා. අවේලාවේ මෙතැන කවුරුන්දැ යි විපරම් කළ භාග්‍යවතුන් වහන්සේට ඒ සැරියුත් මහ රහතන් වහන්සේ බවත්, උන් වහන්සේ රාත්‍රිය ගෙවූ ආකාරයත් දැන ගන්නට ලැබුණා. පසුව උන් වහන්සේගේ බස් අසා ධර්ම සංවේගය උපදවාගෙන. " දැන් වනාහි මා ඉන්නා විටදීම ෂඩ්වර්ගික භික්ෂූන් වහන්සෙලා මෙසේ වැඩිහිටියන් නොසලකා හරින්නේ නම් මා පිරිනිවන් පෑ කල්හී මොනවා නොකරයි ද යනුවෙන් සිතා පසුදා සියලූ භික්ෂූන් වහන්සේ දම් සභාවට කැඳවා මේ පුවත පිළිබඳව විමසුවා.

" මහණෙනි, ෂඩ්වර්ගික භික්ෂූන් මුලින් විහාරයට පැමිණ

ස්ථවිරයන් වහන්සේලාගේ සෙනසුන් වැළකුවෝ ද ?"

"භාග්‍යවතුන් වහන්ස , එය සැබෑව ..."

යනුවෙන් පිළිතුරු දුන්නා. ඉක්බිතිව ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හා කොට දහම් දේශනාව වදාරා, කවරෙකු හට අග්‍ර පිණ්ඩය (ආහාරය ) අග්‍ර ආසන, අග්‍ර උදක ආදිය ලැබීමට සුදුසු වේද ? කවරෙක් අන් අයගේ ගෞරවයට ලක් විය යුතු ද ? කවරෙක් වැඳීම්, පිදීම්, සැලකීම් ලැබීමට සුදුසු වේද ? යනුවෙන් විචාලා. සමහරෙක් ක්ෂත්‍රිය කුලයේ, බ්‍රාහ්මණ කුලයේ, ගහපති කුලයෙන් ආදි පැවිදි උතුමන්ට යැයි කීවා. සමහරෙක් විනයධර, ධර්මධර වූ පැවිදි උතුමන් වහන්සේලා යැයි කීවා. තවත් අය ධ්‍යානලාභීන් සහ පිළිවෙලින් මාර්ග ඵල ලාභී උතුමන්ට යැයි කීවා. මෙසේ තම තමාගේ අභිප්‍රායන් වශයෙන් එම භික්ෂූන් ද විවිධ පිළිතුරු දෙමින් මේ මේ අය සුදුසු බව පෙන්වා දුන්නා. ඒ සියලූ දෙනාම ප්‍රතික්ෂේප කළ බුදු රජාණන් වහන්සේ " මහණෙනි , මේ ශාසනයෙහි පටි පාටිය (පිළිවෙල) වූ පරිද්දෙන් ම වැඳීම ද, හුනස්නෙන් නැගිටීම් ආදි ලැබීම් සහ ගෞරවයන් ලැබිය යුතු වෙයි. "" දැන් ද වනාහි මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මාගේ ශාසනයේ අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ යි. උන් වහන්සේ මා අනුව ධර්ම චක්‍රය පවත්වනවා. මට පසුව සෙනසුන් ආදි සැලකුම් ලබන්නට සුදුසු වෙනවා. ඒ නමුත් ශාරිපුත්‍ර අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ මේ රාත්‍රිය පුරාම සේනාසනයක් නොලැබ වෘක්ෂ මූලයක වැඩ සිටියා. මහණෙනි, නුබලා දැන්ම ඉදන් මෙසේ ආදර ගෞරව නැතිව වෙසෙත් නම් කල් යත් යත් කුමක් නොකරයි ද ? මහණෙනි, පෙර තිරිසන්ගත සතුන් ද එකට වාසය කරන විට එකිනෙකාට ගරු නොකොට වාසය කිරීම සුදුසු නොවන බව දැන කතිකාවක් කර වැඩි මහලු තැනැත්තා තෝරගෙන ඔහුට වැඳීම් ආදි ඇප උපස්ථාන කරමින් දිව්‍ය ලෝක ප්‍රාර්ථනා කළා යැයි දේශනා කරමින් අතීත කතාව ගෙනහැර දක්වා වදළා.

යට ගිය දවස හිමාල වනයේ එක් මහා නුග ගසක් තිබුණා. මේ ගස ඇසුරු කරගෙන තිත්තරය (වටුවා ) , වානරයා සහ හස්තියා කියලා යහළුවෝ තුන් දෙනෙක් වාසය කළා. මොවුන් අතරෙ වැඳීම්, ගෞරව කිරීම් ආදි ගරු කටයුතු සැලකීම් තිබුණේ නැහැ. එහෙත් බොහෝ සමගියෙන් තමයි ජීවත් වුණේ. දිනක් මේ තුන්දෙනා විවේකීව කතා කරමින් ඉන්න අතරේ මෙබඳු සිතක් පහළ වුණා. " අප අතරෙන් කවුරුන් හෝ කෙනෙක් මහලු නම් ඕ හට වන්දනාමාන කරමින් උපස්ථාන කරමින් අවවාද අනුශාසනා ලබමින් ජීවත්වීම සුදුසුයි" කියලා.

අනතුරුව මේ තුන් දෙනාම වැඩිහිටියා තෝරා ගැනීමට උපායක් සිතන්නේ මේ නුග ගසම මූලික කරගෙන වෘද්ධ කෙනා තෝරමු යැයි කියා නුග ගසේ ඉතිහාසය ගැන විමසුවා.

මුලින්ම වටුවා සහ වානරයා යන දෙදෙනා එකුව හස්තියාගෙන් "යහළුව, මේ නුග ගස කවර කාලයක පටන් ඔබ දන්නව ද " කියා විමසුවා. " මම මෙතනින් යන කල්හි මේ නුග ගස ලා පැළ කාලයේ මගේ නාභියේ ගැවුනා. ඉතින් එතැන් පටන් මම මේ ගස ගැන දන්නවා " කියලා හස්තියා පිළිතුරු දුන්නා.

නැවතත් වටුවා සහ හස්තියා එකතුව වානරයාගෙන් මෙහෙම ඇසුවා. " යහළුවේ කවරදා සිට මේ ගස ගැන ඔබ දන්නවද? " " යහළුවෙනි, මම වානර පැටවා කාලයේ බිම හිඳගෙන හිස ඔසවන්නේ නැතුව නුග පැළැටියේ දල්ල කෑවා. එතැන් පටන් මම මේ ගස ගැන දන්නවා " කියලා වානරයා පිළිතුරු දුන්නා.

අනතුරුව පෙර පරිද්දෙන් ම වානරය යි හස්තිය යි දෙදෙනා තිත්තර පණ්ඩිතයන්ගෙන් ද එම පැනයම ඇසුවා. තිත්තර පණ්ඩිතයෝ පිළිතුරු දෙමින් "යහළුවනේ, පෙර වනයේ ඈත මෙවැනිම මහා නුග ගසක් තිබුණා. මම ඒ ගසෙන් ගෙඩියක් අනුභව කොට මෙතනින් යන අතර වර්චස් පිඩක් හෙලූවා. එයින් මේ නුග වෘක්ෂය හටගත්තා. යහළුවෙනි, මේ නුග පැළය හටගත් දා පටන් මම මේ ගස හඳුනනවා. එසේ හෙයින් මම නුඹලාට වඩා වයසින් වෘද්ධ වනවා. " වටු පණ්ඩිතයන් වහන්සේ කීවා.

එවිට බොහෝම ගරු සරු ඇතුව වානරයාත් හස්තියාත් කියනවා " තිත්තර පණ්ඩිතයෙනි, නුඹ වහන්සේ අපට වඩා වැඩි මහලූයි. ඒ නිසා අප අද පටන් නුඹ වහන්සේට ඇප උපස්ථාන මෙන් ම ගෞරව සම්මාන දක්වමින් නුඹ වහන්සේගේ අවවාදයෙහි සිට කටයුතු කරනවා. අපට අවවාද අනුශාසනා දෙන්න" යැයි කීවා.


එදවස් පටන් තිත්තර පණ්ඩිතයෝත් ඔවුන්ට අවවාද අනුශාසනා දුන්නා. තමනුත් පංචශීලයෙහි පිහිටා, තම යහළුවනුත් පංච ශීලය සමාදන් කරවා ධාර්මිකව ජීවත් වුණා. ඔවු නොවුන් ගෞරව ඇතිව ජීවත් වී කෙළවර මරණින් පසු දිව්‍ය ලෝකයෙහි උපන්නා. "මහණෙනි, තිරිසන් සතුන් පවා ඔවුනොවුන් ගෞරව ආදර ඇතිව ජීවත් වෙනවා. නුඹලා මෙසේ යහපත් ලෙස දෙසන ලද දහම් ඇති මගේ ශාසනයේ පැවිදිව කුමක් නිසා ඔවුනොවුන් ආදර ගෞරව නැතිව වාසය කරයි ද ?"

"මහණෙනි මෙතැන් පටන් සඟ මහලූ පිළිවෙළින් වැඳීම්, හුනස්නෙන් නැගිටීම්, පිළිවෙළින් අග්‍ර ආසන , උදක, පිණ්ඩය ආදිය ද ලබාදිය යුතුය. මෙසේ ආදර ගෞරව දක්වමින් වැඩිහිටියන්ට සැලකීමෙන් මෙලොව දී ප්‍රශංසාවටත් මරණින් මතු ස්වර්ගලෝකයන් හි උත්පත්තියත් වන බව වදාරා, දහම් දේශනා කොට පූර්වාපර සන්ධි ගළපා වදාළා. මහණෙනි, එකල හස්තියා නම් දැන් මුගලන් තෙරුන් ය. වඳුරා නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයන් ය. තිත්තර පණ්ඩිතව උපන්නේ මම් ම නොවේ දැ යි කියා ජාතක කතාව නිමවා වදාළ සේක.

පූජා ච පූජනීයානං

# කඹුරුගමුවේ ගුණරතන හිමි

**ශාස්ත්‍රපති කඹුරුගමුවේ ගුණරතන හිමිපාණන් වහන්සේ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායික සංඝ සභාව මඟින් ශ්‍රී ධර්ම රක්ෂිත වංශාලංකාර යන ගරු නාම සම්මුතියෙන් පුද ලද ධර්ම විනයධර යතිවරයාණ කෙනෙකි.**



මාතර දිස්ත්‍රික්කයේ කඹුරුගමුව නම් ගම්පියසෙහි දී 1957 අප්‍රේල් 24 දින ජන්ම ලාභය ලද උන්වහන්සේ මාර / කඹුරුගමුව මහ විදුහලින් මූලික අධ්‍යාපනය ලබන තෙලෙස් හැවිරිදි කුමරකු ව සිටියදී පූර්වකෘත පුණ්‍ය බලයෙන් මෙහෙයවන ලදුව 1970 ජූලි 10 දින තල් අරඹ ශ්‍රී මහේන්ද්‍රාරාමයෙහි දී සම්බුදු සසුන්ගත වූහ. තත්විහාරාධිපති කඹුරුගමුවේ සිරිජිනරතන හිමිපාණන් වහන්සේ හා වැලිගම ශ්‍රී විජයාරාමාධිපති පණ්ඩිත තල්අරඹේ සිරිපියරතනාභිධාන අධිකරණ සංඝ නායක හිමිපාණන් වහන්සේ උන්වහන්සේට ආචාර්යත්වයෙන් අනුග්‍රහය දැක්වූහ. විනයාචාර්ය කපුගම සුමනවංස නාහිමිපාණන් වහන්සේ උපාධ්‍යායත්වයෙහි පිහිටියහ. උන්වහන්සේ වැලිගම සෝමානන්ද පිරිවෙන, රත්මලානේ මල්ලිකාරාමස්ථ ශ්‍රී ධර්මරක්ෂිත ධර්මායතන පිරිවෙන හා කොළඹ හුණුපිටියේ ගංගාරාමස්ථ ශ්‍රී ඥානෙශ්වර පිරිවෙන යන විද්‍යායතනයන්හි ධර්ම විනය ශබ්ද ශාස්ත්‍ර හැදෑරීමෙහි භාග්‍යය අත්විය.

ශාසනික යෝග්‍යතා සපුරාගෙන උන්වහන්සේ 1977 මැයි 22 දින වැලිගම පැළෑන ගංගාරාමාසන්න උදකුක්ඛේප සීමා මාලකයේ දී උපසම්පත්තියෙහි පිහිටියහ. එහිදී උන්වහන්සේගේ උපාධ්‍යායත්වයට පත් වූවාහු ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අග්ගමහා පණ්ඩිත මඩිහේ සිරි පඤ්ඤාසීහ මහ නාහිමිපාණන් වහන්සේයි.

උන්වහන්සේ 1978 දී අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයට ඇතුළත් ව පස් අවුරුදු පාඨමාලාව හදාරමින් ත්‍රිපිටකවේදී උපාධිය ලබා ගත්හ. 1982 දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව බෞද්ධ දර්ශනය පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේදී උපාධියත් 1990 දී කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයෙන් ශාස්ත්‍රපති උපාධියත් උන්වහන්සේට හිමි වී තිබේ. මේ හැර එම වසරෙහි ම ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් ජනසන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හා 1998 දී ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකය හිමි කර ගැනීමේ භාග්‍යය ද, උන්වහන්සේට අත් විය. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සමිතියෙන් පවත්වනු ලබන ත්‍රිපිටකධර්ම පරීක්ෂණයට පෙනී සිටීමෙන් විනයාචාර්ය හා සද්ධර්මාචාර්ය යන සහතික හිමිකර ගැනීමට ද උන්වහන්සේ සමත් වූහ.

තමන් අත්කරගත් අධ්‍යාපන කුසලතා සිසු පරපුරේ ගුණ නැණ වර්ධනය සඳහා උපයෝගී කිරීමෙහි කැප වී සිටින ගුණරතන හිමිපාණෝ පාරිවේණික අධ්‍යාපනයට මෙන්ම පාඨශාලීය අධ්‍යාපනයට ද මහඟු සේවයක් සැලසූ යතිවරයාණ කෙනෙකි. මාතර ජයසුමන මූලික පිරිවෙනහි හා මාතර මහාමන්තින්ද පිරිවෙනෙහි ගිහි පැවිදි සිසුන් උදෙසා ධර්ම ශාස්ත්‍ර දනයෙහි නියැළෙමින් ඔවුන්ගේ ජීවිත සාඵල්‍යයට උපස්ථම්භක වූ උන්වහන්සේ 1990 සිට මේ වන තෙක් මාර / තල් අරඹ ශ්‍රී ඉන්දසාර මහ විදුහලේ ධර්මාචාර්ය තනතුරෙහි සේවයෙහි නිරත වී සිටිති.

ස්වකීයාචාර්ය පාදයන් වහන්සේ අපවත් වීමෙන් පසු 1984 දී මාතර තල් අරඹේ ශ්‍රී මහේන්ද්‍රාරාමයෙහි ආධිපත්‍යයට පත් උන්වහන්සේ විහාරස්ථානය කේන්ද්‍රකොටගෙන ප්‍රදේශයේ ආගමික හා සාමාජික සේවා කටයුතු උදෙසා සිය අනුග්‍රහය දැක්වීමට සමත්ව සිටිති. විහාරස්ථානයෙහි උන්වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද ආයතන කිහිපයක් ඔස්සේ මෙම සේවා කටයුතු ව්‍යාප්ත වී තිබේ. සිරිමිහිඳු පෙර පාසල, ශ්‍රී මහේන්ද්‍ර ධර්ම විද්‍යාලය, ශ්‍රී මහේන්ද්‍ර මූලික පිරිවෙන හා මධුරංග කලායතනය ආරම්භ කොට ඒවා මඟින් මහඟු සේවයක් සැලසීමේ ගෞරවය උන්වහන්සේට හිමි වෙයි. ශ්‍රී මහේන්ද්‍රාරාම දායක සභාව, සංඝ මිත්තා කුලඟන සමිතිය, තල් අරඹ ග්‍රාමීය සංවර්ධන පදනම, සිරිමිහිඳු ළමා සමාජය හා ශ්‍රී මහේන්ද්‍ර ධර්මවිජය සමාජය පිහිටුවා එමඟින් ද සමාජ අනුග්‍රහයක යෙදීමට උන්වහන්සේ සමත් වී සිටිති. ජනප්‍රිය ධර්මකථිකයාණ කෙනකු ලෙස ජනාදරය දිනූ ශ්‍රී මහේන්ද්‍රවංශාලංකාර ධර්ම කීර්ති ශ්‍රී තල්අරඹේ ඉන්දසාර නාහිමියන්ගේ නිවාස ග්‍රහණයෙන් සම්මානයට පත් වූ ශ්‍රී මහෙන්ද්‍රාරාමයෙහි සංවර්ධන කටයුතු සඳහා ද නියාමකත්වය සපයන පූජ්‍ය කඹුරුගමුවේ ගුණරතන හිමිපාණන් වහන්සේ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකාය මගින් එහි කාරක සංඝ සභික තනතුර සහිත ව ශ්‍රී ධර්මරක්ෂිත වංශාලංකාර යන ගරුනාම සම්මුතියෙන් ද, කොරියානු බෞද්ධ ආයතනය මඟින් බෞද්ධ දර්ශන විශාරද (සම්මාන ආචාර්ය) උපාධියෙන් හා රජය මඟින් පිරිනමන ලද සමස්ත ලංකා සාමවිනිසුරු පදවියෙන් ද සම්මානිත වූ උද්‍යොගිමත් යතිවරයාණ කෙනෙකි.

කඹුරුගමුවේ ගුණරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ සසුන් කෙත තව තවත් අස්වද්දලමින් දීර්ඝ කාලයක් නිදුක් නිරෝගී ව වැජඹේවා.

තල්අරඹේ
එල්.එච්. හරිස්චන්ද්‍ර

# යාලගමුවේ ධම්මිස්සර හිමි

**බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම යාලගමුව ග්‍රාමයේ ඉපිද, දිඹුලන පුරාණ රාජමහා විහාරයේ දී සසුන් ගතවන මෙම මහා පඬිරුවන යාලගමුවේ ධම්මිස්සර හිමිපාණන් වහන්සේ ය.**

ධම්මිස්සර හිමිපාණන් වහන්සේ 1983 දී විද්‍යෝදය පිරිවෙනේ රාජකීය පණ්ඩිත උපාධිය අවසන් කර, ඉන් අනතුරුව එම පිරිවෙනේ ම ආචාර්යවරයෙක් ලෙස කටයුතු කරමින් පේරාදෙණිය සරසවියේ ශාස්ත්‍රවේදී උපාධිය වෙත යොමු වූහ. එකල රටේ පවතින අයහපත් දේශපාලන පසුබිම නිසා උපාධිය අවසන් කිරීමට වසර හයක් පමණ ගතවන නමුත් එය අවසන් කොට 1989 දී මහායාන දර්ශනය අධ්‍යයනය කිරීමේ බලාපොරොත්තුවෙන් ජපානයට වැඩම කරනු ලබයි. උපාධි අධ්‍යයනය කිරීමේ බලාපොරොත්තුවෙන් ජපානයට පැමිණිය ද, ආර්ථික අපහසුකම් නිසා බාහිර අධ්‍යයන ශිෂ්‍යයෙකු ලෙස (Taisho University) ඇතුලු විය.

ශ්‍රී ලංකාවේ පන්සල ටෝකියෝ නගරයේ සිට ඉතා ඈතින් පිහිටීම නිසා ජපානයේ සිටින ලාංකිකයන් බොහෝ දෙනෙකුට තමන් ගේ ආගමික කටයුතු සිදුකර ගැනීමට මහත් දුෂ්කරතාවයකට මුහුණපෑමට සිදුව තිබිණ. මෙම කාරණාව අවබෝධ කරගත් අපේ ස්වාමීන් වහන්සේ, ටෝකියෝ නගරය ආශ්‍රිත පන්සලක් ආරම්භ කිරීමට කටයුතු කළහ. මහායාන විහාරස්ථානයේ ආචාර්ය, ෂොමෙයි (මසකි) අශිකගා(Rev. Dr. Somei (Maski) Ashikaga) නා හිමියන් විසින් එම විහාරස්ථානයේ ම වෙනත් යාබද ගොඩනැගිල්ලක අලුතින් ථෙරවාද විහාරස්ථානයක් ආරම්භ කිරීමට ආරාධනා කළහ.



ටෝකියෝ බෞද්ධ ජනතාව, ජපන්, බංගලිදේශ, වියට්නාම් ආදී විවිධ ථේරවාදී බෞද්ධ රටවල පින්වතුන් ගේ පුදබිමක් බවට පත්ව ඇති සකමුනි ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය (Sakamuni International Buddhist Center, URL:http://www.sakamuni.org) ජපානයේ මුල්වරට සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් සංවිධානය කර, එය මේ දක්වා අඛණ්ඩ ව පවත්වා ගනිමින් වාර්ෂිකව පවත්වනු ලබන වෙසක්, පොසොන්, කඨිණ පින්කම් මාලවන් ඉතා අලංකාරවත් අයුරින් සංවිධානය කිරීමට උන්වහන්සේ කටයුතු කරයි.

ජපානයේ උතුරු දෙසින් පිහිටා ඇති ග්‍රාමීය නීගතා(Niigata-ken) ප්‍රදේශයේද නව ශාඛාවක් ආරම්භ කරමින් විශාල ශාසනික මෙහෙවරක නිරතවෙමින් සිටිති. මෙම අද්විතීය ශාසනික මෙහෙවර වෙනුවෙන් උඩරට අමරපුර මහා නිකායේ නොමඳ සහයෝගය ලබන ධම්මිස්සර හිමියන්, ජපානයේ ප්‍රධාන සංඝ නායක තනතුර මෙන්ම එම නිකායේ අනු නායක තනතුරින් ද පිදුම් ලැබී ය.

ජපානයේ සේවාවෙන් පමණක් සෑහීමට පත් නොවන, යාලගමුවේ ධම්මිස්සර හිමියන් අතින් ශ්‍රී ලංකාවේ ශාසන අභිවෘද්ධිය ද අතිමහත් ය.

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ නගරයට ආසන්නයේ පිහිටි ඌව පරණගම දිඹුලන රාජමහා විහාරයේ විහාරධිපති ධුරය මෙන්ම ඌව පරණගම පිහිටි ශ්‍රී ධම්මනන් ද විද්‍යායතන පිරිවෙන සහ ශ්‍රී ධම්මිස්සර මූලික පිරිවෙනෙහි කෘත්‍යාධිකාරි තනතුර හොබවන ධම්මිස්සර හිමිපාණන් ජාත්‍යන්තර ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා භික්ෂූන් වනන්සේලා පුහුණු කරවන භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ඇරැඹීමට මූලික කටයුතු සම්පාදනය කරමින් සිටිති. එමෙන්ම පාලි බෞද්ධ සරසවියේ (The Buddhist and Pali University of Sri Lanka) ශාඛාවක් ජපානයේ ආරම්භ කිරීමටද මහත් වෙහෙසක් ගනිමින් කටයුතු කිරීම ශ්‍රී ලාංකික මෙන්ම බොහෝ ජපන් ජාතිකයින් ගේ ද නොමද පැසසුමට ලක්ව තිබේ.

ජුලි මස 19 වෙනි ඉරුදින සිය 60වන ජන්ම දිනය නිමිත්තෙන් උන්වහන්සේගේ ශාසනික කටයුතු පවත්වාගෙන යාම සඳහාත් දීර්ඝායුෂ සම්පත්තිය පතා ආසිරි පැතීමට විශේෂ ආශිර්වාද පූජා මාලවක් පැවැත්විණි.

උන්වහන්සේට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ලැබේවා.

ප්‍රභාත් සමීන්ද්‍ර වීරවර්ධන

# තිරුනල්වේලි බෝධිධම්ම හිමිගේ පැවිදි ජීවිතයට වසර දහනමයක් සපිරේ



රත්මලාව විමලාරාමය විහාරවාසී ඉන්දියාවේ තිරුනල්වේලි බෝධිධම්ම හිමියන් පැවිදි වී අවුරුදු 19 ක් පිරීම නිමිත්තෙන් රත්මලාන විහාරස්ථානයේ ජූලි මස 19 වනදා ඉරිදා දින මහා සංඝ රත්නයට හීල් දානමය පූජාවක් සහ එදින පස්වරු 6.00 ට රත්මලාන විමලාරාම විහාරාධිපති අත්තුඩාවේ පියරතන නා හිමියන් ගේ ප්‍රධානත්වයෙන් ගිලන්පස බුද්ධ පූජාවක් ද පැවැත්වුණි.

# සේරුවාවිල මංගල රජමහා විහාරය වන්දනාවට අවසර

කොවිඩ් – 19 වසංගත තත්ත්වය ක්‍රමයෙන් පහව යන බැවින් ඓතිහාසික සේරුවාවිල මංගල රජමහා විහාරස්ථානය වැඳ පුදා ගැනීමට පැමිණෙන ලෙස සමස්ත බෞද්ධ ජනතාවගෙන් ඉල්ලා සිටින බව සේරුවාවිල මංගල රජමහා විහාරාධිපති නැගෙනහිර තමන්කඩුව දෙ පළාතේ ප්‍රධාන සංඝ නායක දෙම්පේ පාළුගම බෞද්ධ මධ්‍යස්ථානාධිපති ආචාර්ය මුංහේනේ මෙත්තාරාම හිමියෝ සඳහන් කරති. රජය පනවා ඇති සෞඛ්‍ය නීතිරීතිවලට අනුගත වෙමින් මෙම පුදබිම වන්දනාකර ගැනීමට අවශ්‍ය සියලු පියවර අරගෙන ඇතිබව සඳහන් කළ මෙත්තාරාම හිමියෝ සැදැහැවතුන්ගේ ආරක්ෂාව සඳහා සියලු විධිවිධාන යොදා ඇති බවද සඳහන් කළහ.

ඒ වගේම මංගල මහා චෛත්‍යරාජයාණන් වහන්සේ වෙනුවෙන් උදේ ,දවල් සහ සවස දෛනික ව පවත්වන තේවා කටයුතු නො කඩවා සිදුකරන බවත්, ඒ සඳහා දායකවීමට කැමති පින්වතුන් සේරුවාවිල මාධ්‍ය ඒකකය අමතා වැඩි විස්තර ලබාගත හැකි බවත් සඳහන් කරයි.

**රත්නසිරි පතිරණ**

# ඉවසීම නැති නිසා සැනසීම නැති වුණා

“මං ජීවත් වෙන්න නොකරපු දෙයක් නැහැ..මගෙ දරුවෝ පුංචි කාලේ තමයි මගෙ රස්සාව නැති වුණේ. මම පුද්ගලික අංශයේ රස්සාවක් කරපු කෙනෙක්. කන්තෝරුවෙ අය බොරු කියලා මා මුදල් වංචාවකට හසු කෙරුවා. නඩු කියන්න මට සල්ලි තිබුණේ නැහැ.

මගෙ බිරිඳවත් පිළිගත්තේ නැහැ මම හොරෙක් නොවන බව. එයා කිව්වේම මම සල්ලි හොරකම් කරලා වෙන කෙනෙක්ට දෙන්න ඇති කියලා. ඒත් කිසිම දවසක හොරකම් නොකරපු මා අන්තිමට එයා මිනිමරුවෙක් කෙරුවා.“

මැදිවියේ මිනිසා පවසන්නට වූයේ බොහෝ කතගාටුවෙනි. ඔහු වයස අවුරුදු පනහක් තරමේ අයෙකි.

**දැවෙන සිත්**

රස්සාව නැති වුණාට පස්සේ මම කුලී වැඩ කරන්න ගත්තා. ගෙවල් හදන තැන්වල අත් උදව්වට ගියා. මට කවදාවත් එහෙම තැනක වැඩ කරලා පුරුද්දක් තිබුණේ නැහැ. මගේ සහෝදරයෝ කැමති වුණේ නැහැ මම කුලී වැඩ කරන්න යනවට. මගේ අයියා විවාහ වෙලා හිටියට එයාට දරුවෝ හිටියේ නැහැ. අයියා අපේ ලොකු දුවව එයාගේ ගෙදර එක්ක ගෙන ගියා. මට නම් ඕන වුණේ කන්න බොන්න නැති වුණත් දරුවෝ දෙන්නා මා ළඟ තියා ගන්න. එයා නම් බොහෝම කැමැත්තෙන් අයියටට දුව බාර දුන්නා. බාල දුව විතරයි ගෙදර හිටියේ. මම සමහර වෙලාවට දුර පළාත්වලත් වැඩට ගියා. පවුලට ඕන වුණේ සල්ලි විතරයි.

“පුතේ උඹ ඔය දුර පළාත්වල වැඩට යන එක නතර කරලා මේ ළඟ පාතින් රස්සාවක් හොයා ගනින්.“ අම්මා මට කිහිප දවසක්ම කිව්වා. ඒත් ඇයි අම්මා එහෙම කියන්නේ කියලා මට තේරුණේ නැහැ..

“මචං උඹ පොඩ්ඩක් ගෙදර ගැන කල්පනාවෙන් හිටපං“

මාසයකට විතර පස්සේ ගමට ආ මට මගේ යාළුවෙක් කිව්වේ අපි පුංචි සාදයක් දාද්දි. ඒ වෙලාවේ මත් වෙලා හිටිය මට ඒක ඒ තරම් තේරුණේ නැහැ. ඒ වුණත් පහුවදා මම මේ කතාව මතක් වෙලා යාළුවාගෙන් විස්තර ඇහුවා. යාළුවා කිව්වෙ ම නෑ.

මම දවස් කිහිපයක් ගෙරදට වෙලා හිටියා.

“ ඇයි තමුසේ වැඩට යන්නේ නැත්තේ. මෙතන ලැගලා හිටියාම කන්න බොන්න ඉබේ ලැබෙනවද? “

බිරිඳ පොල්ලෙන් ගනවා වගේ උදේ හවස කියවන්න ගත්තා. ඒ වෙනකොට මගේ අතේ රුපියල් දහ දාහක් විතර තිබුණා. මම කාමරයට ගිහිල්ලා පවුලගේ අතට රුපියල් පන්දාහක් දුන්නා. එච්චර වෙලා මට දොස් කියමින් හිටපු එයා ඒක අතට ගත්තේ හිනාවෙලා. මං හිතුවා එතකොටවත් මට කතක් ඇහිලා ඉන්න පුළුවන් වෙයි කියලා. ඒ වුණත් එයා ආයෙමත් හැන්දෑ වෙනකොට කියවන්න ගත්තා.

“මුසලකමට ගෙදරට වෙලා ඉන්නේ නැතිව රස්සාවට යනවකෝ.“

කවදාවත් සැනසිල්ලේ ගෙදර ඉන්න නැති නිසා මම පහුවදා උදේම වැඩට යනවා කියලා හිතා ගත්තා. ඒත් ගෙදරින් යනවා කියලා හිතෙන කොට මට මතක් වුණේ මගේ යාළුවා කියපු එක.

“මචං උඹ පොඩ්ඩක් ගෙදර ගැන කල්පනාවෙන් හිටපං“

එදා උදේ මම ගෙදරින් යන්න පිට වෙන්න හදනකොට බිරිඳ තේ එකක් හදලා දුන්නා. ඒ දුන්නෙත් ඕනැවට එපාවට. මට තේ බොන්නවත් හිතක් තිබුණේ නැහැ.. මම වචනයක් වත් කතා නොකර ගෙදරින් එළියට බැස්සා. දුව මා පස්සෙන් ආවා. මම පොඩි කෙල්ලගෙ ඔළුව අතගෑවේ බොහෝම ආදරෙන්. මට ගෙදර සැනසිල්ලක් තිබුණා නම් තිබුණේ පොඩි කෙල්ලගේ හිනාවයි කතාවයි විතරයි.

“ඔයා කවද්ද ආයේ එන්නේ.....“පවුල මගෙන් ඇහුවා

මතු සම්බන්ධයි...

**ඉනෝකා සමරවික්‍රම**

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

| නිකිණි පුර අටවක | නිකිණි පුර පසළොස්වක | නිකිණි අව අටවක | නිකිණි අමාවක |
|---|---|---|---|
| ජූලි 27 සඳුද පූර්ව භාග 07.09 පුර අටවක පෝය ලබා 28 අඟහරුවාද පූර්වභාග 04.58 න් පෝය ගෙවේ. සඳුද සිල්. | අගෝස්තු 02 ඉරිද අපර භාග 09.29 න් පසළොස්වක ලබා 03 සඳුද අපර භාග 09.28 න් පෝය ගෙවේ. සඳුද සිල් | අගෝස්තු 11 අඟහරුවාද පූර්වභාග 09.07න් අව අටවක පෝය ලබා 12 බදාදා පූර්වභාග 11.16 න් ගෙවේ. අඟහරුවාද සිල් | අගෝස්තු 18 අඟහරුවාද පූර්වභාග 10.39 න් අමාවක පෝය ලබා 19 බදාදා පූර්වභාග 08.11 න් පෝය ගෙවේ. අඟහරුවාද සිල්. |

# ප්‍රහේලිකා අංක 13

බුදුසරණ ත්‍යාග අනුග්‍රහය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**


**හරහට**

1. වර්තමාන ලංකාවේ භික්ෂූන් වහන්සේලා මෙනම් ප්‍රධාන සංවිධාන තුනකට අයත් ය.
4. බුදුරදුන් ලක්දිවට වැඩි සමයෙහි එහි වාසය කළ ගෝත්‍ර තුනෙන් එකක් මෙනම් විය.
5. මුවන් වාසය කළ බැවින් බරණැස ඉසිපතන පරිශ්‍රය මෙනමින් හැඳින්විණ.
7. යම් උපදෙසක් ලද පමණින් නොව තම නුවණින් විමසා භාරගතයුතු බව මෙම සූත්‍රයේ දී පෙන්වා දෙයි.
9. වලගම්බා රජු ඉදිකළ සුප්‍රසිද්ධ ලෙන් විහාරයක් මාතලේට උතුරින් පිහිටි මෙම නගරයේ ඇත.

**පහළට**

2. බුදුරදුන් ප්‍රථමවරට කිඹුල්වත්පුරයට වැඩමවූයේ මෙම ඇමතිවරයා කළ ආරාධනයෙනි.
3. ලක්දිව රජ කළැයි පැවසෙන මෙම රජුට හිස් දහයක් තිබිණියැයි සඳහන් වේ.
5. නාගසේන හිමියන් සහ ග්‍රීක ජාතික රජතුමෙකු අතරවූ සංවාදය මෙනම් වූ ප්‍රශ්නය යන නමින් ලියැවී ඇත.
6. පුණ්‍යමය ඉදිකිරීම්වල විස්තර මෙම ලේඛන මගින් නොමැකෙන සේ දක්වා තැබීමේ සිරිත පුරාණයේ සිට පවතී.
7. මෙම නම ඇති තම පුත්‍රයාට මුදල් දී පොළඹවා බණ ඇසීමට බුදුරදුන් වෙත යැවීමට අනේපිඬු සිටුතුමන්ට සිදුවිය.
8. පරිසරය පිරිසුදුව තබාගැනීමේ සත්ක්‍රියාවන් නිසා මොහු දෙතිසක් අය සමඟ දෙව්ලොවට අධිපති ව ඉපදිණි.

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**




**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

# සදහම් අරණ


සංස්කරණය
නයනා නිල්මිණි

## දුක හඳුනා ගනිමු

සංසාර ගමනෙහි අතරමං වී ගලායන ජීවිත තුළ අප සියලු දෙනාට ඇති ගැටලුව සසර දුකයි. එයට ජාතිය, ආගම, රට, කුලමල කිසිවක් බලපාන්නේ නැත. තණ්හාව, ආසාව, වෛරය බඳින ලෝක සත්ත්වයාගේ සසර ගමන කෙටි නොවී තව තවත් දීර්ඝ වී අවිදු අඳුරේ අතරමං වේ. ලොව්තුරු අමාමෑණී බුදු පියාණන් වහන්සේ දේශනා කළේ ඉපදීම, ලෙඩවීම, නමැති දේ නො ලැබීම, ප්‍රියයන්ගෙන් වෙන් වීම, අප්‍රියයන් හා එක්වීම, මහලු වීම, මරණය ආදී සියල්ල ම දුක ලෙස කෙටියෙන් හඳුන්වා දිය හැකි බව ය. ජීවිතයේ විඳින දුක සඳහා හෙළූ කඳුළු සිව් මහ සාගරයට වඩා වැඩි ය.

**අශානි උමේෂා සෙත්මිණි**
08 වන ශ්‍රේණිය
ශ්‍රී සීලානන්ද දහම් පාසල,
ඇල්ලමුල්ල

## අනගාරික ධර්මපාලතුමා



ආගම්වාදී, ජාතිවාදී, පුද්ගලවාදී පටු ආකල්පවලින් වියුක්ත වූ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ගේ මානව හිතවාදී, නොවහල් චින්තනය ධාර්මිෂ්ඨ වූත්, සමෘද්ධිමත් වූත් සමාජයක් බිහි කිරීමෙහිලා අගනා මිණි පහනක් විය. උදාර ජාතියක් ගොඩනැංවීම පිණිස එතුමා වෙසෙසින් බාල පරපුර ඉලක්ක කර ගනිමින් රට, ජාතිය, ආගම පිළිබඳ හැඟීමක් ඇති කළේ ය. එතුමා තුළ තිබූ සුවිශේෂී ගුණාංග රාශියකි. එතුමාට පාලි, සංස්කෘත වගේම ඉංග්‍රීසි භාෂාවෙන් පවා ධර්මය දේශනා කිරීමට හැකියාවක් තිබුණි. එතුමා ගමන් ගන්නා වාහනයේ පවා ලියා ඇත්තේ 'ගව මස් නොකව්' යන ආදර්ශ පාඨය යි. සම්බුද්ධ ශාසනයට අමිල මෙහෙවරක් කළ එතුමා ඉන්දියාවේ දි පැවිදි විය. පසු කලෙක ඉන්දියාවේ දී ම අපවත් විය.



**ජී.එම්. මිහිසර**
8 වන ශ්‍රේණිය
ස්වර්ණ ජයන්ති ම.විද්‍යාලය, කෑගල්ල.

## ගොවි රජාණෝ

තෙරුවන් වැඳ දෙවියන් යැද – කුඹුරට හේනට යන්නේ
පොළොවට වැඳ නගුලට වැඳ – ගොවිතැන් වැඩ අරඹන්නේ
අස්වනු ගෙන පළමු කොටස – බුදුන් පුදනට ගෙන යන්නේ
පුරවයි අටු සතුට පිරුණු – සම දිවියකි ගෙනයන්නේ

මඩ නාගෙන වැර දගෙන – බිම් සකසා වවන්නේ
බත සපයන රට සුරකින – ගොවියා දෙවියෙකු වන්නේ
සරලව දිවිපෙවත ගෙවන – දන්පතියෙකු ම වන්නේ
මඩ සෝද ගත් විගසින – දනමන තුළ රජ වන්නේ

**කිරිඉබ්බන් ආරේ සුදත්ත හිමි**
4 වන ශ්‍රේණිය
ශ්‍රී බෝධිලංකාර පිරිවෙන , කතරගම

## පින් කරමු

වර්තමානයේ අපගේ බොහෝ කාර්යයන් තරගකාරි ය. බොහෝ දෙනෙකු උත්සාහ කරන්නේ අනෙක් අයට වඩා ඉහළින් සිටීමට යි. එම නිසා මිනිසුන් පින්, පව් ගැන විශ්වාස නො කරයි. අපගේ ජීවිතය කවර මොහොතක නැතිවේ දැයි සිතන්නට දන්නේ නැත. වඩා වැදගත් වන්නේ මෙලොව හා පරලොව සැප ගෙන දෙන මාර්ගය ගැන දැන, ඒ අනුව වැඩකටයුතු කිරීම යි. එනම් නිවැරැදි දේ හෝ වැරැදි දේ සම්බන්ධ ව අවබෝධය ඉතා වැදගත්. ඒ අනුව පුණ්‍ය ක්‍රියාවල නිරතවීම යෝග්‍ය ය .

පින් දහම් කිරීමට ධනය අවශ්‍ය නොවේ. අන් අයට කරදරයක් වූ විට කළ හැකි උදව් උපකාර අවංක චේතනාවෙන් ඉටු කරන්න. එවැනි දේ තුළින් දවස පුරා පින් රැස් කරගත හැකි ය. එවන් පින්වත් චරිත මෙලොව සතුටු වෙයි. පරලොව ද සතුටු වෙයි. දෙලොව ම සතුටු වෙයි. මා විසින් පින්කම් කර ඇතැයි සුගතියට ගියේ ද එහි දීත් සතුටු වෙයි.

**ලක්ෂාණි ද අල්මේදා**
9 වන ශ්‍රේණිය
ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය

## ඉන්දීය සාගරයේ මුතු ඇටය



මගේ මව් බිම ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසද හඳුන්වයි. මා උපන් බිම, මට මගේ මව වැනි ය. මගේ රට උගතුන්, බුද්ධිමතුන්ගෙන් පිරුණු රටකි. අපි සියලු දෙනාම ලක් මවගේ දරුවෝ වෙමු. මගේ රට ගංගා, ඇළදොළ, වනාන්තර, කඳු ගැටවලින් පිරුණු අතර, පැරණි නටබුන් දැකීමෙන් අප මවිපතයට පත්වෙමු. සීගිරිය, ශ්‍රී දළදා මාළිගය. සමනල කන්ද සිංහරාජ වනාන්තරය මගේ රටේ අභිමානය ගැන ලොවට කියාපායි. රට මැදින් ගලා හැලෙන මනරම් දිය ඇලි රාශියකි . ඒවා දෙස් විදෙස් හැමදෙනා ම සොම්නසට පත් කරයි.

**ලසිඳු චාමික**
4 වන ශ්‍රේණිය
බෞද්ධාලෝක විදුහල – පානදුර

## මගේ සීයා

උදේ නැගිටලා – පිරිසුදු වීලා
මල් ටික කඩලා – පහන තියාලා
බුදු ගුණ ගයලා – බුදුහිමි නැමදා
සීයා මෙත් සිත පතුරනවා

පිරිත් කියනවා – බවුන් වඩනවා
බණ පොත් නිතරම කියවනවා
දහස් වරක් කී – පිරිත් තෙල් බිදක්
නලලෙ තියාලා – සීයා මෙත් සිත පතුරනවා

**රවිදි චමත්මා ජයතිලක**
4 වන ශ්‍රේණිය
බෝසත් දහම් පාසල
උඩහමුල්ල



## මගේ පැතුම

දරු සෙනෙහස කවියට නැඟූ අම්මා
රැකවරණය යන වචනයෙ අර්ථය දුන් අම්මා
දෝරෙ ගලා යන සෙනෙහස් ගඟුලක
උල්පත මාගේ දෙමව්පියෝ
ආදරය කරන්නෙමි ඔවුනට හැමදම
එය මගෙ පැතුම වේ නිබඳව ම

**ඩී.ජී.තාරක ලක්ෂාන්**
09 ශ්‍රේණිය
ජනාධිපති මධ්‍ය මහා විද්‍යාලය, කතරගම

## පූජනීය අනුරාධපුර නගරය



අනුරාධපුරය උතුරු මැද පළාතේ පිහිටා ඇත. එය මුල්ම රාජධානිය ලෙස සැලකේ. අනුරාධපුරය ලෝ වැසි බෞද්ධයාට ඉතා සුවිශේෂී වේ. මුල්ම දගැබ වන ථූපාරාමය එහි පිහිටා ඇත. රුවන්මැලි මහාසෑය. මිරිසවැටිය දගැබ, ජේතවනය, අභයගිරිය ආදී අටමස්ථාන පිහිටා ඇත. මුල්ම වැව වූ අභයවැවද පිහිටා ඇත. මේ නිසා අනුරාධපුරය සුවිශේෂ වේ.

**බී.ඉෂාර නයනක පීරිස්**
3 ශ්‍රේණිය, ශ්‍රී සුමේධ දහම් පාසල – විල්පත

### සුන්දර ගම්මානය



**හසලක ධම්මභාණතිලක හිමි**
03 වන ශ්‍රේණිය
ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙන
මහරගම

### පුංචි නිවෙස



**කැලිපනාවෙල ධම්මරාග හිමි**
මූලික ශ්‍රේණිය
ශ්‍රී සුමන සාමණේර ආයතනය
හඳපානාගල

### බුදුසරණ සදහම් අරණ ළමා සමාජයේ සාමාජිකයෝ

640 එච්.ජී. සඳුනි මේඝනා - 12 වන ශ්‍රේණිය
ශ්‍රී විජයා නන්ද දහම් පාසල - පොල්ගහවෙල
641 ගීත්මා ඔමන්දි පෙරේරා - 9 වන ශ්‍රේණිය
ශ්‍රී බෝධිරාජ දහම් පාසල - දෙහිවල
642 ඩී.ජී. ෂෙහානි නවෝද්‍යා - 08 වන ශ්‍රේණිය
සිරි විමලසිරි දහම්පාසල - පොල්පිටිමූකලාන
643 එම්.ජී. අෂිණි ඉමේෂිකා - 06 වන ශ්‍රේණිය
ආනන්දාරාම විහාරය – විජයබාකන්ද
644 ජේ. ජී. සඳුනි ප්‍රභාෂිණී ගමගේ -11 වන ශ්‍රේණිය
පරාක්‍රමබාහු ජාතික පාසල - පොල්ගහවෙල

### බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

සම්පූර්ණ නම :– ..................................................
පාසල / දහම් පාසල :– ..................................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :– ..................................................
ලිපිනය :– ..................................................
දුරකථන අංකය :– ..................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.

# පහන් සිතක කවි

## බෝ සමිඳුනේ



පුර හඳ සසලයි
ඔබ සැම නිහඬයි
බෝ සමිඳුගේ ගුණ
මුළු ලොව පැතිරෙයි
සැමදා අපි ඔබ
වන්දනා කරනෙමු
ඒ සුව සෙත දෙති
දිවියේ ජය පෙත

**එච්. ආර්. එල්. වයි. සඳලි රත්නායක**
හන්දෙස්ස

## ගුණ දම් වඩමු

ඉසි කෝ මද මාන සැම විට දුරලන්නේ
මෙත් කරුණා මුදිතා ගුණ උපදන්නේ
ගුණ දහමින් සැම දෙන රැක පන්නේ
එවිටයි සිරිසෙත අත්පත් වන්නේ

අනුන්ගෙ ගුණ දෙස් නොම විම සන්නේ
විපතෙදි සැම විට පිහිටට ඉන්නේ
උතුම් මිනිස් ගුණ දම් සුර කින්නේ
එවිටයි ජීවිත හරි මග යන්නේ

**ශීලා ජයකොඩි**
තඹුත්තේගම

## සුවපත් වේවා



බුදු රැස් දහරින්
ලොව නහවා
සම්බුදු හිමි
අපහට
දම් පද කීවා
මේ පොහෝ දිනයේ
ඒ පින් ගෙන ආවා
සැම දෙන නිවනින්
සුවපත් වේවා

**සමන්ත මහතන්තිල**
රත්නපුර

## අනවබෝධය

මෙවර ජයග්‍රාහී කවිය

සැණකෙළි පියයන්ද සමගින් තුටු වෙන්නේ
නෙත පිනවන දසුන් දකිමින් සැනසෙන්නේ
දේපළ මිල මුදල් සොයමින් දිව යන්නේ
දන් ඇති කියා සෑහීමක් නොම වන්නේ

නොපෙනේ භව සසරෙ පැතිරුණු නොනිමි දුක
නො දනේ මරණයට යන බැව් ටිකෙන් ටික
නොහැගේ කුසල කර්මයෙ ඇති මහඟු සුඛ
නොදනී අමා නිවනෙත් දුක නිවෙන එක

**අනුර ජයවීර**
බදුල්ල

## සදහම් සුවඳ

ඉඳුරන් දමනයෙන් කෙලෙසුන් හල සිතින
නුවණින් අනෙක් සව්වන්න හට නොම දෙවන
ගුරුවන් සමිඳු අගසව් සැරියුත් නමින
මුනිඳුන් සසුන් අඹරෙහි සඳ සේ දිලින

තමහට වැඩ කැමැති නුවණැත්තා නිතින
හැමවිට දහම් විමසා නුවණින් සොඳින
කුසලට නැමී විරියෙන් කෙලෙසුන් නසන
සහතුට අරියමග ගෙන ලබනුයේ නිවන

**කේ. පියුමි නුවන්දරා පෙරේරා**
කිරිඳිවැල

## යශෝධරා



සාරා සැකි කපක් පුරා බඹසර රැකි පතිනී
නැරා තම බෝසත් හිමි පිළිබඳ පෙම වැඩුණී
දේරේ යන පති සෙනෙහස බුදු බවටම බැඳුණී
යශෝධරා මෙකප උපන් සුන්දරතම පතිනී

**අශෝකා අබේවර්ධන**
නාවලපිටිය

## නොසිතන සිත



මල් පිදුමට තරග කෙරුවත් පෝදට
තෙල් යෙදුවට උඩින් පැන හෝ පහනකට
කල් ගත වුණත් සිතමින් යහපත් ලෙසට
යල් පැනලා නොවෙද, හෙව්වද සිත හෙටට

ඉන්නට ලොකු ගෙයක් සැලසුම් කෙරුවාට
යන්නට සැප රියක් ගන්නට බැලුවාට
මඟුලට ඉහළින්ම වියදම් දැරුවාට
දහමට සිත ගන්න සිතුණේ අප කාට

**පී. බී . ගුණරත්න**
සිරි මිහිදු දහම් පාසල
කෝරළ ඉම

## මරණය



ජීවිතය අනියත යි මරණය හිමි බව දනිති
නොහැකිය බේරෙන්න මරුවා ඉඩ නොදෙති
මේ කුණු කය පොළොවට පස්වී දිරති
සම්බුදුසරණ යන අය මරණෙට බිය නොවෙති

**වැලිකලගේ සිරිපාල කීරන්තිඩිය**
මතුගම



## නිති පන්සිල් රකිමු

අටසිල් රකිමු හැකි හැම විට සැමදම
එනමුත් රැකිය හැක පන්සිල් සැම දිනම
ඒ ලෙස සිතුවහොත් සැම දෙන නිසි ලෙසට
ගුණ නැණ බෙලෙන් යුතු වෙයි අපෙ රටෙ සැවොම

**කරුණා අමරකෝන්**
වැලිගල්ල

## මඟ ඵල ලබන්න

සිව් බඹ විහරණය වෙත සිත යොදවා
දන් සිල් භාවනා ගුණ දම් නිති මඩවා
තිදෙරින් නිතර සිදුවන අකුසල් වඩවා
කල්ගත කළොත් සුමගට යේ යැයි සිතුවා

තිසරණ සමග නිති පන්සිල් රැකලා
බණ භාවනා කොට පරවැඩ ගැන සිතලා
තිසරණය ම පතා සද්ධා ගුණ වඩලා
මග ඵල ලබන හැකි වේ යැ'යි සිතලා

**බී. ආර්. දයානන්ද**
ගම්පහ

සංස්කරණය
ජම්මික ප්‍රබෝධනී වැලිකල

## කවි කිවිඳියනට සතර පෝ දාට ම දහම් තුටු පඬුරු

බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස ඉල් පුර පසළොස්වක පෝද සිට දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

බුදුසරණ
පහන් සිතක කවි
BCC

සම්පූර්ණ නම :- ..........................................................
ලිපිනය :- ..........................................................
දුරකථන අංකය :- ..........................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි,
බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

රැකියාවක් පතමි.
වැදගත් විධායක විශ්‍රාමික මහතෙකුට සුදුසු රැකියාවක් ලබාදෙන ලෙස කෙරෙන ආරාධනාවකි.
077 5226250

දුෂ්කර ප්‍රදේශයක ඉදිවෙමින් පවතින චෛත්‍යයේ ඇත්පවුර, වළාකුළු බැම්ම, පැතිබැම්ම සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා පිංවත් ඔබගේ කාරුණික සහයෝගය ලබාදෙන ලෙස ශාසනාලයෙන් යුතුව ඉල්ලා සිටිමි.
අමතන්න
070-5905720 / 071-9084454
076-4271870

O වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි
25 වයසැති සොහොයුරකුට O වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇත. පරිත්‍යාගශීලී අයකු ඇත්නම් අමතන්න.
071-4988568

මිත්‍යාවෙන් බියෙන් දැවිල්ලෙන් තැවිල්ලෙන් තොර නිදහස් නිවහල් ජීවිතයකට මග
මුනිවර දේශනා
දිනපතාම උදේ 9 ට රාත්‍රී 9 ට
Peo TV Channel 18 නොවරදවාම නරඹන්න

කොටහේන මහා විෂ්ණු දේව මන්දිරයේ
ඉදිකිරීම් පරිපූර්ණ කිරීමේ මහා පුණ්‍යකර්මයට ඔබත් දායකවන්න !



"මහා විෂ්ණු දෙවිඳුන් වෙනුවෙන් දේව මන්දිරයක් ඉදිකිරීමට දායක වීම ආත්ම භාව සතක් පුරා පැවති සියළු පාපයන්ගෙන් අත්මිදිය හැකි ආශිර්වාදාත්මක මහා පුණ්‍ය කර්මයකි"
- විෂ්ණු පුරාණය -

දේව මන්දිරය ඉදිවෙමින් පවතින පරිශ්‍රයට පැමිණ සියැසින් දැක ආශිර්වාද අත්පත් කරගන්නා මෙන් ඔබට ආරාධනා කරන්නෙමු.


අවසන් අදියරේ ඉදිකිරීම් වෙනුවෙන් ඔබගේ නොමසුරු පුණ්‍යාධාර දෙවිඳුන්ගේ ශ්‍රී නාමයෙන් ගෞරවයෙන් අපේක්ෂා කරන්නෙමු.
මහාකර්තදාස් ස්වාමි (077-2288166)





ශ්‍රී ශ්‍රී රාධා ක්‍රිෂ්ණා දේවමන්දිරය
188, අලුත් හෙට්ටි වීදිය, කොළඹ 13
දුරකථනය: 011 2 433 325
විද්‍යුත් තැපෑල: iskcon@slt.lk

## තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව 11 කොටස



# අකීකරුකමට පාඩමක්

**නාගදීපයේ සිට අධ්‍යාපන කටයුතු උදෙසා ඇල්පිටියට නුදුරු ඉඳිපල්ගොඩ ධර්මාරාමයට වැඩම කළ පදුමකිත්ති හිමියෝ එහි අධ්‍යාපන කටයුතු නිම කිරීමෙන් අනතුරුව නාගදීපයට වැඩම කළහ. පසුව නාගදීප නායක හිමියන් විසින් පදුමකිත්ති හිමියන් පැවිදි වීමට මව සමඟ පැමිණි දෙමටගොඩ නාගදීප විහාරයට යොමු කරන ලදී. බ්‍රාහ්මණවත්තේ සීවලී හිමියන්ගේ තදබල නීති රීති නිසා එහි වැඩම කරන්නට අකමැති වුවත් ඒ ගමනින් නවතින්නට පදුමකිත්ති හිමියන්ට හැකි වූයේ නැත.**

සීවලී නා හිමියන් විසින් පදුමකිත්ති හිමියන් කැටුව ගොස් දෙමටගොඩ ධර්මාරාම පාරේ පිහිටි විද්‍යාලංකාර පිරිවෙනේ (අද විද්‍යාලංකාර විද්‍යාපීඨය) නායක හිමි, යක්කඩුවේ ප්‍රඥාරාම නා හිමියන්ට උන්වහන්සේ බාර දුන්හ. පිරිවෙනට බාර ගැනීමෙන් පසුව පදුමකිත්ති හිමියන්ගේ බාරකාරත්වය පැවරුණේ මාරපන විජිත හිමියන්ට ය.

විද්‍යාලංකාර පිරිවෙනේ අධ්‍යාපන කටයුතු කෙතරම් හොඳින් කරන්නට හැකි වුවත් සීවලී හිමියන්ගේ තදබල හා සීමාව ඉක්මවා ගිය නීති රීති නිසා දෙමටගොඩ නාගදීප විහාරයේ වැඩ වාසය කරන්නට පදුමකිත්ති හිමියෝ අකමැති වූහ. එසේ වුවත් අධ්‍යාපනය හැදෑරිය යුතු නිසා කළ හැක්කක් ද නොවී ය.

ඒ වන විට දෙමටගොඩ විහාරස්ථානය අවට සිටි තරුණ තරුණියෝ විහාරවාසී හිමිවරුන් සමඟ ඉතා කුළුපගව කතා කළහ. එසේ පදිංචිව සිටි බොහෝ තරුණියන් තාවකාලිකව නේවාසිකව සිටි අය වූ අතර රැකියා නිමවී පැමිණි ඔවුහු විහාරස්ථානයට පැමිණ, අනතුරුව සාමණේර හිමිවරුන් සමඟ කුළුපගව කතා කළහ.

එහෙත් ඒ අවට විසූ ඇතැම් පිරිස් ඒ ගැන එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. විශේෂයෙන්ම ඒ අතර සිටි මහලු පුද්ගලයෙක් දිනපතාම මෙන් විහාරස්ථානයට පැමිණ බ්‍රාහ්මණවත්තේ සීවලී හිමියන්ට තරුණ භික්ෂූන් තරුණියන් සමඟ කතා කිරීම අතිශයෝක්ති යොදා බොරු කේළාම් කියන්නට විය.

සීවලී හිමියන් ඒ සම්බන්ධව ඇඩි සේ දෙස් කියන්නට වූ නමුත් ඒ වන විට තරුණ වයසේ සිටි මෙන්ම පෙර සීවලී හිමියන්ගෙන් පහර කෑ අයුරු මතක තිබූ හෙයිනුත් පදුමකිත්ති හිමියන් ඒ අභූත චෝදනා හමුවේ ඉවසුවේ නැත.

සීවලී හිමියන්ගේ දෙස් පැවරුම් හමුවේ පදුමකිත්ති හිමියන් පවසා සිටියේ තමන් සාමණේර භික්ෂුවක් ලෙස ඕනෑම අයෙක් සමඟ කතා බහ කරන බවයි. පිරිවෙනේ අධ්‍යාපනය ලබා දෙන්නේ ද ගිහියන් හා කුළුපගව, භික්ෂූත්වයට නිගරු නොවන ලෙස කටයුතු කිරීම බවයි. තමන් වහන්සේ කිසිදු ආකාරයක භික්ෂූත්වයට නිගරු දෙන කිසිවක් නොකරන හෙයින් ඒ ගැන දිගින් දිගටම පදුමකිත්ති හිමියෝ සීවලී හිමියන් සමඟ වාදයන්හි පැටලුණහ.

අවසානයේ සිවලී හිමියෝ පදුමකිත්ති හිමියන්ට නාගදීපයට ආපසු යන ලෙස අණ කළහ. එහෙත් අධ්‍යාපනය පිණිස වැඩම කළ පදුමකිත්ති හිමියෝ ඊට අකමැති වූහ.

තව දුරටත් අධ්‍යාපනය හැදෑරීමට අවශ්‍ය බව උන් වහන්සේ එක හෙළාම පැවසූහ.

එහෙත් සීවලී හිමියන්ගේ නියෝගයට පිටින් කටයුතු කරන්නට පදුමකිත්ති හිමියන්ට හැකි නොවීය. පදුමකිත්ති හිමියෝ බලෙන්ම නාගදීපයට කැඳවාගෙන යන්නට සීවලී හිමියෝ කටයුතු කළහ.

පදුමකිත්ති හිමියන්ගේ අධ්‍යාපන කටයුතු එයින් කෙටි කලකට ඇණ හිටිණි.

වෙනදා මෙන් නොව පදුමකිත්ති හිමියන් ආගම දහම ගැන වැඩියෙන් සිතන්නට වූහ. ආගමික දර්ශනය, ආගමික සංකේත ආදිය ගැන වැඩි අවධානයක් යොමු කළේ පිරිවෙන් අධ්‍යාපනයේ ඒ වන විට දැන උගත් දේ අනුවය.පදුමකිත්ති හිමියන් පැවිදි වීමට පෙර මල් කැඩීමට ගිය දෙමළ ජාතික තරුණයකු හා තවත් දෙමළ තරුණයින් දෙදෙනකු දිනක් විහාරස්ථානයට පැමිණි අතර ඒ පිරිස සමඟ කතා කරමින් විහාරස්ථානයේ ඇවිදිමින් සිටියදී බිම වැටී තිබූ බෝ අත්තක් දුටු පදුමකිත්ති හිමියෝ එය මහත් ගෞරවයෙන් දෝතින් ගෙන උස් ස්ථානයක තබා වැඳ නමස්කාර කළහ.

“ඒ මොකෝ සාදු, බිම වැටිච්ච කොළ අත්තට වැන්දෙ?“ එක් තරුණයෙක් ඇසුවේ ය.

“බෝ ගහ අපිට බුදු හාමුදුරුවො වගේ“ පදුමකිත්ති හිමියෝ පිළිතුරු දුන්හ.

දෙමළ තරුණයෝ ඊට විහිළු කළහ.

(මතු සම්බන්ධයි)

තාරක වික්‍රමසේකර

---

# හැරයාම

**පටාචාරාවෝ සැවැත්නුවර නුවර හතලිස් කෙළක් ධනයකට හිමිකම් කියන සිටුවරයකුට දාව උපන් රූමත් දියණියකි.මනා වූ රූප සම්පත්තියෙන් යුක්ත වූ ඕ තොමෝ තුරුණු වියට පත් වූ පසු සිටුගෙදර මෙහෙකාර සේවයේ යෙදුණු දාසයෙකු සමඟ රහසිගත ප්‍රේමයකට අත්පොත් තබන ලදී.**

දාසයා කෙරෙහි වූ සෙනෙහසින් තම මවුපියන්ටත් නොදන්වා රහසේම පටාචාරාවෝ ඔහු සමඟ පිටිසර ගමකට පලා ගියේය .

අනේක විධ දුක්ඛ දෝමනස්සයන් ට මුහුණ දෙමින් ජීවත් වූ පටාචාරවන් ට නොබෝ කලකින් සිය පළමු දරුවා ලැබෙන්න ට විය. එබැවින් ඇය මව කරා යෑමට සිය ස්වාමිපුරුෂයාගෙන් විමසූ විට ඔහු ඊට අවසර ලබානොදුන්නේ ය. මන්ද තමන් කළ වරදට දඬුවම් ලැබෙනු නියත බව දැනගෙන ය.

තම බිරිඳගේ බලවත් ඇවිටිල්ල නිසා ගමනට යාමට පිටත් වුවත් අතරමගදී දරු ප්‍රසූතිය වූ බැවින් නැවත වාසස්ථානය වෙත ගියේ ය.

නැවත කල්යත්ම ඇය දෙවන දරු උපතට සූදානම් විය. එවර ද කලින් පරිද්දෙන්ම මාපියන් බැහැදැකීමට යාමේදී එම දරුවාත් ප්‍රසූත කරන්නට සිදුවිය. එදා ධාරානිපාත වර්ෂාවක් ඇද හැලෙන්නට විය. එලෙසම වර්ෂාවෙන් අලුත උපන් දරුවා ආරක්ෂා කරගත යුතු බැවින් සිය සැමියා කොළ අතු කිහිපයක් කඩාගෙන විත් ආවරණයක් තනන්නට සිතා වනයට ගියේ ය. එවිට ඔහු අතු කපමින් සිටි ගස ළඟ වූ තුඹසකින් පැමිණ නාගයෙකු කෝපාවිෂ්ඨ ඔහුට දෂ්ට කළේය.

තම සැමියාගේ ප්‍රමාදය නිසා ඇය සිය වැඩිමහල් දරුවා ද අතින් අල්වා ගෙන එදින උපන් දරුවා තුරුලු කරගෙන හිමියා සොයා ගියා ය . එහිදී ඔහු මියගොස් සිටිනු දැක හඬා වැලපී කිසිවෙකු ගේ පිළිසරණක් සොයා ඉදිරියට ගියා ය. හිරු උදාවිය. අතරමග වූ ගඟකින් එතෙරවීම ට සිදුවූයෙන් ඇය ප්‍රථමයෙන් අලුත උපන් බිළිඳු එතෙරට ගෙනගොස් රෙද්දක දවටා ඉවුරේ තබා වැඩිමහල් දරුවා එතෙරට රැගෙන යාමට ගඟට බසිත්ම, ඉහළ අහසේ වූ උකුස්සෙකු පැමිණ ලේ කැටි බිළිඳු රැගෙන යනු දුටු පටාචාරා වෝ කලබල වී අත්පුඩි ගසන්නට විය.එය දුටු වැඩිමහල් දරුවා තමන්ට මව කතාකරනවායැ යි සිතා දියට බසිත්ම ඔහුදිය පහරක ගසාගෙන යන්නට විය.

දරුවන් හා සැමියාගේ අහිමි වීමෙන් බලවත් වූ ශෝකයට පත් පටාචාරා වෝ තම මාපියන් සොයා යන්නට විය.එහි යන අතරමග දී ඇයට අසන්නට වූයේ, පෙරදින රාත්‍රියේ වැටුණු වර්ෂාවෙන් සිටුගෙය බිඳ වැටී සියල්ලෝම මරණයට පත් වූ බවයි.

තම එකම පිළිසරණ වූ මවුපියන් මියගොස් තිබූ නිසා ඇය සිහි විකල්ව ඇඳිවත පවා අමතක ව පිස්සියක මෙන් නගරය පුරා වියරුවෙන්දිවයන්නට විය.

බොහෝ දෙනා ගේ නින්දා අපහාසයන්ට ලක් වූ ඇය එක් මනුෂයයෙකු ගේ මග පෙන්වීමෙන් බුදුරදුන් වෙත එළඹුණාය.

එහිදී බුදුන් වහන්සේ ගේ මහා කරුනා ගුණය නිසා ඇය පියවි සිහියට විත් සියල්ල තේරුම් ගන්නට විය.පසුව එහි වූ පිරිසෙන් ඇයට සළුවක් ලැබුණි. පියවි සිහියට පැමිණ තිබූ ඇය එය හැඳගත්තා ය.

සිය අත්දැකීම් තුළින් ජීවිතයේ අනිත්‍ය තාවය මෙනෙහි කළ ඇය දිනක තමා පය සේදූදිය පොළොව විසින් උරා අවසන් වනු දැක සියලු සංස්කාරධර්මයෝ ද මෙසේම ක්ෂය වී යන බව දැන අවබෝධ කරගත්තා ය.එකෙනෙහි ම රහත් බවට පැමිණි ඕ තොමෝ පසුකල බුදු සසුනේ විනයධර භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලැබුවා ය.

දහම් පාසල් ගුරු
ශ්‍රී සීලරතන දහම් පාසල
නාලවලාන ගෝනවිල
පී.ඩී.හර්ෂ විරාජ්

# මහත්ඵල මහානිශංස ලැබෙන ලෙස පින් කරමු



මේ ජීවිතයෙන් පසු නැවත භවයක් සත්ත්වයාට උරුමව පවතී. අප කවරදා හෝ දිනක මේ ජීවිතය අත්හැර යා යුතු ය. එයින් පසු තවත් ආත්ම භවයක හට ගැනීම අනිවාර්ය වේ. නමුදු ඊළඟ ආත්ම භාවය කුමන අයුරින් සැකසෙන්නේ ද යන්න නිශ්චිත ව කීමට අපහසු ය.

**එදිනෙදා ජීවිතයේ දී විවිධ අයුරින් අපට ආරාධනා ලැබෙනු ඇත. බොහෝ දුරට මනුෂ්‍ය ජීවිත ගත කිරීමේ දී පෙනෙන්නට තිබෙන සාමාන්‍ය ලක්ෂණයක් ලෙස එය හැඳින්වීමට පුළුවන. ඒ අනුව මංගල අවස්ථා, සාද, නිවෙස් විවෘත කිරීම් ආදී විවිධ උත්සව සඳහා ආරාධනා ලැබෙනු ඇත.**

පැවිදි පක්ෂය ගත් කල්හි දනට, බණට, පාංසුකූලයට, පිරිතට ආදී වශයෙන් ආරාධනා ලැබෙනු ඇත. එම ආරාධනා එදිනෙදා මනුෂ්‍ය ජීවිත හරහා යාව ජීව ක්‍රියාවලියක් වනු ඇත.

ජීවිතයෙන් සමුගැනීමට මාරයාගෙන් ද ආරාධනා ලැබෙනු ඇත. බුදු හිමිට ද එලෙස මාරයා ආරාධනා කළ අයුරු බුද්ධ චරිතය තුළින් පැහැදිලි වේ. තවද ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තුළින් ද ඒ සම්බන්ධ ව කරුණු තහවුරු වේ.

මේ ජීවිතයෙන් පසු නැවත භවයක් සත්ත්වයාට උරුමව පවතී. අප කවද හෝ දිනක මේ ජීවිතය අත්හැර යා යුතු ය. එයින් පසු තවත් ආත්ම භවයක හට ගැනීම අනිවාර්ය වේ. නමුදු ඊළඟ ආත්ම භාවය කුමන අයුරින් සැකසෙන්නේ ද යන්න නිශ්චිත ව කීමට අපහසු ය.

එය කුසලාකුසල කර්ම තුළින් ම තීර්ණය වේ. චුති චිත්තයට අනුව ද ඊළඟ භවයේ සුබ අසුබ පැති නිර්මාණය වීමට බොහෝ දුරට ඉඩ කඩ ඇත. කෙසේ නමුදු අප නිරතුරු සිදු කරන්නේ කුසල කර්ම නම් ඊළඟ භවය සුගතිගාමී වීමේ ප්‍රවණතාවය වැඩි ය. එවිට ඊළඟ භවය ගැන බිය වීමට අවශ්‍ය නැත. නිරතුරුව ම පින් දහම් කරන අයට ලැබෙන ආරාධනා ද ඉතා ඉහළ මට්ටමකින් සිදු වේ. බලගතු ය. එවැනි උසස් ආකාරයෙන් ආරාධනාවක් ලැබීමට තරම් භාග්‍යවන්ත වීම ඉතා දුර්ලභ කරුණකි. නමුදු බුදු හිමි කල ධම්මික උපාසකතුමාට දිව්‍ය ලෝක හයෙන් ම ආරාධනා ලැබීම මොන තරම් වාසනාවක් ද? ඒ බව ධම්ම පදය තුළින් විවරණය වේ.



වාරි රත්මලේ රතනසෙල මහ පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති

**ගලගෙදර රතනවංස හිමි**

ධම්මික නමින් උපාසක තුමෙක් බුදුන් කල සැවැත් නුවර විසී ය. ඔහුට දියණිවරු හත් දෙනෙක් හා පුතණුවරු හත් දෙනෙක් වශයෙන් වූ හ. ධම්මික උපාසකතුමා ඉතා ශ්‍රද්ධාවන්තයෙක් ය. තුණුරුවන්ට නිරතුරුව ම පුදසත්කාර කරමින් ධාර්මික ජීවිතයක් ගත කළේ ය. ධම්මික උපාසක තුමාගේ ස්වාමි දියණිය ද, දූ දරුවන් ද ඒ ආකාරයෙන් ම පිනට දහමට ලැදි ය. වයෝවෘද්ධව, රෝගාතුර වී මරණ මඤ්චකයෙහි සිටින ධම්මික උපාසකතුමා දූවරුන් ළඟට කැඳවා ඔවුනට ආමන්ත්‍රණය කරන්නේ, තමනට සතිපට්ඨාන සූත්‍රය ඇසීමට අවශ්‍ය බවත්, ඒ සඳහා භික්ෂූන් වහන්සේ දහසය නමක් වඩම්මවා දෙන ලෙසත් ය. ඒ අනුව දූ දරුවෝ ද එම යුතුකම ඉටු කරනු වස් භික්ෂූන් වහන්සේ දහසය නමක් නිවසට වඩමවා තම පියාට සතිපට්ඨාන සූත්‍රය ශ්‍රවණයට සැලැස්වීය. එම දේශනාව ශ්‍රවණය කරන අවස්ථාවේ දී ධම්මික උපාසකතුමා ටිකක් නවතින්න, ටිකක් නවතින්න' යැයි කිහිප වතාවක් ම ප්‍රකාශ කළේ ය. පසුව භික්ෂූන් වහන්සේලා පිරිත් ඇසීම ප්‍රමාණවත් යැයි සිතා පිරිත නවතා විහාරයට වැඩම කළහ.

එම පුවත බුදුරදුන්ට ද දැන්වීය. එවිට බුදුරදුන් එම ප්‍රකාශය දෙවියන්ට කළ එකක් බවත්, එසේ පැවසුවේ සියලුම දිව්‍ය ලෝකවලින් ධම්මික උපාසකතුමාට 'අපේ දිව්‍ය ලෝකයට එන්න' 'අපේ දිව්‍ය ලෝකයට එන්න' කියමන් ආරාධනා ලැබුණු බවත් යනුවෙන් එම භික්ෂූන් වහන්සේලාට දන්වා සිටිය හ.

එතුළින් පැහැදිලි වන්නේ පින් කිරීම දිට්ඨධම්මවේදනීය වශයෙන් විපාක දීමක් නොවේ ද? ධම්මික උපාසකතුමා ජීවත්ව සිටිය දී නිරතුරුවම පින් දහම් සිදු කළේ ය. පවුල් ජීවිතය ද ද ධාර්මිකව පවත්වාගෙන ගියා සේ ම තමන්ගේ ස්වාමි දියණියට, දූ දරුවන්ට ඉටු විය යුතු යුතුකම් කොටස ද නො පිරිහෙලා නිසියාකාරව ඉටු කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ මිය යන්නට ආසන්න මොහොතේ දී දිව්‍ය ලෝකවලින් ආරාධනා ලැබීම යි. සෝවාන් වී සිටි ධම්මික උපාසකතුමා මිය පරලොව ගොස් තුසිත දිව්‍ය ලෝකයෙහි පහළ වූ ආකාරය ආදර්ශයට ගැනීම කාටත් වැදගත් වන සංසිද්ධියකි.

ඉහත කතා පුවත පින් නො කරන, පිනෙහි වටිනාකම නො දන්න, පින් කරන අයට ගරහන අයට හොඳ ආදර්ශමත් කතා පුවතකි. බුදු හිමි පින් කරන අයගේ වටිනාකම එම කතා පුවතටම අලලා තවත් විස්තර කර දෙන අයුරු ඉතා මනරම් ය. ඒ අනුව ධම්ම පදයේ යමක වග්ගයේ 16 වැනි ගාථාව ඉතා වැදගත් වේ.

**ඉධ මෝදති පෙච්ච මෝදති**
**කතපුඤ්ඤෝ උභයත්ථ මෝදති**
**සෝ මෝදති සෝ පමෝදති**
**දිස්වා කම්ම විසුද්ධිමත්තනෝ**

"පින්කළ තැනැත්තා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි." හෙතෙම තමාගේ පිරිසුදු (කාය, වාග්, මනෝ) පුණ්‍ය කර්මයන් බලා සතුටු වෙයි. බලවත් සේ සතුටු වෙයි. සිද්ධ කළ කර්මය දැක සතුටු වෙයි. වැඩි වැඩියෙන් සතුටු වෙයි. මෙතැන දී පින් යනුවෙන් දක්වා ඇත්තේ දස පුණ්‍ය ක්‍රියා ය. එනම්,

**දානං සීලං ච භාවනා**
**පත්ති පත්තානු මෝදනා**
**වෙය්‍යා වච්ච පචායන්ති**
**දේශනා සුති දිට්ඨුජු**

දාන, ශීල, භාවනා, පින්දීම, පින් අනුමෝදන් වීම, වතාවත් කිරීම, පිදිය යුත්තන් පිදීම, බණ කීම, බණ ඇසීම, සම්‍යග් දෘෂ්ඨිය. මේ ආදී වශයෙන් පින්කම් දහයක් පිළිබඳ සඳහන් වේ. එම පින්කම් බෞද්ධයින් වෙතින් නිරන්තරයෙන් සිදු වන පින්කම් වුව ද නිසියාකාරව සිදු වනවා ද යන්න පිළිබඳ විමසා බැලිය යුත්තකි. එයට හේතුව මනස ඒ සඳහා හරියාකාරව නො යෙදීම යි. මනස සියල්ලට ම සම්බන්ධ වන බැවින් පින්කම් කිරීමේ දී වුව ද මනස ම ප්‍රමුඛ ස්ථානයට ගැනේ. සිතේ පවතින ලෝභ, ද්වේෂ, මෝහාදී කෙලෙස් ධර්ම යටපත් කොට ඒ වෙනුවට කුසල් සිතුවිලි ගොඩ නංවාගෙන පින්කම් කළ යුතුව ඇත. එවිට එහි ආනිසංස මහත්ඵල මහානිසංස බවට පත්වේ. නමුදු අද අන් අය කරනවාට තමන් ද පින්කම් කරනවා හැර එහි යථාර්ථය පිළිබඳ අවබෝධයක් ඇතිව පින්කම් කරන බවක් නො පෙනේ. එවිට සිදුවන්නේ එම කරන පින්කම්වල ප්‍රතිඵලය නිසියාකාරව නො ලැබී යාමයි.

**තුන් සිත පිරිසුදු කොට දුන් දනය උන් ගිය ගිය තැන ලැබෙයි නිධානය**

යනුවෙන් ලෝවැඩ සඟරාවෙහි ද 106 වෙනි කවියෙන් සඳහන් වන්නේ තුන් සිත පිරිසුදු කොටගෙන දෙන දනය නිධානයක් ලැබෙනවා හා සමාන බවයි. ඕනෑම ක්‍රියාවක් කිරීමේ දී, කිරීමට පෙර, කරන අවස්ථාව, හා කළාට පසු ආදී වශයෙන් සිතේ ක්‍රියාවලිය තුන් ආකාරයකින් විකාශනය වේ. එම අවස්තාත්‍රය ම පිරිසුදු නම්, එහි ප්‍රතිඵලය ද ඉහළ මට්ටමකින් පවතී.

ඉහත කරුණු තුළින් තහවුරු වන්නේ උපන් සත්ත්වයා නිතර නිතර පින්කම් කර ගැනීම වැදගත් බවයි. එහි ප්‍රතිඵලය ඒ විගසම නො ලැබුණත් ආත්ම ගණනක දී හෝ ලැබෙනු නියත ය. බුදුරදුන් අවධාරණය කළේ පිනට කම්මැලි නො වන ලෙසයි. ඒ බව ලෝවැඩ සඟරාවේ 'කුමට ද කුසලට කම්මැලි වන්නේ' යනුවෙන් සඳහන් කොට ඇත. ධම්ම පදයේ පාප වග්ගයේ 03 වෙනි ගාථාව විමසීමෙන් ද පින් කිරීමෙහි වටිනාකම මනාව පිළිබිඹු වේ.

පින් කැමැත්තා එය නැවත නැවතත් කළ යුතු ය. පින් කිරීමෙහි ආසා කළ යුතු ය. පින් රැස් වීම ලොව්තුරා සැපතට හේතු වන හෙයිනි. බුද්ධ දේශනයට අනුව පින් කිරීම සැපයට හේතු වන අයුරු පැහැදිලි වේ. ඒ අනුව නො පමාව කුසල් දහම් හි නිරත විය යුතු ය. පින් කිරීමට හැකියාව තිබිය දී එය නො කරගෙන පසුවට පසුතැවිලි නො විය යුතු ය. දෙව් දේවතාවුන් ගේ පවා ආරාධනා ලැබිය හැකි පින් දහම්හි නිරන්තරයෙන් ම නිරත වී මෙලොව ජීවිතය පරලොව ජීවිතය සැපවත් කර ගැනීමටත් සසර කතරින් අත්මිදී නිවන් සුවයෙන් සැනසීමටත්, සිතට ගැනීම වැදගත් වේ.


## නිවනින් නිවී සැනසුණ

# චාලා මහ රහත් තෙරණිය

**පෙර බුදුරජාණන් වහන්සේලාගේ බුද්ධ ශාසනවල බොහෝ පින්දහම් සිදුකර දෙව්, මිනිස් දෙගතියේ බොහෝ සැප විඳ කරන ලද පින් මහිමයෙන් මගධ රටේ නාලක බමුණු ගමේ රූපසාරි බැමිණියගේ කුසේ පිළිසිඳගෙන මෙලොව එළිය දුටු ඒ කුමරිය චාලා නමින් හැඳී වැඩුණා.**

ඒ චාලා කුමරිය අප ධම්මසේනාධිපති සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ගිහි කල නැගණියකි. උන්වහන්සේට නැගණිවරු තිදෙනෙක් සිටියා. ඒ චාලා, උපචාලා, සීසුපාචාලා ලෙසින්. වයසින් මුහුකුරා යත්ම ඒ සොහොයුරියන්ට ගිහිගෙය ගිනි ගොඩක් සේ දැනුණා. තම සොහොයුරා ගිය මග ගොස් බුද්ධ ශාසනයේ පැවිද්ද ලබා ගැනීමට ඒ තිදෙනා ම තීරණය කළා.

එහෙත් බමුණු මත කරපින්නාගෙන සිටි රූපසාරි බැමිණියත්, වඞ්ගන්ත බමුණාත් එයට තදින්ම විරුද්ධ වුණා.



"අප බමුණු පරම්පරාවෙන් පැවත එන්නේ. බමුණෝ තමයි මහා බ්‍රාහ්මයාගේ කටින් උපන්නේ. එහෙම පරම්පරාවකින් එන අපට නුඹලා මෙසේ නිගා කරන්නේ ඇයි? අප ගේ වැඩිමහලු පුත්‍රයා මේ මහා ධනස්කන්ධයක් අතහැර දමා පැවිදි වීමට ශ්‍රමණයන් වෙත ගියා. මේ ධනයෙන් ඇති ඵලය කුමක්ද? කියායි ඔහු අපගෙන් ඇසුවේ. අපගේ බමුණු කුලය ඉදිරියට ගෙන යන්න සිටියේ ඔහුයි. ඉතා දක්ෂ කීකරු අපේ දරුවා ශ්‍රමණයන් සොරා ගත්තා. ඒ නිසා දුවේ අඩුපාඩුවක් නො කර ඇතිදැඩි කළ අපට මෙහෙම කරන්න එපා" ඒ මව්පියන් දැඩි ස්ථාවරයක සිටියා.

චාලා කුමරිය එවිට කියනවා "පියාණෙනි, ගෞතම සම්බුද්ධ ශාසනය මේ ජීවිතයේ දී ම ප්‍රතිඵල ගෙන දෙන එකක්. අපේ සොහොයුරු සාරිපුත්ත මහරහතන් වහන්සේ සියලු දුකෙන් නිදහස් වුණේ බුද්ධ ශාසනය නිසයි. එහි ලාමක ධර්ම විනයක් නොවේ තිබෙන්නේ. දුක් විඳින මේ සසරින් එතෙර වීමට තිබෙන එකම නෞකාව බුද්ධ ශාසනය යි. අප ද ඒ නෞකාවට ගොඩවීමට මහත් වූ ආශාවෙන් සිටින්නේ".

ඇගේ බසට මව්පියන් මහත් සේ කෝප ගත්තා. ඒ වගේම දැඩි සේ විරුද්ධ වුණා.

චාපා කුමරිය තම නැගණිවරුන්ට කියනවා "අපට කවදාවත් මව්පියන්ගේ අවසරයෙන් පැවිදි වීමට බැරිවේවි. ඒ නිසා අප ඔවුන්ගේ අවසරයක් නැතිව ම මේ ගිනි ගොඩක් වන් ගිහි ගෙය අතහැර දමා සදා සැපය ඇති ඒ අකාලික මුනි දහම තිබෙන බුද්ධ ශාසනයේ පැවිදි වෙමු" කියා.

එයට එකඟ වූ උපචාලා, සීසුපචාලා ගිහි ගෙය හැරයන්නට සූදානම් වුණා. "අප දමා යන්න එපා කියා "සියලු දෙනා හඬා වැටෙද්දී ඔවුන් තිදෙනා භික්ෂුණී ආරාමය වෙත ගොස් පැවිදි වුණා.

චාලා තෙරණිය පිරිසගෙන් ඈත්ව කෙලෙස් තවන වීර්ය ඇතිව විදසුන් වඩා නොබෝ කලකින් සියලු සකල කෙලෙස් ප්‍රහානය කර මහරහත් භාවයට පත්වුණා.

නිවනෙහි ඇති සුවය විඳිමින් සිටින චාලා තෙරණිය දිනක් සැවැත් නුවර පිණ්ඩපාතයේ වැඩම කළා. පසුව විවේක සුවය සඳහා අන්ධ වනයට වැඩම කළා. ගසක් මුල සමාධි සුවයෙන් දවල් කාලය ගත කළා. මෙය දුටු පාපී මාරයා එතුමියගේ බ්‍රහ්මචාරී ජීවිතය මග හරවණු පිණිස එතුමිය වෙත පැමිණ,

"පින්වතිය, ඔබ කවුරුන් උදෙසා පැවිදි වූයේ ද? මට නම් පෙනෙන්නේ භික්ෂුණියක් වගෙයි. ඇයි තාපසියක් වෙන්න අකැමැති. මෝහයෙන් මුළා වෙලාද ඔබ මේ ඉන්නේ?

චාපා තෙරණිය දෑස් හැර මේ කවුරු ද කියා බැලුවා. එතුමිය දුටුවා තමා ඉදිරියේ සිටින්නේ පාපී මාරයා බව. එතුමිය උදානයක් ලෙස මෙසේ වදාළා.

- මාරය, තාපසියන් සිටින්නේ බුදු සසුනේ නොවේ. ශාසනයෙන් බැහැරව යි. ඔවුන් නොයෙක් මත වාදවල එල්ලී ගෙනයි ඉන්නේ. ඒනිසා ඔවුන්ට මේ ධර්මය තේරෙන්නේ නැහැ. තාපසියන් මේ ධර්මයට අදක්ෂ යි.
- මාගේ ශාස්තෘන් වහන්සේ ශාක්‍ය කුලයේ ඉපදුණ අසහාය ගුණ සමුදායක් තිබෙන උත්තමයෙක්. උන්වහන්සේ මට සියලු මිථ්‍යා දෘෂ්ඨියෙන් බැහැර කරන ධර්මය උගන්වා වදාළා.
- උන්වහන්සේ මට දුක, දුක හට ගැනීම, දුක ඉක්මවා යන ආකාරය වගේම ඒ දුකෙන් නිදහස් වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයත් දේශනා කොට වදාළා. ඒ මිහිරි දහම මටත් අසන්නට ලැබුණා. ඒ වචනය පිළිගත් මම මේ සසුනට බැඳිලයි වාසය කරන්නේ. මමත් උතුම් සසුනේ ත්‍රිවිද්‍යාව ලබා ගත්තා. බුදු සසුන සම්පූර්ණ කර ගත්තා.
- මම දැන් හැම දෙයක් ගැනම ආශාව නැතිව ඉන්නේ. මෝහන්ධකාරය සුනුවිසුණු කර දැමූ මම ගැන ඔබ දැනගන්න ඕන ඔය ආකාරයට යි. මාරය මේ කරුණේ දී නැසුණේ ඔබම යි.

එය ඇසූ මාරයා මහත් දෙම්නසට පත්ව "මේ භික්ෂුණිය නම් මගේ දැලට හසු නො වෙන, මා ඉක්මවා ගිය උත්තමාවියක්" යැයි සිතා එතැනින් අතුරුදහන් වුණා.

**නයනා නිල්මිණී**

## සිංහල අටුවා පාලි භාෂාවට නැගූ අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි

මෙම ලිපියේ මුල් කොටස පසුගිය අව අටවක පෝදා පුවත්පතේ පළ විය.

**බොහෝ දෙනෙකගේ කුතුහලයට තුඩු දුන් වාර්තාගත සිද්ධියක් වන්නේ බුද්ධඝෝෂ හිමි, විසුද්ධි මාර්ගය ලියා එය මහා විහාරවාසී භික්ෂූන් වහන්සේලාට පිළිගන්වන්නට සූදානම් ව සිටිය දී දෙවියන් විසින් එය අතුරුදහන් කරනු ලැබීම ය.**

නැවත දෙවන වරට ද ලියා අවසන් කොට තිබියදී එය ද මුල් පිටපත සේම අතුරුදහන් වීමත්, තෙවනවර ලියා පිළිගැන්වීමට සූදානම් වූ විට මුලින් ලියූ පිටපත් දෙක ද හමු වී විසුද්ධි මාර්ගයේ පිටපත් තුන ම එළිදැක්විණ. මෙම පිටපත් තුන ම අර්ථයෙන් දල ග්‍රන්ථයෙන් ද, පූර්වාපර වශයෙන් ද, ථෙරවාදයෙන් ද, පෙළින් ද, පදයෙන් ද, ව්‍යඤ්ජනයෙන් ද වෙනසක් නො වී ය. බුද්ධඝෝෂ හිමියන්ගේ ගැඹුරු පාණ්ඩිත්‍යය හා විශිෂ්ට ලේඛන කෞශල්‍යය එමගින් මනාව පැහැදිලි වේ. ඒ දුටු භික්ෂූන් වහන්සේලා බෙහෙවින් තුටු පහටුවී 'නිසැකයෙන් ම මේ තෙම මෛත්‍රේය බෝසත්හු ය" යි නැවත නැවත කියා ඝෝෂා කොට අටුවා සහිත පිටකත්‍රය ඇතුළත් පොත් ප්‍රදානය කළ හ. පසු ව උන් වහන්සේ මහා විහාරබද දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙණ වෙසෙමින් බොහෝ සිංහල අටුවා කතා ඒ සියල්ලන් ගේ ම මූල භාෂාව වූ මාගධී භාෂාවට පෙරලූ හ. ථෙරවාදී සෑම ආචාර්යවරයෙක් ම ඒවා පෙළ පොත් තරමට ගුරුතන්හි තැබූ හ.



**ඌරුගමුවේ අස්සජී හිමි**

බුද්ධඝෝෂ හිමි වැඩ සිටි ස්ථාන අතර දූරසංකර පිරිවෙණට අමතරව මහා විහාරයට දකුණින් වූ පධානඝරය ද වෙයි. එසේම ලෝවාමහාපායේ පහත මාලය ද ග්‍රන්ථකරණයෙහි යෙදීම සඳහා උන් වහන්සේට වෙන්කරදී තිබුණි. මහා විහාරයේ ග්‍රන්ථාකරය හෙවත් පුස්තකාලය ද උන් වහන්සේට පරිහරණය කිරීමට ඉඩකඩ සලස්වා තිබුණි. මේවායෙහි වැඩ සිටි බුද්ධඝෝෂ හිමියෝ විසුද්ධි මාර්ගය සේ ම පහත දැක්වෙන අටුවා ග්‍රන්ථ ද සංස්කරණය කළ හ.

සමන්තපාසාදිකා (විනය අටුවාව)
සුමංගල විලාසිනී (දීඝනිකායේ අටුවාව)
පපංචසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)
සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)
මනෝරථ පූරණී (අංගුත්තර නිකාය අටුවාව)
කංඛාවිතරණී (ප්‍රතිමෝක්ෂ අටුවාව)
පරමත්ථජෝතිකා (ඛුද්දක පාඨ අටුවාව)
ධම්මපදට්ඨකථා
ජාතකට්ඨකථා
අත්ථසාලිනී (ධම්මසංගණී අටුවාව)
සම්මෝහවිනෝදනී (විභංග අටුවාව)
පරමත්තදීපනී (පංචප්පකරණ අටුවාව)

මෙම ග්‍රන්ථවල විශාලත්වය හා විවිධත්වය ගැන සලකන විට ඒ සඳහා දැරූ පරිශ්‍රමය කෙතෙක් බැරෑරුම් වූවක් ද යන්න වටහාගත හැකි ය.

බුද්ධඝෝෂ හිමි අටුවාකරණයේදී භාවිත ක්‍රම ශිල්ප කිහිපයක් සමන්ත පාසාදිකාවේ සංක්ෂිප්තව දැක්වෙයි.

මුල් කෘතියේ බස බැහැර කිරීම
හෙළටුවාවල පැවති ප්‍රමාද ලියවීම් බැහැර කිරීම
දිගු විස්තර බැහැරලා සංක්ෂිප්ත කිරීම
තත්කාලීනව පැවති සියලු විනිශ්චයන් ඇතුළත් කිරීම
පාලි භාෂාවේ ව්‍යාකරණ විධි නො ඉක්මවීම.

මේ අනුව බුදුගොස් හිමියෝ පාලි අට්ඨකථා රචනා කළේ හුදෙක් හෙළ අටුවාවන් හි පරිවර්තන ලෙස නො ව සංස්කරණමය භාෂා පරිවර්තන ලෙසිනි. එකී පාලි අටුවාවන් ඊට සාක්ෂි දරයි. බුදුගොස් හිමි භාවිත කළ එකී ක්‍රමවේදය ම උන් වහන්සේ ගෙන් පසුව පාලි අටුවා ලියූ ආචාර්යවරු ද භාවිතයට ගත් හ. පාලි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් ය බෞද්ධ අට්ඨකථාචාරීන් අතර උන් වහන්සේ ශ්‍රේෂ්ඨතමයා ය. එකී උත්තරීතර චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසා ම ය. උන් වහන්සේ ලොව පහළ වූයේ බුදුරදුන් ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාලි අට්ඨකථා රචනා කිරීමට ය. යන ජනප්‍රවාදයක් ද ඇත. ඒ නිසා ම ලංකාවේ අටුවා ගැන කතා කරන සෑම තැනෙක ම බුද්ධඝෝෂ හිමියන්ට 'අටුවාචාරීන් වහන්සේ" යන උත්තම අභිධානයක් යොදා ගැනෙයි.

# තමාට පිහිට තමා ම ය



**ත්‍රිපිටක බුද්ධ දේශනා අතර, ධම්පද පාළිය ධර්මෝපදේශ මැනවින් සංගෘහිත ග්‍රන්ථයකි. එහි භික්ෂු වර්ගයෙහි ඇතුළත් "තමාට පිහිට තමා ම ය. තමා ම තමාගේ පිළිසරණ ය. එබැවින් අශ්වයෙකු දමනය කරන අශ්ව වෙළෙන්දෙකුමෙන් තමා ම තමා දමනය කරගත යුතු වේ" යන බුදු වදනින් ආත්ම සංයමයේ උත්තමාර්ථය ප්‍රකට වේ. මෙම දේශනාව වර්තමානයේ විවිධ ආකාරයට අර්ථකතනය කරනු ලැබේ. ගැඹුරු ආධ්‍යාත්මික අර්ථයක් ඉදිරිපත් කරන මෙම පාඨය සමාන්‍ය අරුතකින් වටහා ගැනීම සඳෙස් ය.**

ධර්මානුකූල ව එහි ගැඹුරු අර්ථය විමසා බැලීම වැදගත් වේ. "අත්ත" යන පාලි වචනයෙහි අර්ථ කීපයක් දක්නට ලැබේ. ඒ අතුරින් ආත්මය හා තමා යන අරුත් ප්‍රධාන වේ. ධම්මපද ගාථාවේ "අත්ත" යනුවෙන් අදහස් කරන්නේ තමා හෙවත් පුද්ගලයා යන්න ය. ඒ අනුව තමාට පිහිට තමා ම යන්න එයින් ගම්‍ය වේ. තමා තමාම පිහිට කොට ගැනීම යන්නෙන් අදහස් කෙරෙන්නේ පුද්ගලයාම පුද්ගලයාගේ ඉරණම විසඳන, එයට වගකියන, ඒ පිළිබඳ තීරණය කරන තැනැත්තා බවයි. බුදුරජාණන් වහන්සේ දෙවියෙකු හෝ ගැලවුම් කරුවෙකු නොවේ. උන්වහන්සේ මාර්ගය සොයාගත් එහි ගමන් කළ, ගමන නිමා කළ උතුමන් වහන්සේ වෙති. එසේම, උන්වහන්සේ තමන්වහන්සේ ම පිහිට කොටගෙන විමුක්තිය සාක්ෂාත් කළහ.

එපමණකින් නොනැවතී සෙසු ලෝකයාට ද එම මාර්ගය හා නිෂ්ඨාව ඉදිරිපත් කළහ. මෙනිසා බුදුරජාණන් වහන්සේ මාර්ගය දත් (මග්ගඤ්ඤූ), මගකියන (මග්ගක්ඛායී) ශාස්තෘවරයෙකු මිස මග කැඳවාගෙන යන්නෙකු නොවේ. බුදු රදුන් විසින් තමන් වහන්සේ හඳුන්වාදෙනු ලැබුවේ මගපෙන්වන මාර්ගෝපදේශකයකු ලෙස මිස, මග කැඳවාගෙන යන්නෙකු ලෙස නොවේ. එසේම උන්වහන්සේ අනුශාසනා ප්‍රාතිහාර්ය යටතේ සමාජයට මගපෙන්වන ශාස්තෘවරයෙකු ලෙස ද හඳුන්වා තිබේ.

බුදු රදුන්ගේ කාර්ය භාරය වූයේ පුද්ගලයාට සසර දුකින් නිදහස් වීමට මග පෙන්වීම පමණි. එම මාර්ගයේ ගමන් කිරීම හෝ ප්‍රතිපදාව අනුගමනය කිරීම ශ්‍රාවකයා සතු වගකීම වේ. පිරිනිවන් මඤ්චකයේ වැඩ සිටිමින් ම උන්වහන්සේ ලෝකයට අනුශාසනා කළේ මිනිසා තමා ම පිහිටකොට ගෙන, තමා ම පිළිසරණ කොටගෙන, තමා ම දිවයිනක් කරගෙන වාසය කළ යුතු බවයි. මෙම පසුබිම අනුව තමාට තමාම පිහිටකොට යන්නෙහි මූලික අර්ථය වන්නේ පුද්ගලයා ම එම පුද්ගලයාගේ ආධ්‍යාත්මික විමුක්තිය හා සංසාරික පැවැත්ම කෙසේද යන්න තීරණය කරනු ලබන තීරකයා වන බවයි.


බුදුදහමේ අතිශය දාර්ශනික විවරණයක් වන "අත්තාහි අත්තනො නථෝ" යන්න විමුක්තිය මෙන්ම සංසාරික පැවැත්ම සම්බන්ධයෙන්ද අර්ථවත් වේ. විමුක්තිය සාක්ෂාත් කළ යුත්තේ පුද්ගලයා විසින්ම ය. අයෙකුට තවත් අයෙක් ගලවාගත නොහැකි ය. එසේම ආධ්‍යාත්මික වශයෙන් පිරිසිදුකළ නොහැකි ය. එබැවින් බුදුරදුන් වදාළ නිවන හෝ විමුක්තිය ලැබෙන්නේ ඒ කෙරෙහි වන පුද්ගල උත්සහාය හා කැපවීම අනුව ය. පුද්ගලයා විසින් රැස්කරනු ලබන පින් පව් කර්ම අනුව එම තැනැත්තාගේ සසර පැවැත්ම තීරණය වේ. එබැවින් පුණ්‍ය–පාප කර්මවල නිමැවුම්කරුවා වන්නේ පුද්ගලයා ම ය. තමා කරනු ලබන සියලුම හොඳ සහ නරක කර්මවල වගකිව යුත්තා තමා ම ය. තමාම තමාගේ ගතිය හෙවත් සසර පැවැත්ම තීන්දුකරන්නාය (අත්තාහි අත්තනො ගති) යන්නෙහි අර්ථය එය වේ. මෙම අර්ථයෙන් ගත්විට ආධ්‍යාත්මික විමුක්තිය හා සංසාරික පැවැත්ම සම්බන්ධයෙන් පුද්ගලයාට තමා හැර වෙනත් කවර හෝ පිහිටක් නොමැත. එසේ නොමැති ව ව්‍යවහාරික ලෝකයේ සමාජීය වශයෙන් කෙනෙකුට තවත් කෙනෙකුට පිහිටවිය නොහැකිය යන්න මෙයින් අදහස් නොවේ. බුදු වදනට අනුව තමාගේ පිහිට හා පිළිසරණ තමා වන හෙයින් ආත්ම දමනයක් සංයමයක් ඇති කර ගන්නා මෙන් බුදුරජාණන් වහන්සේ අපට අනුශාසනා කරති. නිර්වාණාවබෝධය සංසාර දුකෙහි නිමාවයි. පාප හා අකුසල කර්ම රැස් නොකිරීම සසර සැප පිණිස හේතුවේ. නිවන් දකින තෙක් සුගති සංඛ්‍යාත භවයක ඉපදීමට අවශ්‍ය ශක්තිය මෙන්ම පදනම සැකසෙන්නේ පුණ්‍ය කර්ම රැස් කිරීමෙන් ය. දුගතිය මෙන්ම එහි උපතට ඉවහල්වන පාප කර්ම රැස්කිරීමෙන් සාකල්‍යයෙන් ම වැළකිය යුතු ය යන්න බුදුරදුන්ගේ අනුශාසනයයි(සබ්බ පාපස්ස අකරණං). ආත්මදමනය හෙවත් සදාචාර සම්පන්න ජීවිතය නිර්වාණාවබෝධයට මෙන් ම, සසර සැප පිණිස ද අත්‍යවශ්‍ය වේ.

සීලය විමුක්ති මාර්ගයේ පදනම වශයෙන් පිළිගැනෙන්නේ එම අර්ථයෙන් ය. උක්ත බුදු වදනෙහි දැක්වෙන පරිදි අශ්ව වෙළෙන්දෙකු අසුන් හික්ම වන්නාක් මෙන් පුද්ගලයා විසින් ආත්ම දමනයක් හා සංයමයක් ඇතිකරගත යුතු වේ. ආත්ම සංයමය යනු තිදොර සංවරකර ගැනීමයි. එය මැනවින් සංවර කරගත් තැනැත්තාට විමුක්තිය සාක්ෂාත් කිරීම පහසුවන අතරම දුගතියෙන් තොර සුගතිසංඛ්‍යාත භවයක ඉපිද සසර සැපවත් කරගැනීම ද කළ හැකි වේ.

අශ්ව වෙළෙන්දාගේ අරමුණ වන්නේ තම අසුන්ට වැඩි වටිනාකමක්, මිලක් ලබාගැනීම ය. එබැවින් ඔහු විසින් ඉතා මැනවින් අසුන් පුහුණුකරනු ලැබේ. මැනවින් පුහුණු කළ අසුන්ට ඉහළ ඉල්ලුමක් පවතින අතර, එයින් වෙළෙන්දාට විශාල ලාභයක් ලැබේ. එසේම තිදොර සංවර කරගත් පුද්ගලයාට සමාජමය වශයෙන් ප්‍රතිලාභ රැසක් ලැබිය හැකිවේ.

එපමණක් නොව තිදොරින් සිදුවන අකුසල සහගත ක්‍රියා හේතුවෙන් නිපැයෙන කර්ම ශක්තිය බිඳ දැමූ හෙයින් නිසැකව ම දුගති භවයක උපත සිදු නොවේ. එය එම තැනැත්තාට සංසාරික වශයෙන් ලැබෙන මහත් ප්‍රතිලාභයකි. මේ වනාහි තමාම තමාට පිහිටකොට වාසය කිරීම වේ.

විමුක්තිය හා සසර පැවැත්ම සම්බන්ධයෙන් තමාට තමා පිහිට යැයි දක්වූව ද ව්‍යවහාරික ජීවිතයේ ඇතිකරගන්නා සමාජ සම්බන්ධතා මගින් පිහිටක් නැතැයි යන අදහසක් ඉහත බුදු වදනින් කිසිසේත් ම ගම්‍ය නොවේ. සමාජ ජීවිතය තුළ එකිනෙකාට පිහිටක් වෙමින් වාසය කිරීම යනු අන්‍යයන්ගේ දුක් සැප දෙකෙහි නොවෙනස් ව, එක්ව වාසය කිරීම ය. එය උසස් මිත්‍ර දහමක් වන අතර සත්පුරුෂ ගුණයක් වේ. මෙම පිළිවෙත ගිහි පැවිදි දෙපක්ෂයටම පොදුවේ.



කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රාජකීය පණ්ඩිත ආචාර්ය


**උඩුහාවර ආනන්ද හිමි**

පළමුව උපකාර කිරීමත්, කළ උපකාරවලට ප්‍රත්‍යුපකාර කිරීමත්, දුර්ලභ සාධු ගුණයක් ලෙස දහමින් අවධාරණයකර තිබේ (පුබ්බකාරී කතඤ්ඤූ කතවේදි). සිගාලෝවාද සූත්‍රයෙහි සමාජ ආයතන හයක් යටතේ දැක්වෙන්නේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් ඔවුනොවුන් පිහිටකොට වාසය කිරීමේ පිළිවෙතයි. නිවන් දුටු වීතරාගී උතුමෝ ද ඔවුනොවුන් හා පිහිටකොට වාසය කළ බව පිටකාගත තොරතුරු මගින් සනාථ වේ.

ඇඩි ලෙස ගිලන් වූ තිස්ස තෙරුන්ට බුදුරජාණන් වහන්සේ සියතින් ම උපස්ථාන කළහ. අග්‍රෝපස්ථායක ආනන්ද තෙරණුවෝ තථාගතයන් වහන්සේට පරිනිර්වාණය තෙක්ම අපරිමිත දයාවෙන් හා කරුණාවෙන් උපස්ථාන කළහ. මේ නිදසුන් මගින් පැහැදිලි වන්නේ ව්‍යවහාරික ජීවිතයේ එකිනෙකාට පිහිට වෙමින් වාසය කිරීමේ උදාර ගුණයයි.

බුද්ධිමත් කෙනෙකුට එම ව්‍යවහාරික සම්බන්ධතා තමාගේ ආධ්‍යාත්මික ජීවිතයට ද පිහිටක් කරගත හැකි ය. උදාර මිනිසුන්ගේ ඇසුර තම අධ්‍යාත්මික කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාවක් කරගත හැකි ය. මව්පියන්ට, ගුරුවරුන්ට, ගිලනුන්ට හා ආධ්‍යාත්මික ජීවිතයට කැපවූ උතුමන්ට උවටැන් කිරීම පුණ්‍ය කර්මයකි. එය තමාගේ පරලොව ජීවිතයට ද පිහිට කරගත හැකි ය.

එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන්ට උපකාර කිරීමට අවස්ථාව උදාවේ. එවැනි අවස්ථාවල තමාට හැකි පමණින් උපකාර කිරීම ආධ්‍යාත්මික සතුට වර්ධනය කරගැනීමට උපකාරී වේ. මේ සියල්ල නිරපේක්ෂව පෙරලා කිසිවක් අපේක්ෂා නොකොට කළ හැකි නම් එහි අගය තවත් වැඩිවේ. මේ සියල්ල මෙසේ කළ ද විමුක්තිය හා සංසාරික පැවැත්ම සම්බන්ධයෙන් තමාට පිහිට තමා ම ය යන්න වටහාගත යුතුවන අතර, ඒ සඳහා ඉවහල්වන ආත්ම දමනය හා ශික්ක්ෂණය ඇතිකර ගැනීම අවශ්‍ය වේ. බුදුරදුන් වාදාළ පරිදි ධර්මය මග පෙන්වන මාර්ගෝපදේශකයා වන අතර මාර්ගයේ ගමන් කිරීම ශ්‍රාවකයාගේ වගකීම හා යුතුකම වේ.




බුදුසරණ

THE BUDDHIST TV

# පාලි පාඩම

38 – කොටස



සැකසුම
කොටනෙලුවේ
පුඤ්ඤකිත්තානන්ද හිමි

## සාමණේර පඤ්හකදා

01. එක – එක
02. ද්වෙ – දෙක
03. තීණි – තුන
04. චත්තාරි – හතර
05. පඤ්ච – පහ
06. ඡ – හය
07. සත්ත – හත
08. අට්ඨ – අට
09. නව – නවය
10. දස – දහය
11. සබ්බෙ සත්තා – සියලු සත්ත්වයෝ
12. කිං – කුමක්ද?
13. වෙදනා – වේදනාව
14. අරියසච්චානි – ආර්ය සත්‍යය
15. පඤ්චුපාදානක්ඛන්ධා – පඤ්ච උපාදානස්කන්ධය
16. අජ්ඣත්තිකානි – ආධ්‍යාත්මික
17. බොජ්ඣඞ්ගා – බෝධිඅංග
18. අරියො අට්ඨඞ්ගිකො මග්ගො – අරි අටඟි මග
19. සත්තාවාසා – සත්තවාස
20. ආහාරට්ඨිතිකා – ආහාරයෙන් ජීවත් වෙයි.
21. දසහඞ්ගෙහි සමන්නාගතො – අංග දහයකින් සමන්විත

### සාමණේර පඤ්හකදා

එක නාම කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා
ද්වෙ නාම කිං? නාමඤ්ච රූපඤ්ච
තීණි නාම කිං ? තිස්සො වෙදනා
චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි
පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා
ඡ නාම කිං ? ඡ අජ්ඣත්තිකානි ආයතනානි
සත්ත නාම කිං ? සත්ත බොජ්ඣඞ්ගා
අට්ඨ නාම කිං ? අරියො අට්ඨඞ්ගිකො මග්ගො
නව නාම කිං ? නව සත්තාවාසා
දස නාම කිං ? දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චතීති

මෙම පාඩම මෙම සතියේ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 8.45ට බෞද්ධයා රූපවාහිනියෙන් ද (The BuddhistTV) සඳුදා සවස 3.30ට බෞද්ධයා ගුවන් විදුලියෙන් ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. Magadhi (මාගධී) හෝ Kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.

බුදු සරණ



# මඩුකන්ද ශ්‍රී දළදා රාජ මහා විහාරය



මුවඇටගම ශ්‍රී රතනසාර නා හිමි

**ඈත ඝන වනාන්තරයට මැදිව ගව් ගණනක් ඈතට විහිදී ගිය, අහස් කුස සිඹිනා මහා පර්වතයක් ය. පුළුන් රොදක් සේ එය වසා ඇති වළාකුළු එහි උස සඟවා ඇතැයි බැලූ බැල්මට පෙනෙන්නේ ය.**

මැත, වසර ගණනාවක සලකුණු ඇතිව ඉහළට එසැවුණු බෝධි රාජයාණන් වහන්සේ ය.අඩි ගණනක විශ්කම්භයක් ඇති එහි, වයස සඟවා ඇත්තේ පිහිට ඉල්ලමින් මිනිසුන් විසින් භාර භාර පිණිස එල්ලන ලද ධජ වලින් යැයි සිතෙන්නේ ය. බෝධීන් වහන්සේ ඉදිරියෙහි ඉතිහාසය සාක්ෂි දරණ වන්දනීය පූජනීය වූ දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටි දළදා මාළිගයේ නටඹුන් ය. මාළිගය අසල සමාධි සුවයෙන්, ලොව්තුරු බුදු පියාණන් වහන්සේ ගේ පිළිම වහන්සේ වැඩ සිටිති.

දළදා මාළිගය දෙසට අනිමිස ලෝචන පූජාවෙන් වැඩ සිටිනා හිඳි පිළිමය ,දකින බොහෝ දෙනෙකුට ඇතිවන ශාන්තිය වචන වලට පෙරළිය නොහැකි ය. මෙහි කාලයේ වැලිතලාවට හසු නොවී තවමත් විරාජමාන ව ඇති ඓතිහාසික නෂ්ඨාව ශේෂයන් ඉතිහාසයේ සාක්ෂි කරුවන් බවට පත්ව ඇත.

වව්නියාව නගරයේ සිට හොරොව්පතාන මාර්ගයේ කිලෝ මීටර තුන හමාරක් පමණ ගිය පසු මාර්ගය ආසන්නයේ ම දක්නට ඇති මඩුකන්ද ශ්‍රී දළදා රාජ මහා විහාර පිත් බිමේ උරුමයි මේ. භූමි අක්කර විස්සක් පමණ පුරා විහිදෙන මෙම පිත්බිමෙහි හාත්පස, පරිවාර පන්සල් ගෙවල් පැවැති බවට නටඹුන් තවමත් දක්නට හැකි ය.

මෙරට බොදු උරුමයේ සමාරම්භයට පාදක වූ සියලු සටහන් ආරම්භ වූ උතුරු පළාතේ පිහිටි මෙම ඓතිහාසික පින් බිම හා බැඳි විවිධ පුරාණෝක්තීන් හා ජනප්‍රවාදයන් රැසක් අපට හමුවෙයි.

ලාංකීය බොදු පුනර්ජීවයට මූලික අඩිතාලම දැමූ දෙවන පෑතිස් රජ දවස, වැඩම කළ වදාළ උතුම් ජය ශ්‍රී විජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ, දඹකොල පටුනෙන් ගොඩබැස තංතිරිමලය හරහා අනුරාධපුරයට වැඩම කළේ ද උතුරුකරයෙනි.

හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් උතුම් දන්ත ධාතූන් වහන්සේ රැගෙන කෝකිලායි කලපුවෙන් බැස ලංකා පට්ඨන තොටුපළෙන් මෙරටට පැමිණි බව ඉතිහාසයේ සඳහන් කරුණක් වෙයි. කෝකිලායි යන්න වත්මනෙහි මුලතිව් දිස්ත්‍රික්කය ලෙස හැඳින්වුවද මුලතිව් යන්න අග නම බව ද අතීතයේ එය මූලමණ්ඩප ලෙස හඳුන්වා තිබේ. මුලින්ම මණ්ඩපයක් ඉදිකොට දළදා වහන්සේ තැන්පත් කළ නිසා මූලමණ්ඩප වූ බවත් එය පසුකාලීනව මුල් ලද්දුව, මුලතිව් බවට පත් වූ බවත් මඩුකන්ද ශ්‍රී දළදා රාජමහා විහාරාධිපති මුවඇටගම ශ්‍රී රතනසාර නායක හිමිපාණෝ පැවසූ හ.

දළදා වහන්සේ කෝකිලායි සිට ,රුවන් මඩුව, සේම මඩුව,මහ මඩුව ,මඩු කන්ද,කිඩාගලේගම, සංගිලිකනදරාව,උත්තර සාලීය විහාරයේ සිට අනුරාධපුරය දක්වා වැඩම කොට තිබෙනව බව සඳහන් කරුණකි.

එකී ගමන් මගේ දළදා වහන්සේ තැන්පත් කොට වන්දනීය වූ පින් බිමක් ලෙස මඩුකන්ද ශ්‍රී දළදා රාජමහා විහාර පින් බිම අදටත් පූජනීය පින් බිමක් ලෙස සඳහන් කළ හැකිය. මෙමම විහාරය

සතර දෙසින් වට වූ පොකුණු සතරකින් යුක්ත වූ අතර, එහි අලංකාරය සදහා නෙළුම්, මානෙල්, ඕලු මල් වලින් පිරී තිබුණ බවද සඳහනක් වෙයි. ක්‍රි.ව 200දී පමණ ආරම්භ කර ඇති මඩුකන්ද විහාරය ක්‍රි.ව 500දී දළ දාව වැඩම කිරීමෙන් කීර්ති ශ්‍රී මේඝ වර්ණ රජු දළදා වහන්සේ පිළිගෙන භාරගන්නා තුරු මෙහි තැන්පත් කොට තිබූ බවට ශේෂව ඇති මාළිගයේ නටඹුන් සාක්ෂි සපයයි. මහල් දෙකකින් සමන්විත දළදා මාළිගයෙහි ඉහළ මහලයේ දළදා වහන්සේ තැන්පත් කොට වැඳුම් පිදුම් කොට තිබේ.

දළදා වහන්සේ භාරව කටයුතු කළ ප්‍රධානියා රටේ භාරකරුවා ලෙස සැලකූ අතර රජුගේ මාළිගය ආසන්නයේ දළ දා මාළිගාවක් ඉදිකොට ධාතූන් වහන්සේ තැන්පත් කරමින් පුද පූජා පවත්වා තිබේ. මඩුකන්ද විහාරස්ථානයේ දළදා මාළිගාව ආසන්නයේම ඉදිකොට ඇති මාළිගයේ ඇතුළත වාතාශ්‍රය වගේම සිසිල පවත්වා ගැනීම සදහා යොදාගෙන ඇති තාක්ෂණය අපූරුය.

වසරේ ජූලි ,අගෝස්තු සැප්තැම්බර් මාසවල දී බලපාන දැඩි වියළි කාලගුණ තත්වයන් සදහා මුහුණ දීමට එකල ද භාවිත කොට ඇති තාක්ෂණික ක්‍රමවේදයන් හී නටඹුන් අදට ද දැකගත හැකිය.වර්තාමනයෙහි වායු සමීකරණ ක්‍රියාවලිය හා සමාන තාක්ෂණික ක්‍රමවේදයක් සඳහා කළුගල් පේළි දෙකක් අතරට ජලය ඇතුළත් කොට වසර පුරාම සිසිලස පවත්වා ගන්නට එකල ඇත්තෝ සමත්ව ඇත.

මඩුකන්ද පිළිබඳ මහාවංසය සඳහන් කරන කරුණු පිළිබද අවධානය යොමු කිරීම මෙහිදී ඉතා වැදගත් බව සදහන් කළ යුතුය. මණ්ඩල ගිරි,මඩුළුගිර වී පසු කාලීනව මඩුකන්දවූ බව මහාවංශය සදහන් කරන එක සාධකයකි.මණ්ඩලාකාර කඳුවැටිය වළාකුළක් සේ දිස්වූ නිසා එය මණ්ඩලගිරිය ලෙස හැඳින්වූ බවද සඳහනක් එහි තවත් තැනක වෙයි.එමෙන්ම මඩු ගස් වලින් ගහනව පැවැති නිසා මඩුකන්දවූ බවද ජනප්‍රවාදයේ කියැවෙන තවත් කතාවකි.





විහාර භූමියට පැමිණෙන ඔබට ඒ වටා ඇති මඩු ගස් ද තැනින් තැන තවමත් දැක ගත හැකි ය. මඩුකන්ද විහාරය පිළිබද සදහන් කිරීමේදී මහාවංශය සඳහන් කරන තවත් සාධක කිහිපයක් වෙයි. දළදා වහන්සේ වැඩ ම කළ ගමන් මගේ ,සේම මඩුව පිළිබද සඳහන් වන්නේ රිදියෙන් නිමවූ මණ්ඩපයක් තිබූ බැවින් සේම මඩුව වූ බවයි. රනින් නිම කළ මඩුවක් පැවැති බැවින් රුවන් මඩුව වූ බව ද, විශාල මණ්ඩපයක් ඉදිවූ බැවින් මහාමඩුව වූ බවද, මඩු විශාල ප්‍රමාණයක් ඉදිකළ බැවින් මඩුකන්දවූ බව ද මහාවංශය ගෙනහැර දක්වයි.

ක්‍රි.ව 200දී පමණ මඩුකන්ද විහාරය ඉදිවෙන අතරෙහි උතුරු කරයෙහි සිංහල ජන වාස පැවැති බවට සාධක රැසක් වත්මනෙහි මඩුකන්ද විහාරාධිපති මුවඇටගම රතනසාර හිමියෝ පෙන්වා දෙති. ඒ වන විට දියුණු සමාජ රටාවක් පැවැති නිසා දළදා වහන්සේ මඩුකන්ද විහාර පින් බිමේ තැන් පත් කරන්නට සැලැසුම් කරන්නට ඇති බව ද උන්වහන්සේ පෙන්වා දෙයි. උතුරු කරයේ පැරැණි රාජධානිවලට අයත් රජ වරුන් විසින් ඉදිකරවූ සිද්ධස්ථාන 274 ක් පැවැති බවට සාධක රැසක් ඇති අතර ඉන් හතරක් පසු කාලීනව කෝවිල් බවට පත්ව තිබේ.

අදටත් ස්වාමීන්වහන්සේලා වැඩ වාසය කරමින් යාවත් කාලීන වන විහාර පින් බිම් ඇත්තේ විසි අටක් පමණ යැයි උන් වහන්සේ පෙන්වා දෙති. ඉතිරි සියල්ල වනාන්තර ගතව ඇති බවත්, රුදුරු ත්‍රස්තවාදීන්ගේ ගොදුරු බවට පත්ව තිබූ බවත් සඳහන් කරති. ඒ සිද්ධස්ථාන අතරින් වටිනාම සිද්ධස්ථානයක් ලෙස මඩුකන්ද ශ්‍රී රාජමහා විහාර හැඳින්වෙන අතර මඩුකන්ද රාජා මහා විහාරයට ද ත්‍රස්තවාදීන්ගෙන් කිහිප විටෙකම ප්‍රහාර එල්ල වුව ද අදටත් මේ උරුමය රකිමින් උන්වහන්සේ දිවි හිමියෙන් මේ පින්බිම ආරක්ෂා කොට ඇත්තේ බොදුනු උරුමය මතු පරපුරට උරුම කරදීමේ උදාර අරමුණෙන් ය.

**වසන්ත ජයසිංහ ආරච්චි**

වර්ෂ 2020ක් වූ ජූලි 27 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.